# චෙගර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ උපායමාර්ග පිළිබඳ අත්පොත

## දේශීය සහ පාරජාතික ක්‍රමෝපායන්හි වර්ගීකරණයක්

INTERNATIONAL REPUBLICAN INSTITUTE
IRI
Advancing Democracy Worldwide

වෛරර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ උපායමාර්ග පිළිබඳ අත්පොත: දේශීය සහ පාරජාතික ක්‍රමෝපායන්හි වර්ගීකරණයක්.

ස්තුතිය: වෛරර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ උපායමාර්ග පිළිබඳ අත්පොත International Republican Institute (IRI) සහ Hudson Institute හි විශේෂඥයින් කණ්ඩායමක් විසින් සකස් කරන ලදී. Eguiar Lizundia ගේ සංස්කාරකත්වය යටතේ Nate Sibley, Gia Rowley, Utpal Misra සහ Anna Downs යන අය ඊට ඇතුළත් විය. Corina Rebegea, Eric Hontz සහ Kenneth Barden වැදගත් ප්‍රතිපෝෂණ සහ විචාරාත්මක අදහස් ලබා දුන්හ. මෙම මූලපිරීම සඳහා වටිනා දැනුම් ලබා දුන් IRI ආයතනයේ බහුවිධ සහකරුවන් සහ එයට සහාය ලබාදුන් National Endowment for Democracy හට අපගේ කෘතඥතාව පළ කර සිටිමු.

ප්‍රකාශන හිමිකම © 2021 IRI. සියලු හිමිකම් ඇවිරිණි.

අවසර ප්‍රකාශය: IRI ආයතනයේ ලිඛිත අවසරයකින් තොරව ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම ඇතුළු කිසිදු විද්‍යුත් හෝ යාන්ත්‍රික ආකාරයකින් හෝ තොරතුරු ගබඩා කිරීමේ සහ නැවත ලබා ගැනීමේ කිසිදු පද්ධතියක් භාවිතයෙන් මෙම කෘතියේ කිසිදු කොටසක් කිසිදු අයුරකින් ප්‍රතිනිෂ්පාදනය කළ නොහැකි ය.

අවසර සඳහා වන ඉල්ලීම්වලට පහත සඳහන් තොරතුරු ඇතුළත් විය යුතු ය:

පිටපත් කිරීම සඳහා අවසරය අවශ්‍ය වන ලේඛනයේ මාතෘකාව.

පිටපත් කිරීම සඳහා අවසරය අවශ්‍ය වන ද්‍රව්‍ය පිළිබඳව විස්තරයක්.

පිටපත් කරන ලද ද්‍රව්‍ය භාවිතා කරනු ලබන අරමුණ සහ එය භාවිතා කරනු ලබන ආකාරය.

ඔබේ නම, පදවි නාමය, සමාගමේ හෝ සංවිධානයේ නම, දුරකථන අංකය, ෆැක්ස් අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය සහ තැපැල් ලිපිනය.

කරුණාකර අවසරය සඳහා වූ සියළු ඉල්ලීම් පහත ලිපිනයට එවන්න:

අවධානයට: විදේශ කටයුතු දෙපාර්තමේන්තුව
IRI
1225 Eye Street NW, Suite 800
වොෂින්ටන්, ඩී සී 20005
info@iri.org

National Endowment for Democracy (NED) විසින් ලබා දුන් සහයෝගය නිසාවෙන් මෙම ප්‍රකාශනය එළි දැක්වීමට හැකි විය. මෙහි ප්‍රකාශිත අදහස් කතුවරුන්ගේ අදහස් වන අතර ඒවා අනිවාර්යයෙන්ම NED හි අදහස් පිළිබිඹු නොකරයි.

# පටුන


**කෙටි යෙදුම් ලැයිස්තුව** v

**විධායක සාරාංශය** 1

**හැඳින්වීම** 2

**චෞර පාලන තන්ත්‍රය යනු කුමක්ද?** 3
ගෝලීය චෞර පාලන තන්ත්‍රයේ නැගීම 4
චෞර පාලන තන්ත්‍රය මැනීම 5
චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් දූෂණ ක්‍රියාවන්හි යෙදෙන්නේ ඇයි? 6
චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් ඉලක්ක කරන්නේ මොනවාද? 7

**නව රාමුවක්** 8

**දේශයකට සීමා වූ චෞර පාලන ත්‍රාන්ත්‍රික ක්‍රමෝපායන්** 9

**දේශපාලනික සහ නෛතික ක්‍රමෝපායන්** 10
ජාතික රාජ්‍ය නිලධාරීන්ට සහ පෞද්ගලික ක්‍රියාකාරීන්ට අල්ලස් ලබා දීම හරහා අනුග්‍රාහක ජාලයන් පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම 10
ප්‍රධාන ආයතන සිය සහයෝගයට යොදාගැනීම 11
කාර්යයන් අයථා ලෙස භාවිතා කිරීම 11
මුදල් හෝ වෙනත් උපකාරවලට ප්‍රතිඋපකාර වශයෙන් සිය බලපෑම් යෙදවීම 12

**ආර්ථික සහ මූල්‍ය ක්‍රමෝපායන්** 12
රාජ්‍ය නිලධාරියෙකු විසින් දේපළ වංචා කිරීම, අයථා ලෙස පරිහරණය කිරීම හෝ වෙනත් අතකට හැරවීම 12
තනතුරු මිලදී ගැනීම 12

**බලහත්කාරය සහ ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ ක්‍රමෝපායන්** 13
සුපරීක්ෂාව මර්දනය කිරීම සහ විරුද්ධ මතවාද නිහඬ කිරීම 13
සංවිධානාත්මක අපරාධ 15
යුක්තියට බාධා කිරීම 16
බලෙන් ලබා ගැනීම 16
දූෂණය වටා සමාජ සම්මතයන් බලාත්මක කිරීම 16

**සන්නාමකරණය සහ ආඛ්‍යානය පදනම් කරගත් ක්‍රමෝපායන්** 17
ප්‍රතිරූප කළමනාකරණය 17

**වෛෂර පාලන තන්ත්‍රය සඳහා දේශීය ප්‍රතිචාර** **17**
**ක්‍රමානුබද්ධ දූෂණ අවදානම් පිළිබඳ අවධානය** **17**
**දූෂණයට සහ වෙනත් නීතිවිරෝධී මුදල්වලට එරෙහි සටනට ප්‍රමුඛත්වය දීම** **18**
වත්කම් අහිමි කිරීම සහ යළි ලබා ගැනීම 19
මුදල් විශුද්ධිකරණ විරෝධී පද්ධති ශක්තිමත් කිරීම 19
සමාගම්, නිශ්චල දේපළ සහ අනෙකුත් මුදල් විශුද්ධිකරණ වාහකයන්හි හිමිකාරිත්වයේ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම 20
විදේශ බලපෑම්වල මූල්‍ය අවදානම් සීමා කිරීම 22
**රජය තුළ සහ ඉන් පිටත දූෂණ විරෝධී ක්‍රියාකරුවන් සවිබල ගැන්වීම** **23**
නීතිය බලාත්මක කිරීම නවීකරණය කිරීම 23
විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම 24
තොරතුරු හෙළිකරන්නන් ආරක්ෂා කිරීම සහ දිරිගැන්වීම 24
වෛෂර පාලන තන්ත්‍රයට එරෙහි ස්වාධීන මාධ්‍ය සහ සිවිල් සමාජ ජාලවලට සහාය වීම 25
**වීසා සම්බන්ධයෙන් පවතින නීතියෙන් ගැලවීමේ මාර්ග මැඩලීම** **26**
**පාරජාතික වෛෂර පාලන තන්ත්‍ර ක්‍රමෝපායන්** **27**
**දේශපාලනික හා නීතිමය ක්‍රමෝපායන්** **27**
උපායමාර්ගික දූෂණය 27
සතුරන්ට එරෙහිව නීතිය භාවිතා කිරීම 28
**ආර්ථික හා මූල්‍ය ක්‍රමෝපායන්** **29**
වංචනික ජාත්‍යන්තර ප්‍රසම්පාදන හරහා විදේශීය රාජ්‍ය නිලධාරීන්ට සහ ජාත්‍යන්තර සංවිධානවල නිලධාරීන්ට අල්ලස් දීම 29
අපරාධවලින් උපයාගත් මුදල් විශුද්ධිකරණය කිරීම සහ සැඟවීම 29
ආර්ථිකය ග්‍රහණය කර ගැනීම 31
**බලහත්කාරය හා ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ ක්‍රමෝපායන්** **32**
පාරජාතික මර්දන ව්‍යාපාර 32
**සන්නාමකරණය සහ ආඛ්‍යාන පදනම් කරගත් ක්‍රමෝපායන්** **32**
කීර්තිනාම විශුද්ධිකරණය 32
සංවර්ධන ආඛ්‍යාන 33
**වෛෂර පාලන තන්ත්‍රය කෙරෙහි පාරජාතික වශයෙන් දක්වනු ලබන ප්‍රතිචාර** **34**
**විදෙස් අල්ලස් ගැනීම් හා අල්ලස් සඳහා පෙළඹවීම සාපරාධී ක්‍රියාවක් ලෙස නම් කිරීම** **34**
**දූෂිත ක්‍රියාකරුවන්ට සම්බාධක පැනවීම** **34**
**අධිකාරවාදී වෛෂර පාලන තන්ත්‍රයට එරෙහි ප්‍රජාතාන්ත්‍රික එකමුතුබව** **35**
**ජාලයක් පරාජය කිරීමට ජාලයක් ගොඩනැගීම** **36**
**මාර්ගස්ථ සහ ගමනාන්ත රටවල භූමිකාව සාකච්ඡාවට ගැනීම** **37**
**නිර්දේශ** **39**

# කෙටි යෙදුම් ලැයිස්තුව

**ATI** Access to Information - තොරතුරු වෙත ප්‍රවේශය

**CCP** Chinese Communist Party - චීන කොමියුනිස්ට් පක්ෂය

**CPI** Corruption Perceptions Index - දූෂණ සංජානන දර්ශකය

**CRS** Common Reporting Standards - පොදු වාර්තාකරණ ප්‍රමිති

**CTA** Corporate Transparency Act - ආයතනික විනිවිදභාවය පිළිබඳ පනත

**GDP** Gross Domestic Product - දළ දේශීය නිෂ්පාදිතය

**EITI** Extractive Industries Transparency Initiative - නිස්සාරණ කර්මාන්තවල විනිවිදභාවය පිළිබඳ මුලපිරීම

**FATCA** Foreign Account Tax Compliance Act - විදේශ ගිණුම් බදු අනුකූලතා පනත

**FATF** Financial Action Task Force - මූල්‍ය කටයුතු කාර්ය සාධක බලකාය

**FinCEN** Financial Crimes Enforcement Network - මූල්‍ය අපරාධ බලාත්මක කිරීමේ ජාලය

**FSI** Financial Secrecy Index - මූල්‍ය රහස්‍යතා දර්ශකය

**GFI** Global Financial Integrity - ගෝලීය මූල්‍ය ඒකීයත්වය

**ICAR** International Centre for Asset Recovery - වත්කම් යළි අයකර ගැනීම සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය

**ICIJ** International Consortium of Investigative Journalists - විමර්ශනාත්මක මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර එකමුතුව

**IRI** ජාත්‍යන්තර රිපබ්ලිකන් ආයතනය - IRI

**IVTS** Informal Value Transfer Systems - අවිධිමත් අගය හුවමාරු කිරීමේ පද්ධති

**KARI** The Kleptocracy Asset Recovery Initiative – චෞර පාලන තන්ත්‍රයේ වත්කම් අයකරගැනීමේ මුලපිරීම

**NED** National Endowment for Democracy - ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික අනුරක්ෂණය

**OECD** Organisation for Economic Co-operation and Development - ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වන සංවිධානය

**OPA** Open Central Africa - විවෘත මධ්‍යම අප්‍රිකාව

**PEP** Politically Exposed Person - දේශපාලනිකව නිරාවරණය වූ පුද්ගලයා

**PRC** The People's Republic of China - මහජන චීන සමූහාණ්ඩුව

**PSC** Persons of Significant Control - සැලකිය යුතු පාලනයක් ඇති පුද්ගලයින්

**PWYP** Publish What You Pay - ගෙවන දේ ප්‍රකාශයට පත් කිරීම

**REML** Real-Estate Money Laundering - දේපළ මුදල් විශුද්ධිකරණය

**SLAPP** Strategic Lawsuits Against Public Participation - මහජන සහභාගීත්වයට එරෙහි උපායමාර්ගික නඩු

**SOE** State-Owned Enterprise - රාජ්‍ය ව්‍යාපාරය

**STAR** Stolen Asset Recovery - සොරකම් කළ වත්කම් යළි අයකර ගැනීම

**TBML** Trade-Based Money Laundering - වෙළඳාම මත පදනම් වූ මුදල් විශුද්ධිකරණය

**TI** Transparency International - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය

**UNCAC** United Nations Convention against Corruption - දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය

**UNODC** United Nations Office on Drugs and Crime - මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය

**UNSC** United Nations Security Council - එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය

**UWO** Unexplained Wealth Order - පැහැදිලි කළ නොහැකි ධනය පිළිබඳ නියෝග

**1MDB** 1Malaysia Development Berhad - 1මැලේසියානු සංවර්ධන සමාගම

# විධායක සාරාංශය

රටවල් අතර මූල්‍ය, ආරක්ෂක සහ සංවර්ධන සහාය පෙරදැරි කරගත් මහා පරිමාණ ව්‍යාපාරයන් සීඝ්‍රයෙන් වඩ වඩාත් වර්ධනය වූ විට, වර්ෂ 1900 ගණන්වල මැද භාගය තුළදී පාරජාතික චෞර පාලන තන්ත්‍රය ගෝලීය සංසිද්ධියක් ලෙස ඉස්මතු විය. දේශසීමා හරහා රටවල් අතර සිදුවන මූල්‍ය හා ආර්ථික ප්‍රවාහයන් බහුල වීමත් සමඟ, දූෂණය සඳහා වන ගෝලීය අවස්ථා නව තාක්ෂණයන් මගින් පුළුල් වන විට චෞර පාලන තන්ත්‍රය වඩ වඩාත් ගෝලීය ස්වභාවයක් ගෙන තිබේ. චෞර පාලන තන්ත්‍රීය ක්‍රමෝපායන් - උපාය මාර්ග හා ඒකාබද්ධව - දූෂිත ප්‍රභූ පැළැන්තියට රාජ්‍ය මුදල්, පාරිභෝගික භාණ්ඩ, ස්වාභාවික සම්පත්, සංවර්ධන හා ආරක්ෂක සහාය, පුද්ගලික අංශය සහ උපායමාර්ගික වත්කම් ඉලක්ක කර සිය ග්‍රහණයට නතු කර ගැනීමට හැකියාව ලබා දේ. එසේ කිරීමෙන් චෞර පාලකයන් උත්සාහ කරන්නේ පුද්ගලික වාසි තකා විශාල ධනයක් රැස් කර ගැනීමටත් තම රට තුළ හා ඇතැම් විට ඔවුන් සිය බලපෑම් පැවැත්වීමට අපේක්ෂා කරන විදේශ රටවල තම දේශපාලන බලය තහවුරු කර, ස්ථාපිත කරගැනීමටත් වේ.

අද දක්වාම, මහජන සම්පත් සොරකම් කිරීමේ අවස්ථාවන් උපායමාර්ගිකව පුළුල් කිරීම සඳහා සහ චෞර පාලන තන්ත්‍රය හෙළිදරව් කොට ඒවාට එරෙහිව සටන් කිරීමට සිවිල් සමාජය දරන උත්සාහයන් මැඩපැවැත්වීම සඳහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් විසින් යොදා ගනු ලබන පාරජාතික හා දේශීය ක්‍රමෝපායන් සමූහය කිසිදු තනි උපක්‍රමයක් මගින් ක්‍රමානුකූලව නාමාවලිගත කර නොමැත. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ ක්‍රමෝපායන් පිළිබඳ සාක්ෂි පදනම් කරගත් අවබෝධයකින් තොරව, ප්‍රතිසංස්කරණයට නැඹුරු වූ ක්‍රියාකාරීන් හට මහා පරිමාණ චෞර පාලන ත්‍රාන්ත්‍රික උපායමාර්ග පූර්වාපේක්ෂා කිරීමට, ඒවා හඳුනා ගැනීමට හා ඒවාට මුහුණ දීමට නොහැකි වන අතර මාධ්‍යවේදීන්ට හා ක්‍රියාකාරිකයන්ට සිදු වනුයේ ඒවා විමර්ශනය කිරීමේ හා අධීක්ෂණය කිරීමේ සිය ප්‍රයත්නයන් අඛණ්ඩව කඩාකප්පල් කර දැමීම්වලට මුහුණදීමටය. මෙම අඩුපාඩුව පිරවීම සඳහා (IRI) විසින් *චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ උපායමාර්ග පිළිබඳ අත්පොත* සකස් කර ඇත. මෙම උපායමාර්ග පිළිබඳ අත්පොත යනු ධනය රැස් කිරීම සහ වගවීම පැහැර හැරීම සඳහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් භාවිතා කරන ක්‍රමෝපායන්වල සමස්ත පරාසය විස්තර කරන විස්තීර්ණ කෝෂ්ඨාගාරයක් වන අතර පාරජාතික චෞර පාලන ත්‍රාන්ත්‍රික ක්‍රමෝපායන් පිළිබඳ වූ පර්යේෂණ මත පදනම්ව චෞර පාලන තන්ත්‍රය පිළිබඳ නැවුම් අර්ථ දැක්වීමක් එමගින් ඉදිරිපත් කෙරේ.

මෙම උපායමාර්ග පිළිබඳ අත්පොත මගින් (1) දේශපාලනය හා නීතිය මත පදනම් වූ, (2) ආර්ථිකය හා මූල්‍ය මත පදනම් වූ, (3) බලහත්කාරය සහ ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ හෝ (4) සන්නාමකරණය සහ ආඛ්‍යානය මත පදනම් වූ වශයෙන් චෞර පාලන ත්‍රාන්ත්‍රික ක්‍රමෝපායන් ඒවායේ ස්වභාවය අනුව වර්ගීකරණය කෙරේ. මෙම ක්‍රමෝපායන්, රට තුළ අනුග්‍රාහක ජාල ගොඩනැගීම වැනි ආකාරයෙන් දේශීය රාජතන්ත්‍රයට පමණක් සීමා විය හැකි අතර, එසේ නැතහොත් විදේශීය දේශපාලන හා ව්‍යාපාරික ප්‍රභූන් සිය සහයෝගයට යොදා ගැනීම හෝ ඔවුන් විසින් සියුම්ව පරීක්ෂාවට ලක්වීම මැඩ පැවැත්වීම සඳහා නීති විරෝධී අරමුදල් සහ කප්පම් ගැනීම භාවිතා කිරීම වැනි ආකාරයේ පාරජාතික ස්වභාවයක් ගත හැකිය. මෙම උපායමාර්ග පිළිබඳ අත්පොත, ලෝකයේ සැබෑ උදාහරණ හරහා මෙම ක්‍රමෝපායන් ඒ ඒ සන්දර්භයන් තුළ අධ්‍යයනය කිරීම සඳහා සිද්ධි අධ්‍යයන භාවිතා කරන අතර ඒ, ප්‍රායෝගික දෑ න්‍යායික දෑ සමඟ සම්බන්ධ කරමින් සහ මෙම ක්‍රමෝපායන් චෞර පාලන ත්‍රාන්ත්‍රික උපාය මාර්ග සමඟ ඒකාබද්ධ වන ආකාරය නිරූපණය කරමිනි.

කිසියම් දේශයකට සීමා වූ සන්දර්භයන් තුළ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් භාවිතා කරන විවිධ ක්‍රමෝපායන් විස්තර කිරීමට අමතරව, මෙම උපායමාර්ග පිළිබඳ අත්පොත, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ට එරෙහිව භාවිතා කළ හැකිවන්නා වූ සහ මහා පරිමාණ දූෂණ හෙළිදරව් කිරීමට සහ එයට එරෙහිව සටන් කිරීමට උත්සාහ කරන සිවිල් සමාජය සහ අනෙකුත් ක්‍රියාකරුවන් අතර ප්‍රත්‍යස්ථිතිය ඇති කිරීමට භාවිතා කළ හැකි වන්නාවූ නෛතික, දේශපාලනික, මූල්‍ය හා සිවිල් සමාජය මත පදනම් වූ උපාය මාර්ග මතුකර දක්වයි. මෙම උපාය මාර්ග තුළට බහුපාර්ශ්වික සම්බන්ධීකරණය අවශ්‍ය වන ස්ථානගත ප්‍රතිචාර සහ විසඳුම් ඇතුළත් වන අතර එම උපායමාර්ග අතිරේක තත්‍ය-ලෝක සිද්ධි අධ්‍යයන භාවිතා කරමින් සන්දර්භගත කර ඇත. මෙම උපායමාර්ග පිළිබඳ අත්පොත මගින් මෙතෙක් පුළුල් ලෙස ව්‍යාප්ත නොවූ, එනමුත් චෞර පාලන තන්ත්‍රයට එරෙහිව සටන් කිරීම සඳහා ප්‍රබල මෙවලමක් බවට පත්වීමේ හැකියාව ඇති ප්‍රතිචාර ද යෝජනා කෙරේ.

*චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ උපායමාර්ග පිළිබඳ අත්පොත* මගින් චෞර පාලන තන්ත්‍රය අවබෝධ කර ගැනීම සඳහා විශ්ලේෂණාත්මක රාමුවකින්ද චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ට එරෙහිව රට තුළදී සහ විදේශයන්හිදී සටන් කිරීම සඳහා ප්‍රත්‍යක්ෂ ප්‍රවේශයන් කට්ටලයකින්ද සිවිල් සමාජ සංවිධාන, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ වෘත්තිකයින් සන්නද්ධ කිරීම අරමුණු කෙරේ. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් විසින් නිරන්තරයෙන්ම ඉලක්ක කෙරෙන කණ්ඩායම් තුළ ප්‍රත්‍යස්ථිතිය ගොඩ නැගීම සඳහා මෙම ලේඛනය සහ එහි ඇතුළත් සිද්ධි අධ්‍යයන භාවිතා කළ හැකිය.

# හැඳින්වීම

දශක ගණනාවක් තිස්සේ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් පාරජාතික දූෂණය සහ ගෝලීය චෞර පාලන තන්ත්‍රය මගින් ආරක්ෂාව, සමෘද්ධිය සහ ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව ඇති කෙරෙන තර්ජනය නොසලකා හැර ඇත. මෙම තර්ජන විසින් දුර්වල රාජ්‍යයන් අස්ථාවර කර, ත්‍රස්තවාදී කණ්ඩායම් හා සංවිධානාත්මක අපරාධ සඳහා සාරවත් අභිජනන භූමියක් නිර්මාණය කර, බිලියන ගණනක ජනතාවට ආරක්ෂිත හෝ සමෘද්ධිමත් අනාගතයක් සඳහා වන එකදු අපේක්ෂාවක් හෝ අහිමි කර ඇත. ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තුළ ද, විශේෂයෙන්ම පශ්චාත්-කොමියුනිස්ට්වාදී සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙතින් සිදුවන අයථා මූල්‍ය ප්‍රවාහයන් සඳහා වාහකයන් ලෙස බොහෝ විට ක්‍රියා කර ඇති ප්‍රධාන මූල්‍ය මධ්‍යස්ථාන තුළ ද පාරජාතික දූෂණයේ පීඩාකාරී බලපෑම් වැඩි වැඩියෙන් දැනෙන්නට පුළුවන.

චෞර පාලන තන්ත්‍රය යනු අධිකාරවාදී පාලන තන්ත්‍රවල ආර්ථික ජීවනාලිය වන අතර, ඒවායේ සාමාජිකයන් නිත්‍ය පිළිවෙතක් වශයෙන් සිය පුද්ගලික වාසිය හා අභිවෘද්ධිය තකා සහ තම අනුග්‍රාහක ජාලයන් හරහා දේශපාලන සහයෝගය පවත්වා ගැනීමේ අරමුණු සඳහා දූෂිත ක්‍රියාමාර්ගයන්හි නිරත වෙති. මෑත කාලයේ දී, චීනය හා රුසියාව වැනි බලගතු අධිකාරවාදී පාලන තන්ත්‍රයන් ද නිත්‍ය පිළිවෙතක් වශයෙන් විදේශ ප්‍රතිපත්ති මෙවලම් ලෙස අල්ලස් හා බලෙන් ලබාගැනීම් භාවිතා කරන බව වඩ වඩාත් පැහැදිලි වී ඇත.

කෙසේ වෙතත්, පාරජාතික දූෂණය මැඩලීම, චෞර පාලන තන්ත්‍රයට එරෙහිව සටන් කරන පුද්ගලයින්ට සහාය වීම සහ මෙම හදිසි අවදානම ප්‍රජාතන්ත්‍රවාදයේ සතුරන්ට එරෙහිව පීඩනය යෙදිය හැකි අන්දමේ වාසියක් බවට පරිවර්තනය කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්ට ගත හැකි නිශ්චිත, අත් කරගත හැකි සහ ක්ෂණික පියවර තිබේ.

රහසින් ක්‍රියාත්මක වන ගෝලීය චෞර පාලන තන්ත්‍ර ලෝකය මෑත වසරවලදී, එඩිතර විමර්ශනාත්මක වාර්තාකරණය, ප්‍රබල සිවිල් සමාජ ව්‍යාපාර සහ උන්නතිකාමී නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග මගින් මනාව හෙළිදරවු කර තිබේ. මෙම උත්සාහයන්ට ස්තූතිවන්ත වන්නට, මෙම තර්ජනය පැතිරී පවතින ස්වභාවය පිළිබඳ සහ අධිකාරවාදී පාලන තන්ත්‍රයන් හා ඔවුන්ගේ ප්‍රතියුක්තයින් විසින් නීති විරෝධී අන්දමින් පුද්ගලික අභිවෘද්ධිය අත්කරගැනීම, දේශීය අනුග්‍රාහක ජාලයන් ශක්තිමත් හා පුළුල් කිරීම හෝ ඔවුන්ගේ සීමාවෙන් ඔබ්බට දුෂ්ට බලපෑම් එල්ල කිරීම සඳහා නිරතුරුවම දූෂිත භාවිතයන්හි නිරත වන ක්‍රමවේදයන් පිළිබඳව පැහැදිලි අවබෝධයක් අප සතුව ඇත.

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් හමුවේ පවතින වහාම සැලකිල්ලට භාජනය කළ යුතු ප්‍රශ්නය වන්නේ, පාරජාතික දූෂණයේ පීඩාකාරී බලපෑම් වලින් තමන්ගේම ආයතන ආරක්ෂා කර ගැනීම, ලොව පුරා දූෂණ විරෝධී ප්‍රයත්නයන්හි නියැලී සිටින්නන්ට සහාය වීම සහ අවසානයේ අධිකාරවාදී පාලන තන්ත්‍රයන් පවත්වා ගෙන යන හා ඔවුන් සවිබල ගන්වන දූෂණය සෘජුවම ඉලක්ක කර ගනිමින් ඒවා ඔවුන්ටම එරෙහිව ආපසු හැරවීම සඳහා කුමක් කළ හැකිද යන්නයි.

IRI විසින් මෑත කාලීනව නිකුත් කරන ලද *ප්‍රජා ක්‍රියාකාරීන් සඳහා වූ දූෂණ-විරෝධී මෙවලම් කට්ටලය මගින්* ඵලදායී ප්‍රතිසංස්කරණයක් වෙත තල්ලු කිරීම සඳහා පර්යේෂණ, උපදේශන සහ මාධ්‍ය වෙතින් උපරිම ප්‍රයෝජන ලබාගැනීම පිළිබඳ සැලැස්මක් සැපයේ. IRI ආයතනයේ *චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ උපායමාර්ග පිළිබඳ අත්පොත* චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් විසින් භාවිතා කරනු ලබන ක්‍රමෝපායන්වල සම්පූර්ණ පරාසය නාමාවලිගත කරමින් සහ දූෂණයට එරෙහිව සටන් කිරීම මගින් ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සඳහා කරන සටනේදී ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් ප්‍රමුඛතාවය දිය යුතු ලොව පුරා ස්ථාපිත වී ඇති හා නැගී එන හොඳම භාවිතයන් ඉස්මතු කර දක්වමින් එම කාර්යය මත පදනම්ව ගොඩ නැගී තිබේ.

ධනවත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල තීරණ ගන්නා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සිට දුර්වල පාලනය සහ නීතියේ ආධිපත්‍යයේ දුර්වල ස්වභාවය සමඟ අඛණ්ඩව අරගල කරන රටවල දූෂණ විරෝධී ව්‍යාපාරවල පෙරමුණේ සිටින ක්‍රියාකාරීන් දක්වා පුළුල් පාඨක පිරිසක් මෙයින් ඉලක්ක කර තිබේ. ගෝලීය චෞර පාලන තන්ත්‍රය වැනි සංකීර්ණ හා පැතිරී පවත්නා පාරජාතික අභියෝගයකට අවශ්‍ය කෙරෙනුයේ ඒ හා සමානව විවිධත්වයෙන් පිරි ප්‍රතිචාරයකි. දූෂණයට එරෙහි සටනේ නියැලී සිටින ඕනෑම මට්ටමක පුද්ගලයින්, විවිධ රටවල් විසින් ඉටු කරනු ලබන භූමිකාවන්, දූෂණයට පහසුකම් සපයන දුර්වලතා සහ එම දුර්වලතා සඳහා ප්‍රතිපත්තිමය පිළියම් පිළිබඳව චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් හා සමානවම මනා දැනුමක් ඇතිව සිටිය යුතුය.

එනමුත් පළමුව, චෞර පාලන තන්ත්‍රය ක්‍රියා කරන ආකාරය සහ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් තමන්ගේම අධිකාරවාදී සමාජයන් තුළ හා ගෝලීය පරිමාණයෙන් දූෂණයට ඇති අවස්ථා පුළුල් කර ගැනීමට උත්සාහ කරන ආකාරයන් පිළිබඳ පැහැදිලි සහ ස්ථිර අවබෝධයක් ඇති කර ගැනීම අවශ්‍ය වේ. ලොව පුරා මෑත කාලීනව සිදු වූ විවිධ පාරජාතික දූෂණ සිද්ධීන්ගෙන් ලබාගත් නිරීක්ෂණ මෙන්ම දූෂණ විරෝධී විශේෂඥයින්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ මේ මාතෘකාව සම්බන්ධයෙන් අනගි අවබෝධයක් ලබා දුන් තවත් බොහෝ අය සමඟ කළ සාකච්ඡා මත පදනම් වූ මෙම උපායමාර්ග පිළිබඳ අත්පොතෙහි අරමුණ වන්නේද එයයි.

මෙම උපායමාර්ග පිළිබඳ අත්පොතෙහි ව්‍යුහය පහත පරිදි වේ. එය ප්‍රථමයෙන්ම චෞර පාලන තන්ත්‍රය නිර්වචනය කිරීම, 20 වැනි සියවසේ අග භාගයේදී එහි නැගීම ගවේෂණය කිරීම, එය ක්‍රියා කරන ආකාරය සහ එය මැනිය යුතු ආකාරය විස්තර කිරීම සහ නූතන චෞර පාලන තන්ත්‍රය පිළිබඳ අවබෝධයේ සහ වර්ගීකරණයේ නව්‍ය රාමුවක් නිර්මාණය කිරීම සඳහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් ඉලක්ක කරන්නේ කුමක් දැයි පරීක්ෂා කිරීම සිදු කරයි. දෙවනුව, මෙම අත්පොත විසින් ප්‍රවර්ග

හතරක් භාවිතා කරමින් කිසියම් දේශයකට සීමා වූ චෞර පාලන ත්‍රාන්ත්‍රික ක්‍රමෝපායන් ගවේෂණය කරනු ලබයි: (1) දේශපාලනය හා නීතිය මත පදනම් වූ, (2) ආර්ථිකය හා මූල්‍ය මත පදනම් වූ, (3) බලහත්කාරය සහ ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ හෝ (4) සන්නාමකරණය සහ ආඛ්‍යානය මත පදනම් වූ. තවද, මෙම ක්‍රමෝපායන් චෞර පාලන ත්‍රාන්ත්‍රික උපාය මාර්ගවලට ඒකාබද්ධ වන ආකාරය නිරූපණය කිරීම සඳහා සිද්ධි අධ්‍යයන ද මෙයට ඇතුළත් වේ. තෙවනුව, ක්‍රමානුබද්ධ දූෂණ අවදානම් කෙරෙහි අවධානය යොමු කිරීම, දූෂණයට සහ අනෙකුත් නීති විරෝධී මූල්‍යවලට එරෙහි සටනට ප්‍රමුඛත්වය දීම, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ආරක්ෂා කිරීම සහ දූෂණ විරෝධී ප්‍රයත්නයන් සවිබලගැන්වීම ඇතුළුව, මෙම ක්‍රමෝපායන්වලට එරෙහිව ක්‍රියා කිරීම සඳහා දේශීය වශයෙන් හෝ සමස්ත රට මට්ටමින් දැක්විය හැකි ප්‍රතික්‍රියාවන් මෙම උපායමාර්ග පිළිබඳ අත්පොත ගෙනහැර දක්වයි. සිව්වනුව, මෙම උපායමාර්ග පිළිබඳ අත්පොත, ජාතික චෞර පාලන තන්ත්‍රයෙන් ඔබ්බට එහි ගෝලීය මූලිකාංග දෙස අවධානය යොමු කරන අතර ඉහත විස්තර කර ඇති ප්‍රවර්ග හතර භාවිතා කරමින් පාරජාතික චෞර පාලන ත්‍රාන්ත්‍රික ක්‍රමෝපායන් නිර්වචනය කරයි. පස්වනුව, මෙම උපායමාර්ග පිළිබඳ අත්පොත මගින්, විදේශ නිලධාරීන්ට අල්ලස් ලබාදීම හා අල්ලස් සඳහා පෙළඹවීම සාපරාධී කියාවක් ලෙස නම් කිරීම, දූෂිත ක්‍රියාකාරීන් දණ්ඩනයට ලක් කිරීම, අධිකාරවාදී චෞර පාලන තන්ත්‍රයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදී සහයෝගීතාව ඇති කිරීම, ජාලයක් පරාජය කිරීමට ජාලයක් ගොඩනැගීම සහ සංක්‍රමණ සම්බන්ධයෙන් පවතින නීතියේ රැහැනින් ගැලවීමේ මාර්ග මැඩලීම ඇතුළු පාරජාතික ප්‍රතිප්‍රතිචාර ගෙනහැර දැක්වේ. චෞර පාලන තන්ත්‍රයට එරෙහිව ක්‍රියා කිරීම සඳහා සහ ලොව පුරා සිටින චෞර පාලන තන්ත්‍ර විරෝධී ක්‍රියාකාරීන්ට සහාය දැක්වීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාව වෙත අවසාන උපායමාර්ගික නිර්දේශ සපයමින් මෙම උපායමාර්ග පිළිබඳ අත්පොත අවසන් වේ.

## චෞර පාලන තන්ත්‍රය යනු කුමක්ද?

"සොරුන් විසින් පාලනය කිරීම" යන අරුත ඇති "චෞර පාලන තන්ත්‍රය" යන වචනය වර්ෂ 1800 ගණන්වල දී ප්‍රථම වරට ප්‍රකාශයට පැමිණි නමුත්, එහි භාවිතය වඩාත් පුළුල් වශයෙන් සිදු වූයේ 2016 වසරේ දී පැනමා පත්‍රිකා නිකුත් කිරීමෙන් පසුවය.

බොහෝ පුද්ගලයින් මෙම යෙදුම ධන තණ්හාවෙන් පෙළුණු සීතල යුද්ධ යුගයේ ඒකාධිපතියන් හෝ රුසියානු කතිපයාධිකාරීන්ගේ පමණ ඉක්මවා වියදම් කිරීම් සමඟ සම්බන්ධ කරන නමුත් පාරජාතික දූෂණයෙන් එල්ල වන බරපතල හා පැතිරී පවත්නා තර්ජනය පිළිබඳ අප වැඩිදුර ඉගෙන ගන්නා විට මෙම ලක්ෂණ නිරූපණය කිරීම් වඩ වඩාත් යල් පැන ගිය ස්වභාවයක් ගනී. "චෞර පාලන තන්ත්‍රය" පිළිබඳ ඒ අනුව පුළුල් වූ අවබෝධයක් ප්‍රචලිත කිරීම ශාස්ත්‍රීය අභ්‍යාසයක් නොවන නමුත් 21 වැනි සියවසේ එක් නිර්වචන අභියෝගයක් සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ ප්‍රවේශය වෙත දැනුම සැපයීම සඳහා අත්‍යවශ්‍ය වන්නනක් වේ.

එක්සත් ජනපද අධිකරණ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය දූෂණය යන්න නිර්වචනය කරන ආකාරය වන, "පෞද්ගලික වාසි ලබා ගැනීම සඳහා තම නිලය භාවිතා කරන රජයේ නිලධාරීන් විසින් මහජන විශ්වාසය කඩ කිරීමක්" යන්නද ඇතුළුව දූෂණය පිළිබඳ නීතිමය නිර්වචන මගින් බොහෝ විට රාජ්‍ය නිලධාරීන් කෙරෙහි අවධානය යොමු කළත්, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් (TI ) ආයතනය දූෂණය වඩාත් පුළුල් ලෙස අර්ථ දක්වන්නේ "තම පෞද්ගලික වාසිය වෙනුවෙන්, තමා වෙත පැවරී ඇති බලතල අනිසි ලෙස භාවිතා කිරීම" ලෙසය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය තවදුරටත් දූෂණයේ ප්‍රධාන ආකාර තුනක් වෙන්කර හඳුනා ගනී:

1. **සුළු දූෂණ:** බොහෝ විට රෝහල්, පාසල්, පොලිස් දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන වැනි ස්ථානවල මූලික භාණ්ඩ හෝ සේවාවන් වෙත ප්‍රවේශ වීමට උත්සාහ කරන සාමාන්‍ය පුරවැසියන් සමඟ අන්තර්ක්‍රියා කිරීමේදී රාජ්‍ය නිලධාරීන් විසින් තමා වෙත පැවරී ඇති බලතල දිනපතා අයථා ලෙස භාවිතා කිරීම.

2. **දේශපාලනික දූෂණය:** තමන්ගේ බලය, තත්ත්වය සහ ධනය පවත්වා ගැනීම සඳහා තම තනතුර අනිසි ලෙස භාවිතා කරන දේශපාලන තීරණ ගන්නන් විසින් සම්පත් වෙන් කිරීමේදී සහ මූල්‍යකරණයේ දී ප්‍රතිපත්ති, ආයතන සහ ක්‍රියාපටිපාටි රීති හැසිරවීම.

3. **මහා පරිමාණ දූෂණය:** බොහෝ දෙනෙකුට පාඩු විඳීමට සිදුවන පරිදි සුළු පිරිසකට ප්‍රතිලාභ ලබා දෙන සහ පුද්ගලයන්ට හා සමාජයට බරපතල හා පුලුල් ලෙස හානි සිදු කරන ඉහළ මට්ටමේ බලය අනිසි ලෙස භාවිතා කිරීම. බොහෝ විට ඒවාට දඬුවම් නොලැබේ.

චෞර පාලන තන්ත්‍රය, ක්‍රමානුබද්ධ දේශපාලනික දූෂණයට සහ මහා පරිමාණ දූෂණයට සමාන අර්ථයක් ගනු ලබන බවට පුළුල් ලෙස පරිකල්පනය කෙරේ. මේවා කළ හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදී වගවීම සහ නීතියේ ආධිපත්‍යය නොමැති රටවල නොබිඳී පවතින පදනමක් මත පමණක් වන හෙයින්, චෞර පාලන තන්ත්‍රය දැඩි ලෙස - එමෙන්ම සහජීවනයෙන් පවා - අධිකාරවාදී පාලන ක්‍රම සමඟ සම්බන්ධව පවතී. ලෝකයේ වඩාත්ම දූෂිත රජයන් ලෝකයේ අඩුම නිදහස් සමාජයන් පාලනය කිරීම අහම්බයක් නොවේ; චෞර පාලන තන්ත්‍රය ගැන “අධිකාරවාදයේ ආර්ථික විද්‍යාව” ලෙස සිතීම මෙම ප්‍රශ්නයට ප්‍රවේශ වීමට වලංගු ක්‍රමයකි.

එහෙත් එය නිර්වචනය කෙරෙන විශේෂ ලක්ෂණය වන්නේද ඉතිහාසය පුරා මානව සමාජවලට පීඩා එල්ල කර ඇති ආකාරයේ දේශපාලන දූෂණයෙන් අවසානයේ එය වෙන්කර හඳුනා ගැනෙන්නේද සමකාලීන චෞර පාලන තන්ත්‍රයේ පාරජාතික මූලිකාංගයයි. එය ගැටලුවෙන් වෙන් කළ නොහැකි වනවා පමණක් නොව, එයට මූලික හේතුවක්ද වේ.

චෞර පාලන තන්ත්‍රය, එසේ නම්, ඉහළ මට්ටමේ දූෂණයන් සම්බන්ධ වන **විශේෂිත ආකාරයේ අපරාධ ක්‍රියාකාරකම්**; **අධිකාරවාදී පාලන පද්ධතියක්**; සහ **ක්‍රමානුබද්ධ පාරජාතික තර්ජනයක්** යනාදියට එකවිටම සම්බන්ධ කළ හැකිය. චෞර පාලන තන්ත්‍රයේ මෙම සියලු විද්‍යමාන වීම් ඇතුළත් කෙරෙන නිසියාකාර නිර්වචනයක් විය හැක්කේ *දේශපාලන, ව්‍යාපාරික හෝ අපරාධකාරී ප්‍රභූන් සහ ඔවුන්ගේ වෘත්තීය මැදිහත්කරුවන් විසින් නීතිවිරෝධී අන්දමින් තමන් ධනවත් වීම හෝ දේශපාලන අරමුණු ඉදිරියට ගෙන යාමේ අරමුණින් සිදු කෙරෙන ක්‍රමානුබද්ධ පාරජාතික දූෂණය යන්නයි.*

## ගෝලීය චෞර පාලන තන්ත්‍රයේ නැගීම

පාරජාතික දූෂණය සහ ගෝලීය චෞර පාලන තන්ත්‍රයේ නැගීම පිළිබඳ වඩාත්ම විස්තරාත්මක වාර්තා ආරම්භ වන්නේ යටත් විජිතභාවයෙන් නිදහස් වීමේ යුගයේ හෝ සීතල යුද්ධයේ අවසානයේ, සංවර්ධනය වෙමින් පවතින සහ පශ්චාත් කොමියුනිස්ට්වාදී රටවල් පුරා දේශපාලන ප්‍රභූන් විසින් වඩ වඩාත් අන්තර් සම්බන්ධිත ගෝලීය ආර්ථිකය වෙත ප්‍රවේශය ගැනීම හා සමගාමීව දැවැන්ත ජාතික සම්පත්වල පාලනය භාරගත් අවස්ථාවේදීය.

ප්‍රජාතන්ත්‍රවාදී රටවලින් සිදු කෙරෙන ආර්ථික මැදිහත්වීම් සහ සංවර්ධන සහාය පුරෝකථනය කරන ලද්දේ ප්‍රජාතන්ත්‍රවාදී සංක්‍රාන්තීන් ස්වභාවිකවම වෙළඳපල ධනේශ්වර ආර්ථිකයන් සමඟ වැඩිවන වාණිජ සබඳතාවලින් සහ ලෝක ආර්ථිකයට ඒකාග්‍ර වීමෙන් ගලා එනු ඇතැයි යන උපකල්පනය මතය. එනමුත් බොහෝ රටවල, ප්‍රජාතන්ත්‍රවාදී නොවන පාලන තන්ත්‍රයන් රාජ්‍ය නිලතල, පෞද්ගලික ව්‍යාපාර සහ සංවිධානාත්මක අපරාධ අතර පැහැදිලි වෙනසක් නොමැතිව ආරම්භයේ සිටම ක්‍රියාත්මක වූ අතර බොළඳ හෝ කිසිදු ප්‍රතිපත්තියක් නොමැති ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ ගෞරවාදරයට ඔවුන් පත්වන තාක් කල් එම ගමන වෙනස් කිරීමේ අවශ්‍යතාවක් ඔවුහු නොදුටුහ. ඇතැමුන්ගේ තර්කය වන්නේ බහුපාර්ශ්වික ආයතන විසින් ප්‍රවර්ධනය කරනු ලබන ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය, මෙම කොල්ලකාරී භාවිතයන් සඳහා අර්ධ වශයෙන් වගකිව යුතු බවයි. නිදසුනක් වශයෙන්, යුරෝපීය සංගමයට ඇතුල් වීමේ හැකියාව, පැරණි සෝවියට් සමූහාණ්ඩුවේ දූෂිත දේශපාලනඥයන්ට සම්පත් සඳහා ප්‍රවේශය වැඩි කර දුනි.[1] මෙම ගැටලුව විශේෂයෙන්ම තෙල්, ගෑස් සහ ඛනිජ නිස්සාරණ කර්මාන්ත වැනි වටිනා ස්වභාවික සම්පත් වලින් ප්‍රධාන වශයෙන් ධනය උපයාගත් රටවල විශේෂයෙන් උග්‍ර විය. ජාතික තත්වයන් පුළුල් ලෙස වෙනස් වුවද, දූෂිත අනුග්‍රාහක ජාලයන් ගොඩනැගීමට, නැගී එන කල්ලිවාදයට සහ පුළුල් වශයෙන් සිදුවන මානව හිමිකම් සහ පාරිසරික අපයෝජනයන්ට තුඩු දෙන පටු නමුත් ලාභදායී ආදායම් මාර්ග පාලනය කිරීම සම්බන්ධයෙන් වන දේශපාලන තරඟය සමගින් "සම්පත් ශාපය" මොස්කව් සිට කැරකස් දක්වා ආසන්න වශයෙන් එකම කතාව අනුගමනය කරයි.[2]

ඒ අතරම, ස්ථාපිත හා විවිධත්වයෙන් යුතු වෙළඳපල ආර්ථිකයක් හෝ බහුල වශයෙන් ස්වභාවික සම්පත් හෝ නොතිබූ බොහෝ කුඩා අධිකරණ බල ප්‍රදේශ ගෝලීය වශයෙන් සම්බන්ධිත මූල්‍ය මධ්‍යස්ථාන ලෙස ආර්ථික සංවර්ධනය සඳහා වූ නව අවස්ථා දුටුවේය. සමෘද්ධිමත් වෘත්තීය-සේවා අංශයක් සංවර්ධනය කිරීම සහ ලොව පුරා ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා, ඔවුන්ගේ රජයන් විසින් සීමිත අධීක්ෂණයක් සහිත අවම නියාමනයක්, ඇතැම් විට සියයට 0 ක් තරම් පහළ අගයක් ගත් බදු සහ බොහෝ අවස්ථාවලදී විදේශ ආයෝජකයින් සඳහා පුරවැසිභාවය ලබාගැනීමට වේගවත් මාර්ග සපයන ලදී. එහෙත් සංස්ථාපිත ආයෝජන සහ පුද්ගලික ධනය උකහා ගැනීම අරමුණු කර ඇතැයි බාහිරට පෙනෙන පරිදි නිර්මාණය කර ඇති මෙම ප්‍රතිපත්ති, දූෂණයෙන් ලැබෙන මුදල් විශුද්ධිකරණය කිරීම සඳහා මූල්‍ය නිර්නාමිකභාවය සොයන අයට ද ඉතා ආකර්ශනීය විය. මේ අතර ප්‍රමුඛතම වූයේ මූල්‍ය ගනුදෙනුවල අභිමතය පිළිබඳ පොරොන්දුවයි: එනම්, දේශීය හෝ විදේශයන්හි බදු බලධාරීන්ගේ සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල පරීක්ෂාකාරී ඇස්වලින් ඈත්ව, නිර්නාමිකව අරමුදල් මාරු කිරීමට සහ තබා ගැනීමට ඇති හැකියාවයි. අපිරිසිදු අරමුදල් බොහෝ විට එවැනි රහස්‍යතාව සුරැකෙන ක්ෂේමස්ථාන හරහා කිසිවෙකුට නොදැනීම අතින් අතට ගිය අතර, අරමුදල්වල නිජභූමි සහ ආයෝජන හා ධනය අධික ලෙස ප්‍රදර්ශනය කිරීම් කිසිවෙකුගේ අවධානයට ලක් නොවී සිදු කළ හැකි ප්‍රධාන මූල්‍ය මධ්‍යස්ථාන අතර ආර්ථික වාහකයන් ලෙස ක්‍රියා කිරීමට ඒවා ඉදිරිපත් විය.

ඩුබායි, ලන්ඩන්, මියාමි සහ නිව් යෝර්ක් වැනි ගෝලීය නගර මෙම නව ධනය සහ ආයෝජන ගලා ඒම විවෘත හස්තයකින් පිළිගත්තේය. වර්ෂ 2000 පුරාවටම ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ ගැලී සිටීම හේතුවෙන්, නීතිය ක්‍රියාත්මක කරන ගෝලීය ආයතන සහ ආරක්ෂක සේවා, ධනවත් විදේශ නිලධාරීන් හා ධනවත් පන්තියේ ව්‍යාපාරිකයන් ඉහළ වටිනාකමකින් යුත් දේපල මිලදී ගැනීම, සුඛෝපභෝගී ජීවන රටාවන් ගත කිරීම සහ පරාර්ථකාමීභාවය හා දේශපාලන පරිත්‍යාග තුලින් ඉහල සමාජයට අනුග්‍රහය දක්වා වාසි ලබා ගැනීම පිළිබඳ එතරම් සැලකිල්ලක් දැක්වූයේ නැත.

මෙම සියලු සාධක එකතු වී සංවර්ධනය වෙමින් පවතින සහ පශ්චාත්-කොමියුනිස්ට් ලෝකය පුරා දූෂණ මට්ටම් ඉහළ යාමට පහසුකම් සැලසුවා පමණක් නොව එය පෙර නොවූ විරූ තත්වයකට පත්වීමට දිරිගැන්වීම් කළේය. මාර්ගගත ගිණුම් සහ ගෙවීම්, ඉලෙක්ට්‍රොනික වෙළඳ වේදිකා සහ ක්‍රිප්ටොකරන්සි (ගුප්තකේතන මුදල්) ඇතුළුව මූල්‍ය තාක්ෂණයේ අත්කරගත් ප්‍රධාන පෙළේ අභිවෘද්ධීන් මගින් මානව ඉතිහාසයේ කිසි දිනෙක නොවූ විරූ ලෙස, දේශපාලන ප්‍රභූන්හට තමන් සොරකම් කළ අතිවිශාල මුදල් ප්‍රමාණයන් එක් බොත්තමක් එබීමෙන් විශාල දේශසීමා හරහා ගෙනයාමට හැකි වී තිබේ. නිර්නාමිකව එසේ කිරීමට ඔවුන්ට ඇති හැකියාව, ප්‍රතිපත්තිමය අසාර්ථකත්වයන් සහ නීතියේ රැහැනින් ගැලවී යාමේ මාර්ගවලට ස්තූතිවන්තවන්නට, ඔවුන්ට දඬුවමකින් තොරව එය කළ හැකි බවටද සහතික විය.

1 යොමුවන්න: Knack, Stephen. Aid Dependence and the Quality of Governance: Cross-Country Empirical Tests." *Southern Economic Journal*, vol. 68, no. 2, 2001, doi.org/10.2307/1061596; and Asongu, Simplice A. On the Effect of Foreign Aid on Corruption." *Economics Bulletin*, vol. 32, no. 3, 2012, ideas.repec.org/a/ebl/ecbull/eb-12-00172.html. කෙසේ වෙතත්, මේ සඳහා වන සාක්ෂි මිශ්‍ර සහ අවිනිශ්චිත ස්වභාවයක් ගනී.

2 ස්වාභාවික සම්පත් පාලන ආයතනයට අනුව, සම්පත් ශාපය යනු " සම්පත් වලින් පොහොසත් බොහොමයක් රටවල් ඔවුන්ගේ ස්වභාවික සම්පත් ධනයෙන් පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීමට අපොහොසත් වීම සහ මෙම රටවල රජයන් මහජන සුබසාධන අවශ්‍යතා සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට අසමත් වීම" ලෙස දක්වයි.

නීතියේ ආධිපත්‍යයේ දුර්වලභාවය සමගින් අධිකරණ බල ප්‍රදේශවලින් අරමුදල් අයථා ලෙස පරිහරණය කිරීම, රටින් පිට රහස්‍යතාව සුරැකෙන ක්ෂේමස්ථාන හරහා විශුද්ධිකරණය කිරීම සහ ප්‍රධාන මූල්‍ය මධ්‍යස්ථානවල සඟවා භුක්ති විඳීම සිදුවන මෙම චෞර පාලන ත්‍රාන්ත්‍රික "චක්‍රය" මේ වන විට බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් මනා ලෙස තහවුරු කොට අවබෝධ කරගෙන ඇත. විවාදාත්මක ලෙස ඔවුන් දිගින් දිගටම අවතක්සේරු කරන්නේ ගැටලුවේ පරිමාණය සහ ඔවුන් මුහුන දෙන තවත් බොහෝ ප්‍රතිපත්තිමය අභියෝග ගෝලීයකරණයේ මෙම අඳුරු පැත්ත මගින් අවුලුවා දමන සහ උග්‍ර කර දමන ප්‍රමාණයයි.

## චෞර පාලන තන්ත්‍රය මැනීම

පැහැදිලි හේතූන් මත, ලොව පුරා චෞර පාලන තන්ත්‍රයේ පරිමාණය පිළිබඳ නිවැරදි අගයක් දැක්විය නොහැකිය. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් නීතිය ක්‍රියාත්මක කරන්නන් විසින් අල්ලා ගන්නා ලද සිද්ධි හෝ ඔවුන්ගේ කූටෝපායන් ගවේෂණාත්මක ජනමාධ්‍යවේදය හරහා හෙළිදරව් වී මාධ්‍යවල වාර්තා කරන ලද හෝ සිද්ධිවලදී ඒවාට සම්බන්ධ වූ මුදල බොහෝ විට සැලකිය යුතු ප්‍රමාණයක් ගනී. නමුත් ඒවා බොහෝ විට ගැටලුවේ අල්ප මාත්‍රයකට වඩා නියෝජනය නොකරයි.

දත්ත මත පදනම් වූ මෙවන් ප්‍රවේශයක සීමාවන් සහ මෙම එක් එක් සිද්ධි අධ්‍යයනයන්හි විෂය පථයන්හි විවිධත්වය පැවතියදීත්, ඒවා සෑම වසරකම ඩොලර් ට්‍රිලියන ගණනක පාඩුවක් ඇතුළත්, සිතාගත නොහැකි තරම් පරිමාණයේ ගෝලීය අභියෝගයක් නිරූපණය කරයි.

දූෂණය පිළිබඳ මහජනයාගේ සංජානනය තවත් වැදගත් දර්ශකයක් වන අතර, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයේ දූෂණ සංජානන දර්ශකය (CPI) නිසැකවම එවැනි ප්‍රවේශයක් ගන්නා වඩාත්ම විශාල ලෙස සමුද්දේශ සපයන ලද අධ්‍යයනය වේ. එහෙත් නමෙන් පෙන්නුම් කරන පරිදි (සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයම අවධාරණයට ලක් කිරීමට වෙහෙසෙන පරිදි), දූෂණ සංජානන දර්ශකය සමකාලීන පාරජාතික දූෂණය පිළිබඳ විස්තීර්ණ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන බවට මවාපාන්නේ නැත; ඒ වෙනුවට, එය ඔවුන්ගේම රටවල් තුළ රාජ්‍ය අංශයේ දූෂණය පිළිබඳ ජනගහනයේ සංජානනයන් මනිනු ලබයි. සිය රහසින් ක්‍රියාත්මක වන බැංකු ක්ෂේත්‍රය, සොරකම් කළ දෑට රැකවරණය සැපයීමට බොහෝ දුරට සමානාර්ථයක් ගෙන ඇති රටක් වන ස්විට්සර්ලන්තයේ ජනගහනය දැනට ලෝකයේ තුන්වන අඩුම දූෂිත රට තමන්ගේ රට බවට වටහා ගෙන සිටින්නේ ඇතැම් විට මේ නිසා විය හැකිය.

සමකාලීන චෞර පාලන තන්ත්‍රය සඳහා පහසුකම් සැලසීමේ ලා රහස්‍යතාව සුරැකෙන ක්ෂේමස්ථාන සහ මූල්‍ය මධ්‍යස්ථානවල භූමිකාව සැලකිල්ලට ගෙන, වෘත්තීය සහ නීති සේවාවල කාර්යභාරය මැනීමට උපකාරී වන ඒවා සමඟ දූෂණ සංජානන දර්ශකය වැනි ජාතික ශ්‍රේණිගත කිරීම් මෙන්ම බදු යුක්ති ජාලයේ මූල්‍ය රහස්‍යතා දර්ශකය (FSI) වැනි අනෙකුත් පාරජාතික කාරකයන් පිළිබඳ සලකා බැලීම ප්‍රයෝජනවත් වේ. මෙම දර්ශකය විවිධ බල ප්‍රදේශයන්හි මුදල් විශුද්ධිකරණ-විරෝධී පාලන තන්ත්‍රවල සහ දූෂණ විරෝධී නීතිවල කාර්යක්ෂමතාව මෙන්ම ගෝලීය ආර්ථිකය සඳහා ඒවායේ

## චෞර පාලන තන්ත්‍රයෙහි පිරිවැය ගණනය කිරීම

එහි නීති විරෝධී ස්වභාවය නිසා, චෞර පාලන තන්ත්‍රයේ පිරිවැය ගණනය කිරීම අපහසු වන නමුත් පහත අධ්‍යයනයන් ඇතැම් විශ්මයජනක ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇත:

1. **ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 1ක්** අල්ලස් වශයෙන් ගෙවනු ලබන බවත්, තවත් **ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 2.6ක්** සෑම වසරකම ලොව පුරා සොරකම් කරනු ලබන බවත්, ලෝක ආර්ථික සංසදය ඇස්තමේන්තු කර ඇත.
2. 2008 සහ 2017 අතර කාලයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ දියුණු ආර්ථිකයන් අතර වෙළඳ වාර්තා වලින් **ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 8.7 ක්** අතුරුදහන් වී ඇති බව වොෂිංටන් ඩී සී පදනම් වූ ග්ලෝබල් ෆයිනැන්ෂියල් ඉන්ටග්‍රිටි -Global Financial Integrity නම් බුද්ධි මණ්ඩලයක් විසින් සොයා ගන්නා ලදී.
3. **ලෝක දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) සියයට 10 කට** සමාන අරමුදල්, මූලාරම්භක ප්‍රදේශය අනුව බොහෝ සෙයින් වෙනස් වන බදු ක්ෂේමස්ථාන තුළ රඳවා තබා ඇති බව, එනම් ස්කැන්ඩිනේවියානු රටවල් වල සියයට කිහිපයක සිට සහ යුරෝපයේ සියයට 15ක පමණ සිට සහ අරාබි ගල්ෆ් රටවල සහ සමහර ලතින් ඇමරිකානු ආර්ථිකයන්හි සියයට 60 දක්වා රඳවා තබා ඇති බව ශාස්ත්‍රීය අධ්‍යයනයක් අදහස් ඉදිරිපත් කරයි.
4. 2012 වසරේදී සිදු කෙරුණු අධ්‍යයනයකින් අක්වෙරළේ ඇති මුළු පුද්ගලික ධනය **ඩොලර් ට්‍රිලියන 32ක්** ලෙස දක්වා ඇත. වඩාත් මෑතක දී, ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයෙහි (OECD) රටවල් වලට සාමූහිකව පොදු වාර්තාකරණ ප්‍රමිතිය යටතේ තොරතුරු බෙදාගැනීමේ යාන්ත්‍රණයන් හරහා වාර්තා නොකළ අක්වෙරළ වත්කම් **ඩොලර් ට්‍රිලියන 11** ක් පමණ හඳුනා ගැනීමට හැකි විය.
5. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යෝජනා කර ඇත්තේ වඩාත්ම දූෂිත රජයන් ඇති රටවලට අඩුම දූෂිත රජයන් ඇති රටවලට සමාන කාර්යක්ෂමතාවයකින් බදු එකතු කිරීමට හැකි වුවහොත්, ගෝලීය බදු ආදායම **ඩොලර් ට්‍රිලියන 1කට** වඩා වැඩි ප්‍රමාණයකින් වැඩි වනු ඇති බවයි. එය වාර්ෂිකව, එක්සත් ජාතීන්ගේ (UN) තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීමට අවශ්‍ය අරමුදල් මෙන් දෙගුණයක් පමණ නියෝජනය කරයි.

ඇති සාපේක්ෂ වැදගත්කම ඇතුළු ප්‍රධාන දර්ශක භාවිතා කරමින් එම බල ප්‍රදේශයන් තක්සේරු කිරීම සිදු කරයි. මූල්‍ය රහස්‍යතා දර්ශකය අඛණ්ඩවම සංවර්ධිත බටහිර ජාතීන් එහි නරකම වැරදිකරුවන්ගේ ලැයිස්තුවේ ඉහළින්ම ශ්‍රේණිගත කරන අතර, කේමන් දූපත්, එක්සත් ජනපදය සහ ස්විට්සර්ලන්තය 2020 වසරේදී මූල්‍ය රහස්‍යභාවය සහ පාරජාතික දූෂණයට පහසුකම් සැලසීමේ ප්‍රතිඵල වශයෙන් ලැබෙන අවදානම අතින් ලෝකයේ නරකම රටවල් තුන ලෙස ශ්‍රේණිගත කර ඇත.

මෙම අධ්‍යයනයන් සහ දර්ශක නිසැකවම සමකාලීන පාරජාතික දූෂණයේ පරිමාණය සහ ස්වභාවය නිදර්ශනය කිරීමට උපකාරී වේ. නමුත් වැඩිදුර සන්දර්භයක් නොමැතිව, චෞර පාලන තන්ත්‍රය මගින් තත්‍ය ලෝකයට ඇති කෙරෙන බලපෑම ගැන ඒවා අපට පවසන්නේ අල්ප වශයෙනි.

පිළිවෙලින් ආ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ පරම්පරාවන් දූෂණය, ආර්ථික-සංවර්ධන ප්‍රශ්නයක්: යහපත් අරමුණු සහිත, දරිද්‍රතාවය පිටුදැකීමේ ප්‍රයත්නයන්ට අවාසනාවන්ත නමුත් නොවැළැක්විය හැකි බාධාවක්, ලෙස බෙදා වෙන් කිරීමේ වැරැද්ද සිදු කර ඇත. නමුත් චෞර පාලන තන්ත්‍රය මැනීමේ ක්‍රමය, එය ආරක්ෂාව, සමෘද්ධිය සහ අවසානයේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වෙනත් තර්ජන ඇති කරන සහ උග්‍ර කරන ප්‍රමාණය හඳුනා ගැනීමට හැකිවීම තුළ පවතී.

මෙය කිරීමට ඇති පහසුම ක්‍රමයක් නම් හුදෙක් දූෂිත අධිකාරවාදී පාලන තන්ත්‍රයන් යටතේ දුක් විඳින ජනතාවන්ට සවන් දීම ආරම්භ කිරීමයි. අරාබි වසන්තයේ මූලාරම්භයේ සිට අද මොස්කව්, හවානා සහ කැරකස්හි වීදි දක්වා, නිදහස අහිමි සමාජවල විරෝධතාකරුවන් තම පාලක පන්තියේ දූෂණය ඔවුන් ප්‍රධාන වශයෙන්ම පෙලන ගැටළු අතර පවතින බව හොඳින්ම පෙන්වා දී තිබේ. කෙසේ වෙතත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල ප්‍රතිපත්ති සම්පාදකයින් ඒවාට සම්බන්ධ වීමට සහ ඒවාට සහාය වීමට දරන ප්‍රයත්නයන්හි වඩාත් වැදගත්ම ස්ථානය දූෂණ විරෝධී බවට ලබාදීමට තවමත් කටයුතු කළ යුතුව ඇත.

## චෞර පාලන තන්ත්‍රය ක්‍රියා කරන ආකාරය

චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් හට දූෂිත ක්‍රියාවන් සඳහා අවස්ථා උපරිම කර ගැනීමට හැකි වන්නේ කෙසේදැයි ගවේෂණය කිරීමට පෙර, එසේ කිරීමට ඔවුන් ලබන අභිප්‍රේරණයන් සහ ඔවුන් පොදුවේ භාවිතා කරන ක්‍රම තේරුම් ගැනීම වැදගත් වේ.

### *චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් දූෂණ ක්‍රියාවන්හි යෙදෙන්නේ ඇයි?*

"චෞර පාලන ත්‍රාන්ත්‍රිකයා" යන වචනය රාජ්‍ය මුදල් වංචා කරන හෝ පෞද්ගලික අංශයෙන් අල්ලස් ලබා ගන්නා කෑදර රාජ්‍ය නිලධාරීන් සමඟ සම්බන්ධයන් මවා පෙන්වීමේ නැඹුරුවක් දක්වයි. එනමුත් මෑත දශක කිහිපය තුළ දූෂණයට ඇති අවස්ථා පුළුල් වී ඇති සේම, දූෂණයේ නියැලීමට හේතු ද පුළුල් වී තිබේ. මෙහිදී තණ්හාව නිසැකව ම වඩාත්ම සරල සහ පුලුල් පැහැදිලි කිරීම ලෙස පවතින අතරම, මුදල් නොවන අරමුණු සඳහා ද දූෂිත භාවිතයන් යොදා ගනු ලැබේ.

නිදසුනක් වශයෙන්, යුරෝපයේ සහ එක්සත් ජනපදයේ සුඛෝපභෝගී ජීවන රටාවක් පවත්වා ගැනීම සඳහා ඔහුගේ දුප්පත් මව් රටෙන් අමු අමුවේ මුදල් පැහැරගැනීම් හා වංචා සිදු කළ සමක ගිනියානු කුමාරයා සහ මැලේසියානු රජය සමඟ උපායමාර්ගිකව වැදගත් යටිතල පහසුකම් ගනුදෙනු තමන් වෙත අත්කර ගැනීම වෙනුවෙන් 1Malaysia Development Berhad (1MDB) කොල්ලයට මූල්‍යමය වශයෙන් සහයෝගය දීමට රහසිගතව ඉදිරිපත් වූ මහජන චීන සමූහාණ්ඩුවේ නිලධාරීන් අතර පැහැදිලි වෙනසක් ඇත. අවිවාදයෙන්ම මෙම දෙපිරිසම අතිශයින් හානිකර වූ දූෂිත ක්‍රියාවන්හි නියැලුණු චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් වන නමුත්, එසේ කිරීමට ඔවුන්ට බලපෑ හේතු මීට වඩා වෙනස් විය නොහැක.

ඊට සම්බන්ධ වූවන්ගේ වරද සුළු කොට නොතකා, දුර්වල හෝ නීතියේ ආධිපත්‍යයක් නොමැති සමාජවල සාමාජීය හා ආර්ථික ප්‍රගමනය සඳහා ඇති එකම මාර්ගය බොහෝ විට දූෂිත ක්‍රියාවන්හි යෙදීම බව මතක තබා ගැනීම වැදගත් වේ. ඔවුන්ගේ ක්‍රියාවන් නිසා ඇති විය හැකි හානිය ඔවුන්ට පැහැදිලිව පෙනෙන්නට තිබිය යුතු වුවත්, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් බවට පත් වීමට සිටින පුද්ගලයින් විසින් සාපරාධීභාවය කරා ඉක්මවා ගිය එම දෙක වෙන් කරන රේඛාව ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල පුරවැසියන් සඳහා මෙන් පැහැදිලිව සකස් වී නොමැත. පාරජාතික දූෂණයට පහසුකම් සපයන, කිසිදු ප්‍රතිපත්තියක් නොමැති වෘත්තීය අතරමැදියන් සම්බන්ධයෙන් මෙයට හරියටම ප්‍රතිවිරුද්ධ දෙය පැවසිය හැකි බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

පුද්ගල අභිප්‍රේරණ එක් එක් සිද්ධිය සම්බන්ධයෙන් විශාල ලෙස වෙනස් වන බව හඳුනාගැනෙන අතරම, දූෂණයේ යෙදීම සඳහා පුළුල් ලෙස, බොහෝ විට අතිච්ඡාදනය වන (එකක් මත එකක් ආවරණය වන අන්දමේ) හේතු තුනක් තිබේ:

- **නීති විරෝධී අන්දමින් ධනවත් වීම:** දූෂිත ක්‍රියාවන්හි නියැලීම සඳහා මූලික වන වඩාත්ම පැහැදිලි සහ පුලුල්ව පැතිරුනු හේතුව වන්නේ හුදෙක් පුද්ගලික ධනය අයථා ලෙස උපයා ගැනීමයි.
- **රට තුළ අත්කරගෙන සිටින බලය සහ කීර්තිය:** සම්පත්, ආර්ථික අවස්ථා හෝ දේශපාලන ප්‍රගතිය සඳහා ප්‍රවේශ වීමේ වරප්‍රසාදය භුක්ති විඳීමට අවස්ථාව සැලසීම වෙනුවෙන් පාලන තන්ත්‍රයට සහය දක්වන අනුග්‍රාහක ජාල සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම තුළින් අධිකාරවාදී පාලන තන්ත්‍රයන් නොවෙනස්ව පවත්වා ගෙන යනු ලැබේ.
- **විදේශ බලපෑම:** රට තුළ දූෂණය මත ගොඩනැගුණු පාලන තන්ත්‍රයන්ට දූෂිත ක්‍රියාවන් විදේශ ප්‍රතිපත්තියේ මෙවලම් ලෙස භාවිතා කිරීම ගැන කිසිදු තැකීමක් නොමැත. බලගතු බවින් අඩු පාලන තන්ත්‍රයන් ජාත්‍යන්තරයේ පරීක්ෂාවට ලක්වීමෙන් ආරක්ෂා වීම සඳහා සහ ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔවුන්ගේ නීත්‍යානුකූලභාවය සහ කීර්තිය වැඩි දියුණු කරගැනීම සඳහා එසේ කළ හැකිය. එහෙත් චීනය, රුසියාව සහ ඉරානය වැනි බලගතු අධිකාරවාදී පාලන තන්ත්‍රයන් ද "දේශපාලන අරමුණු ඉටු කර ගැනීම පිණිස වෙනත් රටවල් සහ ජාත්‍යන්තර ආයතන සිය සහයෝගයට යොදා ගැනීම සඳහා දූෂිත භාවිතයන්

## කුප්‍රකට 1MDB වංචාව

2009 වසරේදී, හිටපු මැලේසියානු අගමැති නජීබ් රසාක් විසින් විදේශ ආයෝජන හරහා මැලේසියාවේ සංවර්ධනය සහ ආර්ථික සුරක්ෂිතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ආදායම් උත්පාදනය කිරීමට අදහස් කරනු ලබන ස්වෛරී ධන අරමුදලක් වන 1Malaysia Development Berhad (1MDB), පිහිටුවන ලදී. මැලේසියානු ව්‍යාපාරිකයන් වන Low Taek Jho (හෙවත්"Jho Low") මුල සිටම අරමුදලේ උපදේශකයෙකු ලෙස ගෙන එන ලදී. යුක්තිය පිළිබඳ එක්සත් ජනපද දෙපාර්තමේන්තුවට අනුව, 2009 සහ 2015 අතර, 1MDB වෙතින් ඩොලර් බිලියන 4.5 කට වඩා වැඩි මුදලක් ලබාගෙන අක්වෙරළ බැංකු ගිණුම් සහ ෂෙල් සමාගම් වෙත මාරු කර ඇත. අරමුදලින් ඩොලර් මිලියන සිය ගණනක් ස්වර්ණාභරණ, කලා නිර්මාණ, චිත්‍රපට අයිතිය, සූදුව, සාද සහ යාත්‍රාවක් සඳහා වියදම් කරන ලදී. වෙනතක හරවන ලද අරමුදල්වලින් සමහරක් මුල් අරමුදලෙන් කරනු ලැබූ ආයෝජනයට ප්‍රතිලාභයක් ගලපා සාදා පෙන්වීමට ද යොදා ගන්නා ලදී.

2015 දී මාධ්‍යවේදීන් විසින් මෙම සිද්ධිය හෙළිදරව් කිරීමෙන් පසු මැලේසියානු දූෂණ විරෝධී කොමිසම අගමැති නජීබ් රසාක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කළේය. ඔහු නීතිපති, නියෝජ්‍ය අගමැති මුහයිදීන් යසින් සහ 1MDB විවේචනය කරන තවත් අමාත්‍යවරුන් හතර දෙනෙකු ඉවත් කිරීම මගින් පරීක්ෂණ නතර කිරීමට සහ ඔහුගේ තනතුර පවත්වා ගැනීමට උත්සාහ කළේය. එක්සත් ජනපදය, සිංගප්පූරුව සහ ස්විට්සර්ලන්තය විසින් විවෘත කරන ලද පරීක්ෂණ සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ද ඔහු ප්‍රතික්ෂේප කළේය. වසරක් ඇතුළත, රසාක් නව නීතිපතිවරයෙකු පත් කළ අතර එම නීතිපති ඔහු නිර්දෝෂී බව ප්‍රකාශ කර නඩුව අවසන් කළේ, රසාක්ගේ බැංකු ගිණුමට ඩොලර් මිලියන 681 මාරු කිරීම සෞදි රාජකීය පවුලෙන් ලැබුණු තෑග්ගක් බව සහ 1MDB අරමුදලෙන් වංචා නොකළ බව පවසමිනි.

1MDB වංචාව අතරතුර රසාක්ගේ ඍජු විවේචකයෙකු බවට පත් වූ හිටපු උපදේශක සහ අගමැති මහතීර් මොහොමඩ් විසින් 2018 දී පරාජයට පත් කිරීමෙන් පසුව නජීබ්ට අවසානයේ ඔහුගේ අගමැති ධුරය අහිමි විය. මහතීර්ගේ තේරී පත්වීමෙන් පසු, පරීක්ෂණය නැවත ආරම්භ කරන ලද අතර රසාක්ගේ නිවස සෝදිසි කිරීමේදී ඔහුගේ බිරිඳට අයත් ඩොලර් මිලියන 273 ක් වටිනා ස්වර්ණාභරණ සහ අත්බෑග් අනාවරණය විය. ජෝ ලෝගේ ආගියතැන් තවමත් නොදන්නා නමුත් ඔහු චීනයේ සිටින බව විශ්වාස කෙරේ.

හිතාමතා සහ ක්‍රමානුකූලව භාවිතා කිරීම ලෙස අර්ථ දක්වා ඇති "උපායමාර්ගික දූෂණයේ" වැඩි වැඩියෙන් නිරත වේ.

## චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් ඉලක්ක කරන්නේ මොනවාද?

චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් දූෂණ ක්‍රියාවන්හි යෙදෙන්නේ ඇයි සහ කෙසේද යන ප්‍රශ්නයට සමීපව සම්බන්ධ වන්නේ ඔවුන් සාමාන්‍යයෙන් අයථා පරිහරණය හෝ වෙනත් ආකාරයේ අවභාවිතයන් සඳහා ඉලක්ක කරන අරමුදල් සහ වත්කම් වර්ග වේ. සෑම විටම මෙන්, නිරවුල් වර්ගීකරණයක් යොදාගත හැක්කේ සීමිත ප්‍රමාණයකින් වන අතර, ඕනෑම දූෂණ කූටෝපායක් තුළ බොහෝ විට සැලකිය යුතු අතිච්ඡාදනයක් පවතී.

**රාජ්‍ය මුදල්:** ඇතැම් ආකාරයේ රාජ්‍ය වියදම්, වංචා කිරීම්වලට සහ අයුතු ලාභ සලසා දීම නිසා දීමනා ලැබීම්වලට විශේෂයෙන් ගොදුරු විය හැකි බව ඔප්පු වී ඇත: විශේෂයෙන් යටිතල පහසුකම්, සෞඛ්‍ය සහ ආරක්ෂක අංශ මෙහිදී අදාළ වේ. මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ රජයේ වියදම්වලින් මෙම ක්ෂේත්‍රවලට විශාල මුදල් ප්‍රමාණයක් යෙදවීම, ඒවා හා සම්බන්ධ පද්ධති සහ කොන්ත්‍රාත්තුවල සාපේක්ෂ සංකීර්ණතාවය හේතුවෙන් ඇතිවිය හැකි නීතියේ රැහැනින් ගැලවී යා හැකි මාර්ග සහ බදු ගෙවන්නන්ගෙන් වක්‍රාකාරව සොරකම් කිරීම ක්ෂණිකව දැකීමට වින්දිතයින්ට ඇති ඉඩකඩ අඩු වීම යනාදියයි. ඉක්මන් කරවනු ලැබූ ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සහ රජයේ ප්‍රතිචාර විදහා දැක්වූ දැවැන්ත රාජ්‍ය මූල්‍ය උත්තේජක පැකේජ නව දූෂණ අවදානම් ඇති කිරීමත් පවතින ඒවා උග්‍ර කිරීමත් කළ බැවින්, COVID-19 වසංගතය තුළ මෙම ප්‍රශ්නය ඉක්මණින්ම සැලකිල්ලට යොමු කිරීම අවශ්‍ය වූ කාරණයක් බවට පත්විය. වෙනිසියුලාවේ ඉතිරිව ඇති රන් සංචිතය දිගින් දිගටම කොල්ලකෑමට ලක්වීම තුළින් ඇතැම් විට වඩාත් හොඳින් පෙන්නුම් කෙරෙන පරිදි, ඒකාබද්ධ චෞර පාලන තන්ත්‍රයන්හිදී, මහ බැංකු සහ මුදල් සංචිත, පාලන තන්ත්‍රයට අවශ්‍ය පරිදි සාර්ථක ලෙස භාවිතා කිරීමට හැකි ලෙස පවතී.

**පාරිභෝගික භාණ්ඩ සහ ස්වභාවික සම්පත්:** ඇතැම් අංශ විශේෂයෙන්ම දූෂිත භාවිතයන්ට ලක් වීමේ අවදානම පවතින බව හෝ එයට නැඹුරු වී ඇති බව ඓතිහාසිකව ඔප්පු කර ඇත. එහිදී, "සම්පත් ශාපය" සඳහා උදාහරණ සපයන තෙල්, ගෑස් සහ ඛනිජ නිස්සාරණ කර්මාන්ත කැපී පෙනේ. රාජ්‍ය ව්‍යාපාරයක් (SOE) හරහා රජය විසින් පාලනය කරනු ලැබුවද එසේ නොමැති නම්, පුද්ගලික අංශය විසින් පාලනය කරනු ලැබුවද, මෙම අංශ මගින් ජනනය කරනු ලබන අතිවිශාල ආදායම් බොහෝ විට වඩාත් විවිධාංගීකරණය වූ ආර්ථිකයන් මතුවීම අකර්මණ්‍ය කරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම සම්පත් පාලනය කිරීම, ධනය සඳහා ඇති එකම ශක්‍ය මාර්ගය බවට පත් වේ. තම මව් රටවල ප්‍රබල විදේශීය අල්ලස් නීතිවලට යටත් නොවන විදේශීය නිස්සාරණ සමාගම් දේශීය නිලධාරීන්ට අල්ලස් දීම් සහ තමන් වෙත අයුතු ලාභ සලසා දීම නිසා දීමනා ලබා දීම සිදුකිරීම මගින් මෙම ගැටලුව නිතර උග්‍ර කරයි. මහජන මුදල් ගසාකෑම මෙන් නොව, මෙම ගෙවීම් අත් අතකට හැරවීම රහසිගතව සිදුවන අතර සාමාන්‍ය ජනතාවට ඉන් පැහැදිලි බලපෑමක්

නොතිබිය හැකිය. ඇත්ත වශයෙන්ම, නිස්සාරණ කර්මාන්තවලින් ලැබෙන ආදායම්, අධිකාරවාදී පාලන තන්ත්‍රයන් බදු ආදායම මත යැපීම වඩාත් පහළ මට්ටමක ගෙන ඒම පවාත් ඒ අනුව, සිය ජනතාව වෙත වගකිව යුතුභාවය අඩු කිරීමත් සිදු කළ හැකිය.

**සංවර්ධන සහ ආරක්ෂක සහාය:** ධනවත් රටවලින් සහ ජාත්‍යන්තර සංවිධානවලින් විශාල ලෙස ගලා එන මුදල් අනාගත චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් බවට පත්වීමට සිටින පුද්ගලයින්ට බොහෝ විට ආශා උපදවන ඉලක්කයක් සපයයි. ඇත්ත වශයෙන්ම, බොහෝ පරිත්‍යාගශීලීන් දැන් සංවර්ධන කටයුතු සඳහා මුදල් සහ ආධාර සැපයීමේදී වඩාත් දැඩි අධීක්ෂණ අවශ්‍යතා පනවන අතර එමගින් දූෂිත මුදල් කාන්දුවීම් සාපේක්ෂව දුර්ලභ මට්ටමකට පත් වේ. එසේ වුවද, මෑතකාලීන ලෝක බැංකු වාර්තාවක් මගින් ආධාර ගෙවීම්වල වැඩිවීම් සහ එතෙර බැංකු ගිණුම් වෙත මාරු කිරීම් අතර සහසම්බන්ධයක් අනාවරණය කරගත් අතර, සංවර්ධන ආධාර නොමග යැවීම ගැටලුවක්ව පවතින බවට එමගින් අදහසක් ඉදිරිපත් වේ.

**පෞද්ගලික අංශය:** ඕනෑම ආකාරයක ව්‍යාපාරයක් බලෙන් ලබා ගැනීම්, වංචාවෙන් ගැනීම් හෝ වෙනත් දූෂිත ක්‍රියාවන් හරහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ගේ ගොදුරු බවට පත්විය හැකිය. ක්‍රමානුබද්ධ දූෂණයෙන් පෙළෙන රටවල මහජන මුදල් ගසාකෑම සමඟ පුද්ගලික සමාගම්වලින් අල්ලස් ඉල්ලා සිටීම අයුතු ලාභ ප්‍රයෝජන සලසා ගැනීමේ වඩාත්ම පොදු ආකාරය වේ. එය කුමන ස්වරූපයක් ගත්තද, ක්‍රමානුබද්ධ දූෂණය මගින් අවිනිශ්චිතභාවය ඇති කිරීම, ව්‍යාපාර කිරීමේ පිරිවැය ඉහළ නැංවීම සහ අවසානයේ පුද්ගලික ව්‍යවසායන්ට බාධා ඇති කිරීම සිදු කරමින් ආර්ථික බලය රාජ්‍යය තුළ තවදුරටත් සංකේන්ද්‍රණය කිරීම සහ දූෂණ අවදානම් ඉහළ දැමීම සිදු කරයි.

**උපායමාර්ගික වත්කම්:** දූෂිත ක්‍රියාවන්හි නියැලීම සඳහා වන අභිප්‍රේරණ සියල්ලම අත්පත් කර ගැනීමේ ස්වභාවයක් හෝ මූල්‍යමය ස්වභාවයක් පවා හෝ නොගනී. විශේෂයෙන්ම, “උපායමාර්ගික දූෂණයේ” යෙදෙන බලගතු අධිකාරවාදී පාලන තන්ත්‍රවල අනුගාමිකයින් උත්සාහ කරන්නේ තමන් වෙනුවෙන් කිසිවක් සොරකම් කිරීමට නොව, දේශපාලන වාසි තකා බලගතු බවින් අඩු රටවල දේශීය ප්‍රභූන්ගේ සහයෝගය තමන් වෙත ඇද ගැනීමට ය. උදාහරණයක් ලෙස, මහජන චීන සමූහාණ්ඩුව විසින් උපාය මාර්ගික වශයෙන් වැදගත් ශ්‍රී ලංකා වරායක් රහස් ගණුදෙනු හරහා අත්පත් කර ගැනීම, ආර්ථික ප්‍රතිලාභ ද ලබා දුන් නමුත් මූලික වශයෙන් ආරක්ෂාව හා සම්බන්ධ කරුණු සඳහා සිදු කරන ලද බවට වාර්තා විය.

## නව රාමුවක්

පුද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා රාජ්‍ය සම්පත් උදුරා ගැනීමත්, බලය සිය ග්‍රහණයේ පවත්වා ගෙන යාම හා චිරස්ථායී කිරීමත් සඳහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් විසින් භාවිතා කරනු ලබන විවිධ දේශීය හා පාරජාතික උපක්‍රම පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් අද දක්වාම පැවති නැත. ප්‍රජාතන්ත්‍රවාදයට චෞර පාලන තන්ත්‍රය වෙතින් එල්ල කෙරෙන අභියෝගයේ සම්පූර්ණ විෂය පථය අවබෝධ කර ගැනීම සඳහාත්, ඒවායේ බලපෑම් වැළැක්වීමට සහ අවම කිරීමට දේශීය හා ජාත්‍යන්තර උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහාත් චෞර පාලන තන්ත්‍රය චිරස්ථායී කරන බහුවිධ ක්‍රමෝපායන් ලැයිස්තුගත කිරීම අවශ්‍ය වේ. මෙහි ලැයිස්තුගත කර ඇති ක්‍රමෝපායන් කිහිපයක් චෞර පාලන තන්ත්‍ර සංකල්පීය රාමුවේ දෘෂ්ටි කෝණය හරහා ඉදිරිපත් කරන ලද “ඒකාධිපතියන්ගේ උපායමාර්ග පිළිබඳ අත්පොතේ” කොටසක් වන අතර එමඟින්, විශ්ලේෂණය කරන ලද හැසිරීම් පාරජාතික හා ක්‍රමානුබද්ධ මහා පරිමාණ දූෂණයෙන් ඉදිරියට යන ආකාරය සහ ප්‍රතිඵල වශයෙන් සිදුවන ආකාරය යන දෙකම අවධාරණය කරයි.

පහත වර්ගීකරණය මගින් දේශපාලන සහ නෛතික, ආර්ථික සහ මූල්‍ය, බලහත්කාරය සහ ප්‍රචණ්ඩත්වය පදනම් වූ හෝ සන්නාමකරණය සහ ආඛ්‍යානය පදනම් කරගත් හෝ යන චෞර පාලන ත්‍රාන්ත්‍රික ක්‍රමෝපායන් මෙන්ම ඒවායේ භූගෝලීය විෂය පථය මත පදනම්ව චෞර පාලන තන්ත්‍ර භාවිතයන් වර්ගීකරණය කෙරේ. මෙම ප්‍රවර්ග මගින් චෞර පාලන ත්‍රාන්ත්‍රික භාවිතයන්හි පූර්ණ පරාසය සහ ඒවා ඉටු කරන විවිධ අරමුණු මෙන්ම දූෂිත උපාය මාර්ග සැකසීම සඳහා ඒවා ඒකාබද්ධව භාවිතා කරනු ලබන ආකාරය අවධාරණය කෙරේ. වංචා කිරීම හෝ අනුග්‍රාහක ජාල භාවිතා කිරීම වැනි ඇතැම් චෞර පාලන ත්‍රාන්ත්‍රික භාවිතයන් හොඳින් ලේඛනගත කර ඇති අතර උපායමාර්ගික දූෂණය සහ කීර්ති නාම විශුද්ධිකරණය වැනි වෙනත් භාවිතයන් සඳහා අඩු අවධානයක් ලැබී ඇත - මේ දෙකටම හේතුව පාරජාතික දූෂණය පර්යේෂණ ක්ෂේත්‍රයක් ලෙස මතුවෙමින් පැවතීම සහ බොහෝ විට මෙම භාවිතයන්හි ලක්ෂණ විදහා දක්වන මුඛ්‍ය අංගයන් ඒකාබද්ධ වීමය. එහෙත් මෙම ක්‍රම චෞර පාලන ත්‍රාන්ත්‍රික ජාල ශක්තිමත් කිරීමට සහ ඒවායේ බලය සහ නීතිවිරෝධී අරමුදල් වෙත ප්‍රවේශය චිරස්ථායී කිරීමට තරම් ප්‍රබල වේ.

කිසියම් දේශයකට සීමා වූ සහ පාරජාතික චෞර පාලන ත්‍රාන්ත්‍රික භාවිතයන් අතර සංසන්දනය මගින්, ගෝලීය වේදිකාවේ යෙදෙන විට උපාය මාර්ග පරිණාමය වන ආකාරය නිදර්ශනය කෙරේ. නිදසුනක් වශයෙන්, උපායමාර්ගික දූෂණය යනු, ක්‍රියාවලියේදී චෞර පාලන තන්ත්‍රයේ ගොදුරු බවට පත්වන අය සංඛ්‍යාත්මකව ඉහළ දමමින්, ජාත්‍යන්තරව ප්‍රක්ෂේපණය කරන ලද අනුග්‍රහයේ සන්නද්ධ ආකාරයකි. ඒ හා සමානව, සමහර ක්‍රමෝපායන් විවිධ කාණ්ඩ අතර විහිදේ. නිදසුනක් වශයෙන්, සංවිධානාත්මක අපරාධ භාවිතය බලහත්කාරය සහ ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ සහ ආර්ථිකමය ස්වභාවයක් ගත්තකි. විශ්ලේෂණයේ අරමුණු සඳහා, අපි පහත ක්‍රමෝපායන් ඒවායේ වඩාත් කැපී පෙනෙන ලක්ෂණ මත පදනම්ව වර්ග කර ඇත.

එකට ගත් විට, මෙම වර්ගීකරණය මගින් ඉදිරිපත් කෙරෙන්නේ චෞර පාලන ත්‍රාන්ත්‍රික භාවිතයන් පිළිබඳ මේ දක්වා පැවති වඩාත්ම විස්තීර්ණ පරීක්ෂණයයි. විවිධ කාණ්ඩ යටතේ වන භාවිතයන් අතර සිදුවන ඡේදනය අවබෝධ කර ගැනීම, නීති සම්පාදකයින්, වෘත්තිකයන් සහ සිවිල් සමාජය දේශීය හා විදේශීය යන දෙඅංශයේම චෞර පාලන තන්ත්‍රය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වඩා හොඳින් ස්ථානගත කරනු ඇත.

| විෂයය පථය | දේශයකට සීමාවූ | පාරජාතික |
|---|---|---|
| දේශපාලනික සහ නෛතික | • ජාතික රාජ්‍ය නිලධාරීන්ට සහ පෞද්ගලික ක්‍රියාකාරීන්ට අල්ලස් ලබා දීම හරහා අනුග්‍රාහක ජාලයන් පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම<br>• කාර්යයන් අයථා ලෙස භාවිතා කිරීම<br>• මුදල් හෝ වෙනත් උපකාරවලට ප්‍රතිඋපකාර වශයෙන් සිය බලපෑම් යෙදවීම<br>• ප්‍රධාන ආයතන සිය සහයෝගයට යොදාගැනීම | • උපායමාර්ගික දූෂණය<br>• සතුරන්ට එරෙහිව නීතිය භාවිත කිරීම |
| ආර්ථික හා මූල්‍ය | • රාජ්‍ය නිලධාරියෙකු විසින් දේපළ වංචා කිරීම, අයථා ලෙස පරිහරණය කිරීම හෝ වෙනත් අතකට හැරවීම<br>• තනතුරු මිලදී ගැනීම | • වංචනික ජාත්‍යන්තර ප්‍රසම්පාදන හරහා විදේශීය රාජ්‍ය නිලධාරීන්ට සහ ජාත්‍යන්තර සංවිධානවල නිලධාරීන්ට අල්ලස් දීම<br>• මුදල් විශුද්ධිකරණය<br>• ආර්ථිකය ග්‍රහණය කර ගැනීම |
| බලහත්කාරය සහ ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ | • සුපරීක්ෂාව මර්දනය කිරීම සහ විරුද්ධ මතවාද නිහඬ කිරීම<br>• දූෂණය වටා සමාජ සම්මතයන් බලාත්මක කිරීම<br>• සංවිධානාත්මක අපරාධ<br>• යුක්තියට බාධා කිරීම<br>• බලෙන් ලබා ගැනීම | • පාරජාතික මර්දන ව්‍යාපාර |
| සන්නාමකරණය සහ ආඛ්‍යානය පදනම් කරගත් | • ප්‍රතිරූප කළමනාකරණය | • කීර්තිනාම විශුද්ධිකරණය<br>• සංවර්ධන ආඛ්‍යාන |

# දේශයකට සීමා වූ චෞර පාලන ත්‍රාන්ත්‍රික ක්‍රමෝපායන්

සමකාලීන චෞර පාලන තන්ත්‍රය එහි පාරජාතික ස්වභාවය සහ බදු ක්ෂේමස්ථාන හා මූල්‍ය මධ්‍යස්ථානවල වෘත්තීය අතරමැදියන් විසින් ඉටු කරනු ලබන ඒකාබද්ධ කාර්යභාරය මගින් අර්ථ දැක්විය හැකි නමුත් ප්‍රධාන පෙළේ දූෂණ කුටෝපායන් අනිවාර්යයෙන්ම ආරම්භ වන්නේ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ගේ උපන් රටෙහි නිශ්චිත අල්ලස් ගැනීම්, වංචා කිරීම් හෝ වෙනත් නීති විරෝධී ක්‍රියාකාරකම් සමඟ ය. පාරජාතික දූෂණයෙන් එල්ල වන අභියෝගයට එලදායි ලෙස මුහුණ දීම සඳහා වන ක්‍රමය වන්නේ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් තමන්ගේම

සමාජයන් තුළ එවැනි දූෂිත ක්‍රියාවන්හි යෙදීමට අවස්ථා පුළුල් කරගන්නා ආකාරය අවබෝධ කර ගැනීමයි.

සාමාන්‍යයෙන්, මෙම ක්‍රියාකාරකම්වල පරමාර්ථය වන්නේ තමන් ධනවත් වීම, අනුග්‍රාහක ජාල හරහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ගේ ප්‍රාදේශීය දේශපාලන තත්ත්වය ශක්තිමත් කිරීම හෝ සාමාන්‍යයෙන් එහි යම් සංයෝජනයක් හෝ වේ. මෙය කිසිසේත්ම පියවරෙන් පියවර සිදු කෙරෙන මාර්ගෝපදේශයක් නොවේ, මන්ද යත්, ඒකාධිපතිවාදී හෝ අධිකාරීවාදී නැඹුරුවක් ඇති පාලන තන්ත්‍රයන් විසින් විවිධ කාලවලදී සහ විවිධ ආකාරවලින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඔවුන්ගේ අද්විතීය තත්වයන් අනුව වෙනස් වන බැවිනි. කෙසේ වෙතත්, මෙම කොටස මගින් දූෂණ-විරෝධී වෘත්තිකයන්ට සහ ක්‍රියාකාරීන්ට මෙම ක්‍රමෝපායන් සමස්ත දූෂිත උපාය මාර්ගවලට ඒකාබද්ධ කෙරෙන ආකාරය තේරුම් ගැනීමට උපකාර කිරීම සඳහා දේශීයකරණය වූ චෞර පාලන ත්‍රාන්ත්‍රික උපක්‍රම නිර්වචනය කෙරේ.

## දේශපාලනික සහ නෛතික ක්‍රමෝපායන්

### ජාතික රාජ්‍ය නිලධාරීන්ට සහ පෞද්ගලික ක්‍රියාකාරීන්ට අල්ලස් ලබා දීම හරහා අනුග්‍රාහක ජාලයන් පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම

රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශය පාලනය කිරීම ඥාති සංග්‍රහය සහ ගජමිතුරුවාදය හරහා නොවරදවාම සාක්ෂාත් කරගනු ලබන අතර ධනවත් වීමට ඇති අවස්ථාවලින් අයුතු ප්‍රයෝජන ගනිමින් පාලන තන්ත්‍රයේ කැමැත්ත ක්‍රියාත්මක කළ හැකි වන බලගතු තනතුරුවල ආධාරකරුවන් ස්ථාපනය කරමින් මෙය සිදු කරනු ලබයි. මෙම පුද්ගලයින්, අනෙක් අතට, බොහෝ විට අධිකාරවාදී සමාජ පුරා විහිදී යන අනුග්‍රාහක ජාලවල මුදුනේ සිට, ඔවුන්ගේම සේවාදායක ජාලයන් මත විශ්වාසය තැබීම හා ඔවුන්ට ප්‍රතිලාභ ලබා දීම යන දෙකම සිදු කරති. පවුලේ සාමාජිකයන්, දේශපාලන හිතවතුන්, ව්‍යාපාරික සහකරුවන් සහ වෙනත් ආධාරකරුවන් ප්‍රධාන ආයතනවල හෝ තනතුරුවල ස්ථාපනය කිරීම වනාහී මුදල් හෝ වෙනත් උපකාරවලට ප්‍රතිඋපකාර වශයෙන් සිය බලපෑම් යෙදවීමේ එක් ආකාරයක් වන අතර එය චෞර පාලන ත්‍රාන්ත්‍රික ක්‍රමෝපායක් සහ පරමාර්ථයක් නිරූපණය කරයි.

දූෂිත අනුග්‍රාහක ජාලයන් බොහෝ විට වර්ධනය වී ඇත්තේ අඩු, නමුත් සැලකිය යුතු, ආදායම් මූලාශ්‍ර ඇති රටවල ආර්ථික අවස්ථා වෙත ප්‍රවේශය ලබාගැනීම සඳහා විවිධ කණ්ඩායම් අතර පවතින තරඟකාරීත්වය හේතුවෙන් ය: "සම්පත් ශාපය" කිසිදු ප්‍රතිපත්තියක් නොමැති දේශපාලන නායකයින්හට වාර්ගික, භූගෝලීය හෝ වෙනත් ආකාරයක හෝ වේවා විවිධ කණ්ඩායම් අතර පවතින ආතතිය ඔවුන්ගේ සහය තමන් වෙත ලබා ගැනීමේ අරමුණින් පහසුවෙන් උග්‍ර කිරීමට සහ ඉන් අයුතු ප්‍රයෝජන ගැනීමට හැකිය. මෙසේ ඔවුන් වෙතින් ලැබෙන සහයෝගය වෙනුවෙන් තමන් කැමති රජයේ රැකියා ලබා ගැනීමේ අවස්ථා, ප්‍රධාන ආර්ථික අංශ පාලනය කිරීම හෝ වෙනත් ලාභදායී ප්‍රතිඵලයක් මගින් ඔවුන්ට ප්‍රතිලාභ පිරිනමනු ලැබේ. මෙය ජනතාවගේ ප්‍රජා ප්‍රමුඛතා විකෘති කිරීමේ බලපෑමක් ඇති කරයි. මන්ද ඔවුන් ඡන්දය ප්‍රකාශ කරන්නේ (හෝ වෙනත් ආකාරයකින් සහය දක්වන්නේ) ඔවුන්ට ප්‍රතිලාභයක් ලබා දීමට බොහෝ දුරට ඉඩ ඇති බව පෙනෙන පාර්ශවයට වීම හේතුවෙනි.

අල්ලස් යනු චෞර පාලන තන්ත්‍රය සමඟ වඩාත්ම සමීප ලෙස සම්බන්ධ වූ දූෂිත ක්‍රියාවයි. රාජ්‍ය නිලධාරියෙකු තම නිල රාජකාරි ඉටුකිරීමේදී ක්‍රියා කිරීම හෝ ක්‍රියා කිරීමෙන් වැළකී සිටීම වෙනුවෙන් රාජ්‍ය නිලධාරියෙකුට (සාමාන්‍යයෙන් මූල්‍යමය, නමුත් සැමවිටම නොවේ) අනවශ්‍ය වාසියක් පිරිනැමීම, ලබා දීම, ඉල්ලීම හෝ පිළිගැනීම ඊට ඇතුළත් වේ. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ (UNCAC) නිර්වචනයට "ක්‍රියාකාරී" අල්ලස් (අල්ලස් දීම) සහ නොමඟ යවන ලෙස නම් කරන ලද "නිෂ්ක්‍රීය" අල්ලස් (අල්ලස් පිළිගැනීම) යන දෙකම ඇතුළත් බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන්හි, නීත්‍යානුකූලව අල්ලස් දිය හැක්කේ කාවෙතද ද යන ප්‍රශ්නය තරමක් සරල ය: ඒ රාජ්‍ය නිලතල දරන පුද්ගලයෙක්ද නොඑසේනම් රාජ්‍ය නිලතල නොදරන පුද්ගලයෙක්ද යන්නය. පාලක පවුල් සහ ඔවුන්ගේ ආශ්‍රිතයන් නිල නොවන පදනමක් මත ආරූඪ පොදු කාර්යයන් ඉටු කළ හැකි අධිකාරීවාදී සමාජවල, විශේෂයෙන් පුද්ගලවාදී පාලන තන්ත්‍රවල මෙම වෙනස බොහෝ විට පැහැදිලි නැත. උස්බෙකිස්තානයේ හිටපු පාලකයාගේ දියණිය වන ගුල්නාරා කරිමෝවා, නිශ්චිත වශයෙන්ම කිවහොත්, රාජ්‍ය නිලධාරිනියක නොවන බැවින් ඈ වෙත නීත්‍යානුකූලව අල්ලස් ලබාදිය නොහැකි බව ස්වීඩන් අධිකරණයක් පසුගියදා තීන්දු කළේය. කෙසේ වෙතත්, කරිමෝවා නිසැකවම උස්බෙකිස්තානයේ වඩාත්ම බලගතු පුද්ගලයන්ගෙන් කෙනෙක් වූ අතර, ඉස්ලාම් කරිමොව්ගේ එවකට උරුමක්කාරයා ලෙස දැවැන්ත දේශපාලන බලපෑමක් ඈ ඇති කර ඇති අතර රටේ සමස්ත විදුලි සංදේශ ක්ෂේත්‍රය ඇතුළුව විශාල වාණිජ අවශ්‍යතා පාලනය කරන බවට චෝදනාවක්ද ඇයට විය. උස්බෙකිස්තානයේ ව්‍යාපාර කිරීමට බලාපොරොත්තු වන විදේශීය සමාගම්වලින් ඩොලර් මිලියන සිය ගණනක අල්ලස් ලබා ගැනීමට ඇය මෙම පාලන තනතුර භාවිතා කළ බවට චෝදනා එල්ල විය.

චෞර පාලන ත්‍රාන්ත්‍රික අනුග්‍රාහක ජාලයන්හි අනෙක් කැපී පෙනෙන ලක්ෂණය වන්නේ රාජ්‍ය, පෞද්ගලික සහ අපරාධ අංශ අතර රේඛා බොඳ කිරීමට ඇති ප්‍රවණතාවයයි. සැලකිය යුතු ස්ථාවරයක් ඇති චෞර පාලන ත්‍රාන්ත්‍රිකයෙකු හට එකවරම ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙකු, රාජ්‍ය අනුග්‍රහය ලබන ව්‍යාපාරයක ප්‍රධාන කොටස් හිමියෙකු සහ සංවිධානාත්මක අපරාධ ප්‍රධානයෙකු වීම සම්පූර්ණයෙන්ම කළ හැකි දෙයකි - ඇත්තෙන්ම එය සාමාන්‍ය දෙයකි. එසේ පිළිබිඹු වන්නේ ඔවුන්ට ප්‍රමුඛත්වයට පත්වීමට උපකාර කළ මෙන්ම එහි ප්‍රතිලාභවල තමාගේ කොටස අපේක්ෂා කරන්නාවූද බොහෝ කණ්ඩායම්ය. පුද්ගලික අංශය තුළ සිදුවන දූෂණය, ආර්ථික ක්‍රියාකාරකම්වලට හානි කරන විට, තරඟකාරීත්වය හා වෙළඳපොළ දිරිගැන්වීම්වලට පීඩා පමුණුවන විට සහ රජයන්ට බදු ආදායම අහිමි කරන විට, රාජ්‍ය නිලධාරීන් විසින් අයුතු ලාභ ප්‍රයෝජන සලසා ගැනීම හා සමානවම පීඩාකර හා හානිකර විය හැකිය.

අප චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් දූෂිත රාජ්‍ය නිලධාරීන් ලෙස හුවා දැක්වීමට නැඹුරු වන අතරම, නීතියේ ආධිපත්‍යය දුර්වල සමාජයන්හි රාජ්‍ය සහ පෞද්ගලික අංශය අතර වෙනස බොහෝ විට බොඳ වී හෝ නොපවතින බව මතක තබා ගැනීම වටී. සම්බන්ධතා ගැටුම් ඇතිවීමට තුඩු දෙමින් නිලධාරීන් සැලකිය යුතු පුද්ගලික වත්කම් සහ ආයෝජන පවත්වා ගෙන යාම හෝ අනෙක් අතට, බලවත් ව්‍යාපාරික පුද්ගලයින් දේශපාලන ක්ෂේත්‍රය තුළ අනිසි බලපෑම් කිරීම දුර්ලභ දෙයක් නොවේ.

## ප්‍රධාන ආයතන සිය සහයෝගයට යොදා ගැනීම

අධිකාරිවාදී පාලන තන්ත්‍රවල නැඟී සිටීම, පැවතීම සහ වැටීම රඳා පවතින්නේ ප්‍රධාන රාජ්‍ය ආයතන අත්පත් කර ගැනීමට සහ ඒවායේ පාලනය රඳවා ගැනීමට ඔවුන්ට ඇති හැකියාව මත ය. එසේ කිරීම තුළ දූෂිත ක්‍රියාවන්හි යෙදීම සඳහා පවතින ඔවුන්ගේ ප්‍රවණතාවය සහ ධාරිතාව කෙරෙහි වැදගත් ඇඟවුම් ද පවතී. සඳහන් කළ පරිදි, දේශපාලන බලය සහ පුද්ගලික වාසි සඳහා ආයතන අවභාවිතා කිරීම බොහෝ විට අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිය වැඩි කරගැනීමක් වේ.

පැහැදිලිවම, ආරක්ෂක සේවා සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන පාලනය කිරීම මගින් දේශපාලන බලහත්කාරකම් සඳහා මාධ්‍යයන් සැපයෙනවා පමණක් නොව, දූෂණ චෝදනා කිසි විටෙකත් විමර්ශනය නොකෙරෙන බවට සහතිකයක්ද ලැබේ. බලයේ සිටින අයට මෙම මූලධර්මයේ වැදගත්කම පිළිබඳ සිත්ගන්නා සුළු නිදර්ශනයක් බ්‍රසීලයේ ජනාධිපති ජායිර් බොල්සොනාරෝ තම පුතුන්ට එරෙහි දූෂණ චෝදනා විමර්ශනයට බලපෑම් කිරීම සඳහා ඔහුට ඇති සීමිත හැකියාව අනාවරණය කරගත් අවස්ථාවේ දැක්වූ පුදුමය දනවන සුළු හැසිරීමෙන් ඉදිරිපත් වේ: "යමෙකුට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියා වෙනස් කළ නොහැකි නම්, ඔහුගේ ප්‍රධානියා වෙනස් කරයි. ඔහුගේ ප්‍රධානියාත් වෙනස් කළ නොහැකි නම්, ඊළඟට වෙනස් කරන්නේ ඇමතිවරයාය."

ව්‍යවස්ථාදායක ශාඛාව මත සහ ඒ හරහා බලපෑම යෙදවීමේ ප්‍රතිලාභ ඒ හා සමානවම පැහැදිලිය. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්හට ඔවුන්ගේ දූෂිත ක්‍රියාකාරකම්වලට හිතකර නීති හඳුන්වා දීමට හෝ අවම වශයෙන් ඔවුන්ගේ අවශ්‍යතාවලට තර්ජනයක් වන නීති දුර්වල කිරීමට උත්සාහ කිරීමට හෝ හැකියාව පවතී. ඇත්ත වශයෙන්ම, මෙය කළ හැකි මට්ටම ඒ ඒ වාතාවරණයන් අනුව වෙනස් වේ. මහජන චීන සමූහාණ්ඩුව වැනි අධිකාරවාදී ඒක-පක්ෂ ක්‍රමයක් තුළ ජාතික මහජන කොංග්‍රසය පවතින්නේ මූලික වශයෙන් කොමියුනිස්ට් පක්ෂයේ කැමැත්ත සඳහා අවිචාරවත්ව අනුමැතිය දීම සඳහා ය. යුක්රේනය වැනි අවදානමට ලක්විය හැකි ප්‍රජාතන්ත්‍රවාදී රටක් තුළ, එයට ප්‍රතිවිරුද්ධ අන්දමින්, රාඩා යනු ප්‍රතිසංස්කරනවලට කැමැත්තක් දක්වන දේශපාලනඥයන් සහ කතිපයාධිකාරීන් විසින් ප්‍රගතිය අඩාල කිරීම සඳහා නිලයන්හි පිහිටුවන ලද පුද්ගලයින් අතර පවතින නිරන්තර අරගලයේ කේන්ද්‍රීය වේදිකාවයි.

චෞර පාලන තන්ත්‍රය සක්‍රිය කිරීමේ දෘෂ්ටි කෝණයෙන් බලන කල, අධිකරණවල නාමික ස්වාධීනත්වය සහ ඒවා විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යභාරය හේතුවෙන් බලපෑම් කිරීම වඩාත්ම දුෂ්කර හා වැදගත් වන ආයතන අතරට ඒවා පත්විය හැකිය. අවනත විනිසුරුවරයෙකුට, පාලන තන්ත්‍රයේ හැසිරීම සඳහා පවතින නීතිමය අභියෝග ප්‍රතික්ෂේප කිරීමට හැකි වනවා පමණක් නොව, එම පාලන තන්ත්‍රයේ විරුද්ධවාදීන්ට එරෙහිව අපරාධ සහ සිවිල් නඩු තීන්දු නිකුත් කිරීමට ද එවන් විනිසුරුවරයෙකු යොදා ගත හැකිය. මේ දෙකම එවැනි ක්‍රියාවන් සඳහා නීත්‍යානුකූලභාවයේ මවාපෑමක් සපයන අතර අනෙකුත් අධිකරණයන් විසින් පිළිගෙන බලාත්මක කළ හැකි නෛතික තීන්දු වීමේ වාසිය එයට ඇත්තේ, පාලන තන්ත්‍රයට තම විරුද්ධවාදීන් එතෙරදීත් ලුහුබැඳීමට ඉඩ සලසමිනි.

මාධ්‍ය පාලනය කිරීමට හෝ බිය ගැන්වීමට ඇති හැකියාවද, චෞර පාලන තන්ත්‍රය සඳහා ඇති අවස්ථා පුළුල් කිරීමේ තීරණාත්මක මූලිකාංගයක් වන අතර, එය තවදුරටත් පහත සාකච්ඡා කෙරේ.

මූල්‍ය ආයතනවලට බලපෑම් කිරීම යනු, දේශපාලනික පාලන බලය වැඩි කිරීමේ උත්සාහයන් සමඟ සමපාත විය හැකි හෝ නොවිය හැකි එක් අංශයකි. ක්‍රමානුබද්ධ දූෂණයෙන් පෙළෙන රටවල, ඔබට බැංකුවක් මිලදී ගැනීමට හෝ එහි පාලනය බලෙන් පැහැරගෙන එය පුද්ගලික ඉතුරුම් කැටය ලෙස භාවිතා කළ හැකිව තිබියදී බැංකුවකින් සොරකම් කිරීමට අවශ්‍ය වන්නේ නැත. මෙය වනාහී, නිදසුනක් වශයෙන් ව්ලැඩිමීර් පුටින්ගේ අභ්‍යන්තර කවය සහ එක්සත් ජනපදය විසින් සම්බාධක පනවන ලද Bank Rossiya අතර තිබෙන බවට පැවසෙන සම්බන්ධය වේ.

මෙම ප්‍රවණතාව තුළ නිමක් නොමැතිව දිගටම යෙදී සිටීමට සම්පූර්ණයෙන්ම හැකියාව පවතිනු ද ඇත. නිදසුනක් වශයෙන්, විශ්ව විද්‍යාලවල අධ්‍යයන ස්වාධීනත්වයට පහර දීම බොහෝ විට දේශපාලන විරුද්ධත්වයක් වන නමුත් දිගු කාලීනව එය දූෂණය දැකීමට හෝ එයට විරෝධය දැක්වීමට ඇති ඉඩකඩ අඩු විමසුම් මානසිකත්වය අඩු පිරිසක් බිහි කිරීමටද හේතු වේ. වැදගත් කරුණ නම්, ප්‍රධාන පෙළේ ආයතන පාලනය කිරීම දේශපාලනික පාලනයට සහ දූෂිත ක්‍රියාවන්ට අවස්ථා නිර්මාණය කරනවා පමණක් නොව, ඒවා අතර අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් වීමට තුඩු දෙන සබඳතාව ශක්තිමත් කිරීම ද සිදු වීමයි.

## කාර්යයන් අයථා ලෙස භාවිතා කිරීම

මෙය රාජ්‍ය නිලධාරීන් තමන්ට හෝ අන් අයට යම් වාසියක් ලබා ගැනීම සඳහා නීතිය කඩ කරමින් - හුදෙක් ඔවුන්ගේ බලපෑම යන කාරණයට ප්‍රතිවිරුද්ධව - සෘජුවම තම බලතල භාවිතා කිරීම සහ අයථා අන්දමින් භාවිතා කිරීම ඇතුළත් වන පුළුල් කාණ්ඩයකි. මුදල් හෝ වෙනත් උපකාරවලට ප්‍රතිඋපකාර වශයෙන් සිය බලපෑම් යෙදවීමේදී මෙන්ම, කාර්යයන් අයථා අන්දමින් භාවිතා කිරීම යනු, හුදෙක් තමන්ට ගැලපෙන විට නීතියේ ආධිපත්‍යය නොසලකා සිටින බොහෝ අධිකාරීවාදී පාලන තන්ත්‍රවල පාලන ආකෘතියේ කොටසකි. රුසියාවේ ඇලෙක්සි නවාල්නි සහ තවත් දහස් ගණන් දූෂණ විරෝධී ක්‍රියාකාරීන් මෑතක දී අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම, ඔවුන්ට නඩු පැවරීම සහ සිරගත කිරීම වනාහී, දූෂිත පාලකයන්ගේ දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍යයේ ලීවර විකෘති කළ හැකි ආකාරය පිළිබඳ හොඳ උදාහරණයකි. කෙසේ වෙතත්, තවදුරටත් පහත සාකච්ඡා කර ඇති පරිදි, නීති විරෝධී ක්‍රියාකාරකම් වසන් කිරීම හෝ නීත්‍යානුකූල කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවල ව්‍යාජ හොඳ පෙනුම පවත්වා ගැනීමට පාලන තන්ත්‍රයන් බොහෝ විට කැමැත්තක් දක්වයි.

### මුදල් හෝ වෙනත් උපකාරවලට ප්‍රතිඋපකාර වශයෙන් සිය බලපෑම් යෙදවීම

මෙයට රාජ්‍ය නිලධාරීන් පමණක් නොව ඕනෑම ප්‍රමුඛ පෙළේ පුද්ගලයෙක් තමන්ට හෝ අනුන්ට ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා තම තනතුරෙන් ලැබෙන බලපෑම් අනිසි ලෙස භාවිතා කිරීම ඇතුළත් වේ. එය බොහෝ විට, අල්ලසක ප්‍රතිඵලය ලෙස සිදු කෙරෙන්නක් වන නමුත් සෑම විටම එසේ නොවේ. මුදල් හෝ වෙනත් උපකාරවලට ප්‍රතිඋපකාර වශයෙන් සිය බලපෑම් යෙදවීම යනු චෞර පාලන ත්‍රාන්ත්‍රික පාලන තන්ත්‍රවල පාලනයේ ස්ථාවර ලක්ෂණයක් වන අතර එවන් පාලනයක් තුළ දේශපාලන හෝ නීතිමය තීරණ මගින් චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ගේ පුද්ගලික අභිලාෂ ආරක්ෂා කෙරෙන බව සහතික කිරීම සඳහා හෝ ඔවුන්ගේ පවුල්, ආශ්‍රිතයන්, ඥාති කණ්ඩායම් හෝ ඔවුන්ගේ අනුග්‍රාහක ජාලයේ අනෙකුත් සාමාජිකයින්ට ප්‍රතිලාභ ලබා දීම සඳහා හෝ රාජ්‍ය නිලතලවලින් අයුතු ප්‍රයෝජන ගැනීම නිත්‍ය පිළිවෙතක් ලෙස සිදු කෙරේ. විශේෂයෙන්ම නීත්‍යානුකූල පෙලඹවීම් සිදු කිරීමේ ක්‍රියාකාරකම් පාලනය කරන නීති මනා සේ අර්ථ දක්වා නොමැති ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තුළ එය දේශපාලන දූෂණයේ වඩාත් සුලභ ආකාරයක් ද වේ.

## ආර්ථික සහ මූල්‍ය ක්‍රමෝපායන්

### රාජ්‍ය නිලධාරියෙකු විසින් දේපළ වංචා කිරීම, අයථා ලෙස පරිහරණය කිරීම හෝ වෙනත් අතකට හැරවීම

අල්ලස් ගැනීමත් සමඟම, වංචා කිරීම යනු චෞර පාලන තන්ත්‍රය සමඟ වඩාත් සමීපව සම්බන්ධ වූ ක්‍රියාවයි. අරමුදල් හෝ රාජ්‍ය නිලධාරියාට ඔහුගේ තනතුර හේතුවෙන් පැවරී ඇති වෙනත් වටිනාකමක් ඇති යමක් හෝ අයථා ලෙස පරිහරණය කිරීම හෝ අන් අතකට හැරවීම එයට ඇතුළත් වේ.

ඩොලර් මිලියන ගණන් සම්බන්ධ අල්ලස් ගැනීමේ සිද්ධි දුර්ලභ දෙයක් නොවන අතරම, මෑත කාලීන වංචා සිද්ධි කිහිපයකට අදාළ වී ඇත්තේ ඩොලර් බිලියන ගණන් සොරකම් කිරීමකි. විශේෂයෙන්ම, අපකීර්තිමත් 2015 1MDB සිද්ධියට අදාළ වූයේ එවකට අගමැති රජිබ් නසාක් හා සම්බන්ධ කුමන්ත්‍රණයකින් මැලේසියාවේ ජාතික සංවර්ධන අරමුදලෙන් ඩොලර් බිලියන 4.5ක් ඇද ගත් බවට පැවසෙන සිදුවීමකි. වඩාත් මෑතක දී, එක්සත් ජනපද නීතිය බලාත්මක කිරීම මගින් යුක්රේන කතිපයාධිකාරී Ihor Kolomoisky හට, යුක්රේනයේ විශාලතම බැංකුව වන PrivatBank හි ප්‍රධාන කොටස් හිමියෙකු ලෙස ඔහුගේ තනතුර අයථා ලෙස භාවිතා කරමින් ඩොලර් බිලියන 5.5 ක වංචනික ණය ලබා ගත් බවට චෝදනා එල්ල කරන ලදී. මෙම අරමුදල් PrivatBank හි සයිප්‍රස් ශාඛාව හරහා එක්සත් ජනපදය පුරා පවතින වාණිජ නිශ්චල දේපළ ඇතුළුව ලොව පුරා වත්කම් සහ ආයෝජන වෙතට යොමු කරන ලද බවට වාර්තා විය. මෙතරම් මහා පරිමාණයෙන් වංචා කිරීමත් සමඟ, එදා මෙදා තුර සිදු වූ විශාලතම මුදල් විශුද්ධිකරණ සිද්ධිය බවට මෙය පත්විය හැකි අතර එම සිද්ධිය Kolomoisky විසින් තරයේ ප්‍රතික්ෂේප කරනු ලබයි.

චෞර පාලන ත්‍රාන්ත්‍රිකයෝ නීත්‍යානුකූල නොවන අයුරින් අරමුදල් අන් අතකට හැරවීමේ සිය කටයුතු ජාතික සම්පත් වෙත සීමා නොකරති. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් බොහෝ විට ජාත්‍යන්තර මානුෂීය හෝ සංවර්ධන අරමුදල් යොදවා තම බලය තහවුරු කර ගනිති. ඒ, ව්‍යාපෘතිවලදී අයුතු ලාභ සලසා දීම නිසා ලබන දීමනා හරහා වන අතර පසුව ඒවා විධාන දාමයේ ඉහළට සහ පහළට ගලා යයි. ඇෆ්ගනිස්ථානයේ දී, ඇෆ්ගනිස්ථාන ජනතාවට ආධාර කිරීම අරමුණු කරගත් ඩොලර් මිලියන ගණන් සෑම තරාතිරමකම ඇෆ්ගනිස්ථාන රජයේ නිලධාරීන්ගේ සාක්කුවලට ගොස් කෙළවර විය. එක්සත් ජනපද ආණ්ඩුව එහි බහු-බිලියන ආධාර මගින් පෝෂණය වූ චෞර පාලන තන්ත්‍රයන් විශාල වශයෙන් [නොතකා හැර සිටියේ](), භූ දේශපාලනික සහ ස්ථාවරත්වය පිළිබඳ සලකා බැලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම හේතුවෙනි. විදේශ ආධාර බහුල ලෙස රට තුළට ගැලීමට සැලැස්වීමේ ප්‍රතිඵලයක් ලෙස, ඇෆ්ගනිස්ථානයේ චෞර පාලන ත්‍රාන්ත්‍රික ගතිකත්වයන් අනවශ්‍ය ලෙස මුල් බැස ගැනීම මගින් නිරූපණය කෙරෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කිරීමට ක්‍රියා කිරීම හා සමගාමීව බටහිර රටවල් දූෂණයට ඉඩ සලසන විවිධ ආකාරයන් වේ.

### තනතුරු මිලදී ගැනීම

රුසියාව, යුක්රේනය සහ ජෝර්ජියාව වැනි පශ්චාත්-සෝවියට් සමූහාණ්ඩුවට අයත් රටවල් ඇතුළුව දේශපාලන සංක්‍රාන්තිවලට භාජනය වන බොහෝ රටවල රජයේ අමාත්‍යාංශවල හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල තනතුරු මිලදී ගැනීමට ඇති අතර, ඒ, බොහෝ විට පිරමීඩ යෝජනා ක්‍රමවලට සමාන සැලසුම් කළ පද්ධති හරහාය. අල්ලස් දීම හරහා මෙම තනතුරුවලින් එකකට පත්වීම හුදෙක් තත්ත්වය සඳහා සිදු කරන්නක් නොවේ; තනතුරක් මිලදී ගැනීම බොහෝ විට මූල්‍ය ආයෝජනයක් ලෙස ක්‍රියා කරයි, මන්ද, එය ලබා ගන්නා පුද්ගලයාට පුරවැසියන්ගෙන් අල්ලස් ලබා ගැනීමෙන්, වෙනත් තනතුරු විකිණීමෙන් සහ සංවිධානාත්මක අපරාධවලට අනුබල දීමෙන් තම ආදායමට අතිරේක වශයෙන් ආදායම් ලබා ගත හැකි බැවිනි.

උදාහරණයක් ලෙස, [රුසියානු අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය]() විසින් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්හට උසස් තනතුරු විකුණා ඇත. 2007 වසරේදී ජෙනරාල්වරයෙකු දක්වා උසස් කිරීමේ මිල ඩොලර් 200,000 ක් ලෙස සොයා ගැනීමේ සිද්ධිය එයට ඇතුළත් වේ. මෙම විකිණීම සිදු කළ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ට පමණක් නොව, තනතුර මිලදී ගන්නා පුද්ගලයාටද වාසිදායක භාවිතයක් මෙමගින් නිරූපණය වේ. මන්දයත්, අවසානයේ එම ඩොලර් 200,000ක මුදල අල්ලස් ලබා ගැනීම, බලහත්කාරයෙන් හමුදා සේවයට බඳවාගත් පහළ මට්ටමේ අයවලුන් ව්‍යාපාරිකයන් විසින් කම්කරුවන් ලෙස භාවිතා කරනු ලැබීම සඳහා කුලියට දීම හෝ සංවිධානාත්මක අපරාධවලට සහභාගී වීම වැනි වෙනම දූෂිත කුමන්ත්‍රණයන් හරහා ආපසු ලබා ගැනීම සහ එයට අතිරේකව උපයා ගැනීම සිදු වනු ඇති බැවිනි. පහළ මට්ටමේ තනතුරු ද විකුණා ඇත; උතුරු කොකේසස් සහ ඩැගෙස්තානයේ පොලිස් නිලධාරියෙකු වීමේ පිරිවැය වර්ෂ 2000 ගණන්වල ඩොලර් 1,000 සිට ඩොලර් 3,000 දක්වා වූ අතර රථවාහන-පොලිස් නිලධාරී තනතුරු ඩොලර් 7,000 ක් වැනි ඉහළ මුදලකට අලෙවි විය. එම කාලයේදී, සමීක්ෂණයට ලක් කළ නිලධාරීන්ගෙන් සියයට 37 ක් තම තනතුරු සඳහා අල්ලස් ලබා දුන් බව වාර්තා කළහ.

යුක්රේනයේ, නිදහස වෙත සංක්‍රමණය වන කාලය තුළදී රජයේ විධායක ශාඛාවේ තනතුරු මිලදී ගැනීම සහ විකිණීම සාපේක්ෂව නිතර සිදු විය. ජෝර්ජියාවේ සහ ආර්මේනියාවේ, සෑම අමාත්‍යාංශයකම ඉහළ මට්ටමේ නිලධාරීන් යටත් නිලධාරීන්ට තනතුරු විකුණනු ඇත. අනෙක් අතට, මෙම නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් හෝ රජයේ නිලධාරීන් තමන් වෙනුවෙන් පුද්ගලික ධනය උපයා ගත් අතර, ඔවුන්ගේ නීති විරෝධී අරමුදල්වලින් කොටසක් තම ප්‍රධානීන් වෙත ද ආපසු පිරිනැමූහ. මේ අයුරින් රජයේ ඉහළම නිලයන් ඔස්සේ ව්‍යාප්ත වූ පිරමිඩ ව්‍යුහයක් නිර්මාණය විය. පසු වසරවලදී, ඉහළ මට්ටමේ නිලධාරීන් ඔවුන් වෙත පක්ෂපාතිත්වය පවත්වා ගැනීම සඳහා යටත් නිලධාරීන් සමඟ ඔවුන්ගේ ලාභ බෙදාගත් බැවින්, ධනයේ ගලා යාම ආපසු හැරවිණි.

ඇතැම් විට මෙම සංසිද්ධිය වඩාත් පුළුල් ලෙස වාර්තා වී ඇත්තේ පශ්චාත්-සෝවියට් කලාපය තුළින් වුවත් නිල තනතුරු මිලදී ගැනීම සහ විකිණීම එම කලාපයට පමණක් ආවේණික වූවක් නොවේ. චීනයේ මහජන විමුක්ති හමුදාවේ මෙන්ම ඉන්දුනීසියානු ප්‍රාදේශීය කාර්යාලවලද තනතුරු විකිණීම වාර්තා වී ඇත්තේ ඕනෑම රටක්, විශේෂයෙන් දේශපාලන සංක්‍රාන්තියකින් පසුව, තනතුරු මිලදී ගැනීමට සහ විකිණීමට ගොදුරු වන ආකාරය පෙන්නුම් කරමිනි. මෙම කූටෝපායන් රජයේ ඉහළම මට්ටම් කරා යන විට, මෙම භාවිතයන් පද්ධතියේ පදනම පුළුල් කිරීමේ ප්‍රධාන චෞර පාලන ත්‍රාන්ත්‍රික උපක්‍රම බවට පත්විය හැකිය.

## බලහත්කාරය සහ ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ ක්‍රමෝපායන්

### සුපරීක්ෂාව මර්දනය කිරීම සහ විරුද්ධ මතවාද නිහඬ කිරීම

ප්‍රජාතන්ත්‍රවාදී සහ අධිකාරවාදී පාලන තන්ත්‍රවල එකසේ, දූෂණය යනු දේශපාලන නායකයින්ට සහ ඔවුන්ගේ සහචරයන්ට එල්ල විය හැකි භයානකම චෝදනාවකි. ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වූ දේශපාලකයෙකුගේ වෘත්තීය ජීවිතය අවසන් කළ හැකි ආකාරයේ අපකීර්තියක්, ඔවුන් පෙරලා දැමීමට තරම් නොව, ඔවුන්ගේ හැසිරීම් වාරණය කිරීමටවත් කිසිදු ක්‍රමයක් නොමැති ජනගහනයක් සිටින, තේරී පත් නොවූ පාලකයින්ට පැවැත්මේ තර්ජනයක් බවට පත්වීමේ හැකියාව ඇත චෞර පාලන ත්‍රාන්ත්‍රික පාලන තන්ත්‍රයන් ඔවුන්ගේ දූෂිත ක්‍රියාකාරකම් සුපරීක්ෂාවට ලක්කිරීම මර්දනය කර දැමීමට සහ වාරණය නොකළ මූලාශ්‍රවලින් ජනගහනයට ලැබෙන තොරතුරු වෙතොත් ඒවා පාලනය කිරීමට සැලකිය යුතු ශක්තියක් සහ සම්පත් කැප කරන්නේ මේ හේතුව නිසා ය.

මෙම මර්දනය සාමාන්‍යයෙන් අදහස් ප්‍රකාශකිරීමේ නිදහසට, විශේෂයෙන්ම ස්වාධීන මාධ්‍යවලට සහ දූෂණ විමර්ශනයට කැපවී සිටින සිවිල් සමාජ සංවිධානවලට එරෙහිව වඩ වඩාත් බරපතල ප්‍රහාර එල්ල කිරීමෙන් සිදු කෙරේ. දේශපාලන පරිමාණයේ ඒකාධිපති අන්තය කරා ගමන් කරන පාලන තන්ත්‍රයන් තුළ, මෙම සංවිධාන කවදා හෝ පැවතුනේ නම්, හුදෙක් ඒවා නවතා දමනු ලැබේ. පාලන තන්ත්‍රයට එසේ කිරීමට තාක්ෂණික ධාරිතාව සහ සම්පත් තිබේ නම්, බාහිර මූලාශ්‍රවලින් වාරණය නොකළ ප්‍රවෘත්ති ලැබීම වැළැක්වීම සඳහා අන්තර්ජාල ප්‍රවේශය පාලන කිරීම් මෙයත් සමග සිදු කළ හැකිය. චීන කොමියුනිස්ට් පක්ෂයේ "ග්‍රේට් ෆයර්වෝල්" හෙවත් මහා අග්නි ප්‍රාකාරය මේ සඳහා පරම උදාහරණය වන නමුත් මෙම ක්‍රමෝපාය වඩ වඩාත් ප්‍රචලිත වෙමින් පවතී. මියන්මාරයේ මෑත කාලීන හමුදා කුමන්ත්‍රණයෙන් පසුව, අන්තර්ජාල සේවා නවතා දැමීම් සඳහා පහසුකම් සලසන ප්‍රධාන පෙළේ විදුලි සංදේශ සමාගමකට ජෙනරාල්වරයෙකුගේ දියණිය සම්බන්ධ වී සිටිනවා පමණක් නොව, පුලුල් ලෙස සිදුවන මර්දනය මගින් විදහා පාන්නේ නීත්‍යානුකූල නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා යැයි පිටට පෙන්වමින් ආනයනය කරන ලද ද්විත්ව භාවිත තාක්ෂණයන් දත්ත අවහිර කිරීම, අවේක්ෂණය සහ අනෙකුත් ඩිජිටල් මර්දනයන් සඳහා අධිකාරවාදී පාලන තන්ත්‍රයන්ට භාවිතා කළ හැකි වන ආකාරයයි.

අවදානමට ලක්විය හැකි ප්‍රජාතන්ත්‍රවාදී රටවල හෝ වඩාත් දුර්වල අධිකාරවාදී පාලන තන්ත්‍රවල සිටින දූෂිත ප්‍රභූන්ට වඩාත් ප්‍රවේශමෙන් කටයුතු කිරීමට අවශ්‍ය විය හැකිය. සාමාන්‍යයෙන් මේ සඳහා සිදු කෙරෙන්නේ ඇතැම් විෂයයන් සාකච්ඡාවට බඳුන් නොවී පවතින තාක් කල් යම් මට්ටමක ස්වාධීනත්වයක් ඉවසා සිටින අතරම වාසිදායක කතාන්දර ඉදිරියට ගෙන එන රාජ්‍ය පාලිත මාධ්‍ය වෙළඳපොළ තුළ දසත පතුරුවා දැමීමයි. එවැනි තත්ත්වයන් තුළ දූෂණ හෙළිදරව් කිරීමට කටයුතු කරන මාධ්‍යවේදීන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් බොහෝ විට සංකීර්ණ, බලාපොරොත්තු සුන් කරවන සහ භයානක බාධාවන් වලට මුහුණ දෙන්නේ දූෂිත නිලධාරීන් විසින් ඔවුන්ගේ විමර්ශන වැළැක්වීමට සහ යටපත් කිරීමට උත්සාහ දරනු ලබන බැවිනි.

විමර්ශන කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය වඩාත් ප්‍රයෝජනවත් ආකාරයේ තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා පවතින සීමාවන් වනාහී නිතර මුහුණ දීමට සිදුවන ගැටලුවකි. උදාහරණයක් ලෙස, ස්වායත්ත රජයක් ලෙස බාහිරට පෙනෙන හොංකොං රජය මෑතකදී සමාගම් සහ නිශ්චල දේපළවල අයිතිය සම්බන්ධයෙන් පවතින නිල ලේඛන වෙතට ප්‍රවේශය සීමා කිරීම සඳහා පියවර ගත්තේය. මෙය හොංකොං හි කුප්‍රකට ෂෙල් සමාගම් (සැලකිය යුතු මෙහෙයුම් කටයුතු හෝ අදාළ වත්කම් යනාදියද රහිතව භෞතික පැවැත්මක්ද නොමැතිව සංස්ථාපිත සමාගම්) තුළ සැරිසැරීම සහ චීන කොමියුනිස්ට් පක්ෂ ප්‍රභූන්ගේ සැඟවුණු ධනය හෙළිදරව් කිරීම සැලකිය යුතු ලෙස දුෂ්කර කරනු ඇතැයි විවේචකයෝ තර්ක කරති.

ඉහත සඳහන් කළ පරිදි, දූෂණය හෙළිදරව් කිරීමේ යෙදී සිටින පුද්ගලයින් මුහුණ දෙන වඩාත්ම පොදු බාධාව විය හැක්කේ පීඩාකාරී නීතිමය ක්‍රියාමාර්ගවල තර්ජනයයි. බිය ගැන්වීම් හෝ ප්‍රචණ්ඩත්වය දේශීය වශයෙන් අවාසිදායක ප්‍රතික්‍රියාවක් හෝ ජාත්‍යන්තර මට්ටමෙන් හෙලාදැකීමක් ඇති කළ හැකි විට, ඔවුන් වෙනුවෙන් ඔවුන්ගේ අපිරිසිදු වැඩ කිරීම සඳහා අධිකාරවාදී පාලකයයින් අනිවාර්යයෙන්ම යොමුවන්නේ පීඩාකාරී නීති වෙත හා ඔවුන් විසින් ඔවුන්ගේ සහයෝගයට යොදාගනු ලැබූ විනිසුරුවරුන් වෙතයි. නිදසුනක් වශයෙන්, බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී රටවල අපහාස කිරීම යනු සිවිල් කාරණයකි. එනමුත් අධිකාරවාදී සමාජවල, තවමත් නිතරම එය කාලයක් සිරගත කිරීම ඇතුළු අපරාධ දඬුවම් දිය හැකි කාරණයකි. පර්යේෂකයා මහජන ජීවිතයෙන්

ඉවත් කිරීම සමගම පර්යේෂණ අපකීර්තියට පත් කිරීමේ අරමුණක් මෙය ඉටු කරයි. ලොව පුරා සිටින සියගණනක් අතර වත්මන් එක් උදාහරණයක් පමණක් තෝරා ගතහොත්, ඇන්ගෝලියානු ක්‍රියාකාරිකයෙකු වන රෆායෙල් මාර්කේස් ඩි මොරායිස් ඔහුගේ දූෂණ විරෝධී විමර්ශනවලදී රටේ දේශපාලන ප්‍රභූ පැලැන්තියේ සාමාජිකයන් අපකීර්තියට පත් කිරීම සම්බන්ධයෙන් කිහිප වතාවක්ම සිරගත කර ඇත.

දූෂිත අධිකාරවාදී පාලන තන්ත්‍රයන් තම ක්‍රියාවන්ට නීත්‍යානුකූල භාවය ලබා දීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදයේ ව්‍යාජ බාහිර ඔපය දිගටම පවත්වා ගෙන යනවා සේම, බොහෝ පාලන තන්ත්‍රයන් පුළුල් ප්‍රජාවගේ සැලකිල්ලට යොමු වන ප්‍රශ්නවලින් අයුතු ප්‍රයෝජන ගැනීමේදී ඉතා අවස්ථාවාදීව කටයුතු කර ඇත. 2001 සැප්තැම්බර් 11 වෙනිදා ඇතිවූ සිද්ධියෙහි ප්‍රතිඵලයක් වශයෙන්, බොහෝ සිවිල් සමාජ කණ්ඩායම් තමන් ව්‍යාජ නව ත්‍රස්ත විරෝධී නීති යටතේ නම් කර ඇති බව දැනගත්හ. පහතින් තවදුරටත් සාකච්ඡා කර ඇති පරිදි, බොහෝ ජාතීන් විසින් ෂී ජින්පිංගේ සැක සහිත දූෂණ විරෝධී ව්‍යාපාරය අනුගමනය කිරීමට උත්සාහ කර ඇත්තේ විවේචකයින් උදාසීන කරමින් මහජන කෝපය සමනය කිරීමේ මාර්ගයක් ලෙසය. COVID-19 වසංගතය තුළදී, අධිකාරවාදී සහ අර්ධ වශයෙන් නිදහස් සමාජවල බොහෝ නායකයෝ මහජන ඒකරාශිවීම් සීමා කිරීමේ සහ වැරදි තොරතුරුවලට එරෙහිව ක්‍රියා කිරීමේ සැබෑ අවශ්‍යතාව දූෂණයට එරෙහි විරෝධතා වැළැක්වීම සහ ස්වාධීන මාධ්‍ය වසා දැමීමේ අරමුණ ඇතිව අයථා ලෙස භාවිතා කළහ.

කිසිම අයුරකින් විරල නොවන අවසාන අන්තයේදී සිදුවන්නේ, මාධ්‍යවේදීන් සහ සිවිල් සමාජ ව්‍යාපාරයන්හි නිරතව සිටින්නන් නිතරම ශාරීරික බිය ගැන්වීම්, ප්‍රචණ්ඩත්වය මෙන්ම මිනීමැරුම් වලට පවා මුහුණ දීමයි. මාධ්‍යවේදීන් සුරැකීමේ කමිටුව සඳහන් කළේ 2020 වසරේදී පමණක් තමන් ඉටු කළ කාර්යය හේතුවෙන් ඝාතනය වූ මාධ්‍යවේදීන් සංඛ්‍යාව දෙගුණයකටත් වඩා වැඩි වී ඇති බවයි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය විසින් කරන ලද පර්යේෂණයකට අනුව ඉතා දූෂිත යැයි සැලකෙන රටවල සෑම සතියකම අවම වශයෙන් එක් මාධ්‍යවේදියෙකු ඝාතනය වන අතර, ඝාතනයට ලක්වන මාධ්‍යවේදීන් පස් දෙනෙකුගෙන් එක් අයෙකු ඝාතනය වන්නේ දූෂණය හෙළිදරව් කිරීමේ කාර්යය හේතුවෙනි. මෙම ගැටලුව නීතියේ ආධිපත්‍යය සමගින් සෑමවිටම අරගලයක සිටි පශ්චාත් කොමියුනිස්ට්වාදී සහ සංවර්ධනය වෙමින් පවතින රටවලට පමණක් සීමාවූවක් නොවේ. නිදසුනක් වශයෙන්, Pavel Sheremet, Jan Kuciak සහ Daphne Caruana Galizia යන මාධ්‍යවේදීන් යුරෝපීය භූමියේදී ඝාතනය වුණු අවස්ථාවේ ඔවුන් සියලු දෙනා අවධානය යොමු කර තිබුණේ දූෂණය සහ සංවිධානාත්මක අපරාධ කෙරෙහිය.

විශේෂයෙන්ම පශ්චාත් කොමියුනිස්ට්වාදී ආණ්ඩු විසින් පරිපූර්ණ වශයෙන් යොදා ගනු ලබන තවත් ක්‍රමෝපායක් වන්නේ, නොවැළැක්විය හැකි නමුත් දරා ගත හැකි මට්ටමේ දූෂණයකට ජනගහනය පුරුදු කරවා එය සාමාන්‍යකරණය කිරීමයි. ක්‍රමානුබද්ධ දූෂණයෙන් පීඩාවට පත් සමාජයන් තුළ යහපාලනය සඳහා වූ අපේක්ෂාවන් පිළිබඳ නිරන්තරයෙන් ඉතා ගැඹුරින් සර්වද්‍යෝෂදර්ශී ලෙස සැලකෙන මට්ටම්වලින් මෙය පිළිබිඹු වේ. ඕනෑම විකල්පයක් ඔවුන්ගේ වත්මන් පරපුටු පාලක පන්තිය මෙන්ම දූෂිත වනු ඇති බවට ජනතාවට ඒත්තු ගැන්වීම මගින් පාලන තන්ත්‍රය ආරක්ෂා කිරීමට මෙමගින් කටයුතු කෙරේ. තමන්ගේ ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී රජයන්වල ක්‍රමය සමඟ සංසන්දනය කරන විට "චෝදනාවකට ප්‍රතිචෝදනා එල්ල කිරීම" යන්නෙහි නිරත වීමට එය පාලන තන්ත්‍රයට හැකියාව ලබා දෙයි. ප්‍රජාතන්ත්‍රවාදී රටවල ස්වාධීන මාධ්‍ය දේශපාලකයන්ගේ අවංකභාවය අඛණ්ඩව සියුම් පරීක්ෂාවට ලක් කොට විවේචනය කරන්නේ අධිකාරවාදී නායකයින් සහ ඔවුන්ගේ වහල් මාධ්‍ය ආයතන විසින් එවන් දේශපාලනඥයන් වනාහී සිය ක්‍රමය තුළම පවතින්නන්ට වඩා යහපත් නොවන හෝ බොහෝවිට ඔවුන්ට වඩා නරක නොවන බවට පෙන්වීම සඳහා අයුතු ලෙස ප්‍රයෝජන ගනු ලැබිය හැකි දූෂණය පිළිබඳ සංජානනයන් ඉහළ නංවමිනි.

දූෂණය පිළිබඳ සර්වද්‍යෝෂදර්ශීභාවය පතුරුවා හැරීමේ තවත් වැදගත් අංගයක් නම්, එය අධිකාරවාදී නායකයින්ට තමන් කිසියම් විශේෂ, තරමක් විරෝධාභාසී, භූමිකාවකට එනම්, තමන් වටකර සිටින (සහ තමන් ශක්තිමත් කරවන) පාලක පන්තියේ දූෂණයට එරෙහිව නිමක් නැති අරගලයක නිරතව සිටින ජනතා ශූරයාගේ භූමිකාවට පත්කර ගැනීමට අවකාශය සැලසීමයි. තම සමීපතමයන් විසින් රුසියානු ආර්ථිකය කැබලිවලට බෙදාගනු ලැබීමේ කාර්යය සහ එහි ප්‍රතිඵලයක් ලෙස රට චෞර පාලන තන්ත්‍රයක් බවට පත් වීම කූට අයුරින් මෙහෙයවූ පාලකයෙකු වූ ව්ලැඩිමීර් පුටින්ට වඩා මෙම උපක්‍රමයේ නිපුණයෙකු තවත් නොමැත. එහෙත්, පුටින් විසින් නිර්මාණය කරන ලද සහ පොහොසත් කරන ලද කතිපයාධිකාරීන්ගේ බලයට එරෙහිව මහජන මතය පැතිර ගියද, පුටින් පෞද්ගලිකව වසර ගණනාවක් පුරා විශ්වාසනීය ලෙස හිතකර ජනප්‍රියතා ශ්‍රේණිගත කිරීම් තමා වෙත රඳවා ගත්තේය. මෙම ක්‍රමෝපාය මගින් අධිකාරවාදී පාලකයන්ට, තම දූෂණ හෙළිදරව් කිරීමේ නියැලී සිටින ඕනෑම අයෙකුද දූෂිත ලෙස හැසිරෙන බවට විශ්වාසදායක ලෙස චෝදනා කරමින් මහජනයා ව්‍යාකූල කිරීමට ද හැකියාව ලැබේ. සමහර විට මේ සඳහා වඩාත්ම ප්‍රසිද්ධ උදාහරණය සර්ජි මැග්නිට්ස්කි විය හැකිය. ඔහු විමර්ශනාත්මක මාධ්‍යවේදියෙකු හෝ දූෂණ විරෝධී ක්‍රියාකාරිකයෙකු නොව, බිල් බ්‍රෝඩර්ගේ හර්මිටේජ් කැපිටල් සමාගම සඳහා ඔහු විසින් ඉටු කරන ලද කාර්යය අතරතුර දැවැන්ත රාජ්‍ය බදු වංචාවක් අනාවරණය කර ගත් සාමාන්‍ය නීතීඥයෙකි - එහි ප්‍රතිඵලයක් ලෙස රුසියානු බලධාරීන් විසින් ඔහු බන්ධනාගාරය තුළදී ඝාතනය කරන ලදී.

එනමුත් ඇතැම් විට මෙම ක්‍රමෝපායේ වඩාත්ම අත්‍යන්ත හා භයානක විදහා පෑම වන්නේ ෂී ජින්පිං ගේ දූෂණ විරෝධී ව්‍යාපාරය වන අතර, එය අපරාධ සිර කුටි යැයි සැලකෙන ඒවා 40,000කට ආසන්න ප්‍රමාණයක් සහ ඒවාට අනුබල දීම සම්බන්ධයෙන් චෝදනා ලැබූ නිලධාරීන් 50,000කට වැඩි ප්‍රමාණයක් උගුලට හසුකරගෙන ඇත. මෙම ව්‍යාපාරය හරහා නිසැකවම චීන කොමියුනිස්ට් පක්ෂයේ සැබෑවටම දූෂිත නිලධාරීන් බොහොමයකට දඬුවම් කර ඇතත්, නීතියේ ආධිපත්‍යයට සමානව පවතින කිසිම දෙයකට අනුව අපරාධ නඩු ක්‍රියාත්මක නොවන අතර විවේචකයින් සඳහන් කරන්නේ ෂී ජින්පිං ගේ දේශපාලන සගයන් හදිසියේ ඇතිවූ උසස්වීම් අවස්ථා අතිරික්තයෙන් ප්‍රතිලාභ ලබා ඇති බවයි. ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය, ත්‍රස්ත විරෝධී හදිසි නීතිවලට මුවාවී දේශපාලනික වශයෙන් විරුද්ධ පාර්ශවයන් ඉලක්ක කර ගැනීමට අධිකාරවාදීන්ට ආවරණයක් සැපයුවා සේම, බොහෝ දෙනෙක් දූෂණ විරෝධී ප්‍රයත්නයන්ට මුවා වී දේශපාලනික වශයෙන් විරුද්ධ

පාර්ශවයන් ඉලක්ක කර ගැනීම සඳහා ඕගේ ආදර්ශය අනුගමනය කළහ: පිලිපීනයේ රොඩ්රිගෝ ඩුටර්ටේගේ අනුකම්පා විරහිත මර්දනයේ සිට එල් සැල්වදෝරයේ නයිබ් බුකෙලේගේ බලය අල්ලා ගැනීමත්, මොහොමඩ් බින් සල්මාන් විසින් සෞදියේ ද්‍රෝහී ප්‍රභූන්ගේ බොරතෙල් ඩොලර් බිලියන 106ක ප්‍රමාණයක් මැනවින් සෝදිසි කිරීමත් දක්වා සිදුවීම් ඊට උදාහරණ වේ.

## සංවිධානාත්මක අපරාධ

රාජ්‍ය, පෞද්ගලික සහ අපරාධ අංශ අතර රේඛාව නොපැහැදිලි හෝ නොපවතින පාලන තන්ත්‍රයන් තුළ, විශේෂයෙන් නීති විරෝධී මත්ද්‍රව්‍ය, වනජීවී සහ ස්වභාවික සම්පත් වෙළඳාම, මිනිස් ජාවාරම් සහ හොර බඩු ජාවාරම් ඇතුළු සංවිධානාත්මක අපරාධවලින් ලැබෙන ආදායම බොහෝ විට ස්වයං-පොහොසත් වීමේ සහ දේශපාලන අනුග්‍රහයේ ලාභදායී මූලාශ්‍රයකි. දේශපාලන බලය, පුද්ගල ධනවත් වීම සහ සංවිධානාත්මක අපරාධ බොහෝ විට ගැඹුරින් බැඳී ඇති අතර අන්‍යෝන්‍ය වශයෙන් සක්‍රීය වේ. එහිදී චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සංවිධානාත්මක අපරාධවලින් ලබන නීතිවිරෝධී වාසි දේශපාලන බලය ලබා ගැනීමට සහ අනුග්‍රාහක ජාල ගොඩනැගීමට භාවිතා කරන අතර අපරාධ සංවිධාන ඔවුන්ගේ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සලසා ගැනීමට හෝ අවම වශයෙන් එම ක්‍රියාකාරකම් නොදුටුවා සේ සිටිනු ලැබීම සඳහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් මත යැපේ. මෙම බලවේග එකට පැටලී ගිය පසු, ඒවා බිඳ දැමීම දුෂ්කර ය.

සංවිධානාත්මක අපරාධ සහ චෞර පාලන තන්ත්‍රය සාමාන්‍යයෙන් අන්තර්ඡේදනය වන්නේ නීතියේ ආධිපත්‍යය දුර්වල තත්වයක පවතින වේගවත් දේශපාලන හෝ ආර්ථික සංක්‍රාන්තියකට ලක්වන රාජ්‍යවලය. මෙම තත්ත්වයන් තුළ, ධනය සහ බලය යන දෙකම ලබා ගැනීමට ඇති අවස්ථා අති විශාල වන අතර, අපරාධ කල්ලි සහ ඔවුන් සමඟ වැඩ කරන දේශපාලන බල තැරැව්කරුවන් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම සහ අධිකරණ ආයතන නොපවතින, දුර්වල හෝ සම්මුතීන්වලට යටත් වී ඇති තත්වයක් පවතී.

ඇතැම් විට චෞර පාලන තන්ත්‍රය සහ සංවිධානාත්මක අපරාධ ඒකාබද්ධව මතුවීම පිළිබඳ වඩාත්ම පැහැදිලි උදාහරණය රට කොමියුනිස්ට්වාදයෙන් ධනවාදයට මාරුවීමත් සමඟ රුසියාවේ සිදු විය. කලින් පැවති රාජ්‍යයේ ආර්ථික හා දේශපාලන ව්‍යුහයන් දෙකම පිරිහී ගොස් තිබූ අතර, රික්තය පුරවනු ලැබුවේ එම සංක්‍රමණයෙන් ප්‍රයෝජන ගැනීමට උත්සාහ කරන අපරාධ සංවිධාන සහ දේශපාලනයේ හා නීතිය ක්‍රියාත්මක කිරීමේ නිරත වීමේ අපේක්ෂාවෙන් පසුවන නිලධාරීන් විසිනි. මෙම කාලපරිච්ඡේදයේ සීඝ්‍රයෙන් සිදු වූ පුද්ගලීකරනයේ වාසිය අපරාධ සංවිධාන විසින් ලබා ගනු ලැබුවේ ප්‍රධාන ව්‍යවසායන්හි පාලනය සියතෙහි තහවුරු කර ගැනීම සඳහාය. නව දේශපාලන පන්තිය සහ අපරාධ සංවිධාන අතර සම්බන්ධතා ආරම්භයේදීම පැවතුනි. රුසියාවේ පළමු අපරාධ සංවිධානවල නිලයන්හි හිටපු ආරක්ෂක නිලධාරීන් ප්‍රමුඛව සිටීමට විශාල වශයෙන් හේතු වූයේ ඔවුන්ගේ හමුදා සහ පොලිස් පුහුණුව ප්‍රචණ්ඩත්වය හැසිරවීමේ කුසලතාවන්ගෙන් ඔවුන් සන්නද්ධ කර තිබූ බැවිනි. මෙම හිටපු නිලධාරීන් ආරක්ෂක අංශවල හිටපු සාමාජිකයන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම හෝ අපරාධ සංවිධානවලින් අල්ලස් ලබා ගන්නා හෝ - නැතහොත් ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට සෘජුවම සහභාගී වීමෙන් ලාභ ලබා ගන්නා නව කුලීකරුවන් සමඟ සබඳතා ගොඩනඟා ගැනීම හෝ සිදු කළේ ලාභයෙන් කොටසක් රුසියානු රජයේ ඉහළම මට්ටම් කරා ගිය දාමයක සිටින ඔවුන්ගේ ඉහළ නිලධාරීන් වෙත ලබා දෙමිනි.

ප්‍රචණ්ඩත්වය අවම කිරීමට රුසියානු රාජ්‍යයට හැකියාවක් හෝ කැමැත්තක් නොතිබූ හෙයින්, රුසියානු අපරාධ සංවිධාන ධනවත් ව්‍යාපාරිකයන්හට ආරක්ෂාව සහ රැකවරණය සැපයීය. කාලයාගේ ඇවෑමෙන්, ව්ලැඩිමීර් පුටින් එම පන්තියේම ධනවත් ව්‍යාපාරිකයන්ගේ සහාය ඇතිව බලයට පත් වූ විට, පාලනයේ නිරත දේශපාලන ප්‍රභූ පැලැන්තිය අපරාධ සංවිධාන සමඟ ඔවුන්ගේ සබඳතා පවත්වා ගෙන ගිය අතර ඔවුන්ගේ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සබඳතාව දිගටම පවත්වාගෙන ගියහ. ජනාධිපති පුටින් අපරාධ සංවිධාන ඔහුගේ බලය හඳුනාගෙන එය ශක්තිමත් කරන තාක් කල් ඒවාට අඛණ්ඩව පවතින්නට ඉඩ දුන්නේය. අඛණ්ඩව සැපයෙන ආරක්ෂාව සඳහා හිලව් කිරීමට, අපරාධ සංවිධාන හරහා, කතිපයාධිකාරීන් සිය තරඟකරුවන්ගේ ව්‍යාපාර අත්පත් කර ගැනීම හෝ වසා දැමීම සඳහා ආයතනික වැටලීම් සිදු කළහ. රුසියානු ආරක්ෂක අංශ ඇතැම් අවස්ථාවලදී සයිබර් අපරාධකරුවන්ගේ සහ හැකර්වරුන්ගේ විශේෂඥතාව භාවිතා කර ඇත. මෙම භාවිතයන් සහ වෙනත් දෑ හරහා, රුසියාවේ චෞර පාලන ත්‍රාන්ත්‍රික ජාලයන් සංවිධානාත්මක අපරාධවල ව්‍යාප්තිය සමඟ සහ අර්ධ වශයෙන් හේතු කරගෙන පරිණාමය වී ඇත.

වෙනත් අවස්ථාවල දී, චෞර පාලන තන්ත්‍රය සහ සංවිධානාත්මක අපරාධ එකට සම්මිශ්‍ර වනුයේ, බලහත්කාර තුළින් හෝ නීති විරෝධී අරමුදල් වෙත ප්‍රවේශය මගින් ලබා දෙන අවස්ථාවන් තුළින් හෝ සංවිධානාත්මක අපරාධ වැඩි වැඩියෙන් චෞර පාලන තන්ත්‍රය වෙත බලපෑම් කරන බැවිනි. වෙනිසියුලාව ලතින් ඇමරිකාවේ ධනවත්ම රට වශයෙන් තිබූ තත්වයෙන් ප්‍රචණ්ඩ චෞර පාලන තන්ත්‍රයක් බවට පත් වීම, චෞර පාලන තන්ත්‍රය සහ සංවිධානාත්මක අපරාධ අතර අන්තර් ඡේදනයේ විශේෂයෙන් ඛේදනීය උදාහරණයකි. එහිදී සිදුවූයේ නිකොලස් මදුරෝගේ පාලන තන්ත්‍රය මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදීම සඳහා රාජ්‍ය සම්පත් භාවිතා කිරීමත්, පසුව ජ්‍යෙෂ්ඨ ආරක්ෂක සහ හමුදා නිලධාරීන්ගේ පක්ෂපාතීත්වය පවත්වා ගැනීම සඳහා ආදායම් වෙන අතකට හැරවීමත් වේ. මෙම සිදුවීමේදී, කොලොම්බියානු මත්ද්‍රව්‍ය නිෂ්පාදකයෝ මදුරෝ පාලන තන්ත්‍රයට බොහෝ කලකට පෙර සිට, වෙනිසියුලාව හරහා මත්ද්‍රව්‍ය ගෙන යාමට ඔවුන්ට ඉඩ දීම වෙනුවෙන් වෙනිසියුලානු නිලධාරීන්ට ගෙවීම් ලබා දුන්හ. කාලයාගේ ඇවෑමෙන්, මෙම නිලධාරීන්ගෙන් බොහෝ දෙනෙක් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ලෙස සෘජුවම එම කටයුතුවල නිරතවූයේ අපරාධ සංවිධාන සහ වෙනිසියුලානු රාජ්‍යය අතර රේඛාව බොඳ කර දමමිනි. මෙම නිලධාරීන් අවසානයේදී මදුරෝ පාලන තන්ත්‍රයේ ඉහළම නිලයන් දක්වා උසස් කරනු ලැබුවේ ඔවුන්ද ඔහු මෙන්ම ඔහුගේ පාලන තන්ත්‍රයේ පැවැත්ම මත රඳා සිටි බැවිනි. ඒ හා සමානව, වෙනිසියුලානු හමුදාව ඉන්ධන ජාවාරමේ

යෙදීම සඳහා ගෑස් මිලෙහි වෙනස්කම් සිය වාසියට හරවා ගත්තේ, සංවිධානාත්මක අපරාධ සහ රාජ්‍යය අතර බොඳ වූ රේඛාවක් නැවත වරක් පෙන්නුම් කරමිනි.

මෙම භාවිතාවන්ට සමාන්තරව, සංවිධානාත්මක අපරාධ සමග ඇති සබඳතාවලින් සහ රාජ්‍ය භාණ්ඩාගාරයෙන් සොරකම් කිරීමෙන් යන ආකාර දෙකෙන්ම ලාභ ලබන වෙනිසියුලාවේ ඉහළ නිලධාරීන් විසින් පුද්ගලික ලාභ සඳහා මහජන මුදල් ක්‍රමානුකූලව ඇද ගැනීම සිදු වේ. සිය ක්‍රියාකාරකම්වලට ක්‍රියාකාරීව සහභාගීවීමට කැමැත්ත පළ කරන පුළුල් පරාසයක දේශපාලන ප්‍රභූන් සිටින බව සහතික කිරීම මගින් පාලන තන්ත්‍රය ශක්තිමත් කරමින්, පාලන තන්ත්‍ර නිලධාරීන්ගෙන් පක්ෂපාතීත්වය මිල දී ගැනීමට ඔවුහු මෙම ආදායම භාවිතා කරති. එහි ප්‍රතිඵලය වන්නේ සංවිධානාත්මක අපරාධ සමඟ ගැඹුරු බැඳීම් ඇති චෞර පාලන තන්ත්‍ර රාජ්‍යයක් බිහිවීම වන අතර, එහිදී රාජ්‍යය සහ අපරාධ සංවිධාන අතර වෙනස නොපවතින මට්ටමකට මෙන් නොපැහැදිලි වේ.

## යුක්තියට බාධා කිරීම

වාචික සාක්ෂි හෝ වෙනත් සාක්ෂිවලට බාධා කිරීම සඳහා හෝ නීතිය ක්‍රියාත්මක කරන්නන්ගේ හෝ අධිකරණ නිලධාරීන්ගේ නිල රාජකාරිවලට බාධා කිරීම සඳහා හෝ ශාරීරික බලය, තර්ජන හෝ බිය ගැන්වීම් භාවිතා කිරීම, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ගේ, විශේෂයෙන්ම සංවිධානාත්මක අපරාධවලට සමීප සබඳතා ඇති පුද්ගලයින්ගේ සුලබ හැසිරීමකි. රාජ්‍ය ආයතන පාලනය කරන චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සඳහා එවැනි ක්‍රමෝපායන් අනවශ්‍ය වන අතර, ඔවුන් ඒ වෙනුවට අපහසුතාවට පත්වන අන්දමේ ගැටළු අතුරුදහන් කිරීම සඳහා "කාර්යයන් අයථා ලෙස භාවිතා කිරීමේ" (ඉහත දක්වා ඇති පරිදි) නිරත විය හැකිය.

## බලෙන් ලබා ගැනීම

බලහත්කාරයෙන් හෝ තර්ජනවලින් වටිනා දෙයක් ලබා ගැනීමේ ක්‍රියාමාර්ගය බොහෝ විට අල්ලස් ඉල්ලීම සමඟ සම්බන්ධ වන නමුත් එය වාදයට තුඩු දෙන අන්දමින් ඉන් ඔබ්බට විහිදේ. රුසියාවේ, පුද්ගලික ව්‍යාපාර සහ ආයෝජන අත්පත් කර ගැනීම සහ පවරාගැනීම සඳහා තර්ජනය කිරීම හා අවසානයේදී රාජ්‍ය සම්පත් භාවිතා කිරීම සිදුකෙරෙන "ආයතනික වැටලීම්" කොතරම් සුලබ බවට පත් වූවාද යත් එයට *reiderstvo* යනුවෙන් විශේෂ යෙදුමක්ද ඇති අතර රටේ ක්‍රියාත්මක වන විශාලතම සමාගම් එයට ගොදුරු වී ඇත.

බලෙන් ලබා ගැනීම සඳහා වන තවත් මහා පරිමාණ සහ අඛණ්ඩ උදාහරණයක් නම්, චීන කොමියුනිස්ට් පක්ෂය සහ එහි නියෝජිතයින් විසින් විදේශීය ව්‍යාපාරවලට එරෙහි ගාමක බලය ලෙස බලහත්කාරයෙන් තාක්ෂණ-මාරු කිරීම සහ වෙළඳපොළ-ප්‍රවේශ සීමා කිරීම් සිදුකිරීමයි. මෙය කෙතරම් විශාල හා බිය උපදවන පරිමාණයකින් සිදු වේද යත් මෙය චෞර පාලන තන්ත්‍රයක් ලෙස යන්තම්වත් සිතිය නොහැකි වන අතර, එනමුත් එවැනි ක්‍රමෝපායන් වනාහී ගැඹුරු දූෂිත දේශපාලන පද්ධතියක් ගෝලීය ආර්ථිකය කරා ව්‍යාප්ත වන ස්වභාවික ආකාරයකි.

### මොහොමඩ් බින් සල්මාන්

වංචාකාරී සහ දූෂණ විරෝධී ක්‍රියාමාර්ගවලට නායකත්වය දෙමින් සහ ප්‍රසංග සහ සිනමාහල් ඇතුළු සමාජ රැස්වීම් සඳහා රටේ තිබූ සීමාවන් ප්‍රතිසංස්කරණය කිරීම මගින් සෞදි අරාබිය තුළ ප්‍රතිසංස්කරණවාදී සහ සංවර්ධන හිතවාදී ප්‍රතිරූපයක් ගොඩනඟා ගැනීම තුළින් සෞදි අරාබියේ මොහොමඩ් බින් සල්මාන් හට ඔහුගේම චෞර පාලන තාන්ත්‍රික භාවිතයන් වලින් අවධානය වෙනතකට යොමු කරමින් සෞදි ජාතිකයන් අතර ජනප්‍රියත්වය දිනාගැනීමට සමත් වී තිබේ.

දූෂණයට එරෙහිව සටන් කිරීමේ මුවාවෙන් ඔහු සෞදි දේශපාලන සහ ව්‍යාපාරික ප්‍රභූන් සිය ගණනක් රියාද්හි රිට්ස්-කාල්ටන් වෙත 2017 නොවැම්බර් 4 වැනි දින කැඳවන ලෙස රජයේ නිලධාරීන්ට නියෝග කළේය. ඊළඟ වසර දෙක තුළ ඩොලර් බිලියන 107 ක පියවීම් / බේරුම්කිරීම් වශයෙන් ලාභ ලැබීමට සෞදි අරාබියට ඉඩ සලසමින් එහිදී ඔවුන්ට දූෂණ චෝදනා එල්ල වූ අතර, පාපොච්චාරණය කිරීමටද බල කෙරුණු අතර දඬද නියම කරන ලදී. සෞදි අරාබියේ බලය හෝ බලපෑම් කිරීම සඳහා වෙනත් ආකාරයකින් ඔහු සමඟ තරඟ කිරීමට ඉඩ තිබූ බොහෝ ප්‍රභූන් බින් සල්මාන්ගේ දූෂණ-විරෝධී අතුගා දැමීම හේතුවෙන් බලරහිත වීම ඔහුට රට තුළ ඔහුගේ බල අධිකාරිය තහවුරු කර ගැනීමට ඉඩ ලබා දුන්නේය. මෙම පියවර රටෙහි ක්‍රියාත්මක ගාස්තු දූෂණය බොහෝ කලක සිට අවබෝධ කරගෙන සිටි සෞදි අරාබියේ තරුණයින් අතර අතිශයින් ජනප්‍රිය වූ අතර, ඔහු ඩොලර් බිලියන භාගයක යාත්‍රාවක්, ඩොලර් බිලියන භාගයක ලියනාඩෝ ඩා වින්චි සිතුවමක් සහ "ලෝකයේ මිල අධිකම නිවස" ලෙස නම් කරන ලද ප්‍රංශ මාළිගයක් යන සියල්ල හඳුනා නොගත් මුදල් වලින්.මිලදී ගත් බවට වන කරුණෙන් අවධානය වෙනතකට යොමු කරමින් ජනතාවගේ සිත් දිනා ගත්තේය.

## දූෂණය වටා සමාජ සම්මතයන් බලාත්මක කිරීම

ඇතැම් වාතාවරණයන් තුළ, පුද්ගලයන් දූෂණය සහ වෙනත් ආකාරයේ අයථා භාවිතයන් යුක්ති සහගත කිරීමට හෝ වැලඳ ගැනීමට නැඹුරු විය හැකිය. මන්ද යත්, ඒවා යමෙකුගේ කණ්ඩායම ඇතුළත හෝ සිරස් අතට වන (නිදසුනක් වශයෙන්, දූෂිත හැසිරීමක් අපේක්ෂා කරන උසස් පුද්ගලයෙකු සම්බන්ධයෙන්) අන් අයගේ විස්තීරණ භාවිතයන් වන බැවිනි. චෞර පාලන තන්ත්‍රයන්හි දක්නට ලැබෙන ඉහළ මට්ටම්වල සහ මහා පරිමාණයෙන්ද ඇතුළුව දූෂණය සඳහා තෝතැන්නක් නිර්මාණය කිරීමේදී සමාජ සම්මතයන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. එනමුත්, මානව සම්මුතීන් මෙන්, සමාජ සම්මතයන්

වෙනස් කළ නොහැකි නොවන අතර වෙනස් වීමට යටත් වේ. සමාජ සම්මතයන්හි ශක්තිය තීරණය කරන එක් සාධකයක් වන්නේ සාමූහික ප්‍රතිඵලයෙන් ප්‍රතිලාභ ලබන කණ්ඩායම් සඳහා සම්මත අනුකූලතාවයේ වැදගත්කමයි. චෞර පාලන ත්‍රාන්ත්‍රික පසුබිම් තුළ, ක්‍රමය තුළින් ප්‍රතිලාභ ලබන්නන් සඳහා ලැබෙන වාසි, දූෂණය වඩාත් ඉවසිය හැකි තත්වයට පත් කරන සමාජ සම්මතයන් බලාත්මක කිරීමට චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ට සහ ඔවුන්ගේ ගජ මිතුරන්ට දිරිගැන්වීමක් ඇති කරයි. එම බලාත්මක කිරීම සිදු වන්නේ ඥාති පීඩනයේ ස්වරූපයෙන් සමාජශීලීත්ව පීඩනයන් හරහා සහ පවුලෙන් සහ සමීපතම ප්‍රජාවෙන් පිටත සේවා ස්ථානය හා අනෙකුත් ආයතන තුළ තිරස් අතට හෝ සිරස් අතට වශයෙනි. මෙම කොටසේ විස්තර කර ඇති බිය ගැන්වීම් සහ වෙනත් ආකාරයේ බලහත්කාරයෙන් මෙය වෙනස් වන්නේ එයට ප්‍රචණ්ඩත්වයේ තර්ජනය ඇතුළත් නොවන බැවිනි.

## සන්නාමකරණය සහ ආඛ්‍යානය- පදනම් කරගත් ක්‍රමෝපායන්

### ප්‍රතිරූප කළමනාකරණය

වර්තමානයේ, බොහෝ අධිකාරීවාදී පාලන තන්ත්‍රයන් විසින් ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවල රාමුව සහ නාමකරණය පවත්වාගෙන යනු ලබයි. මෙහිදී වංචනික මැතිවරණ යනු වඩාත්ම පැහැදිලි නිදසුන වන නමුත් ජනාධිපතිවරුන්ගේ, අගමැතිවරුන්ගේ සහ පාර්ලිමේන්තුවල ප්‍රජාතන්ත්‍රවාදී ශබ්දකෝෂයෙන් අයුතු ප්‍රයෝජන ගැනීම මගින්ද අපරාධ සංවිධාන මෙන් බොහෝ දුරට ක්‍රියාත්මක වන පාලන තන්ත්‍රයන්ට නීත්‍යානුකූලභාවය සහ කීර්තිය ලබා දෙනු ලැබේ. මෙහිදී ඔවුන්ගේම ජනතාව ඔවුන්ගේ සැබෑ ස්වරූපය ගැන රැවටිල්ලක නොසිටිය හැකි අතරම, ජාත්‍යන්තර ප්‍රජාව සහ විදේශීය ව්‍යාපාර බොහෝ විට ඔවුන්ගේ පහසුව ආරක්ෂා කිරීමට හවුල් වන බවට ප්‍රබන්ධයක් නිර්මාණය කරයි.

මතුපිටින් පෙනෙන තරමින් ඔබ්බට, රාජ්‍ය නිලතල දැරීම චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සඳහා ප්‍රායෝගික ප්‍රතිලාභ කිහිපයක් පිරිනමයි. ඔවුන්ට ඔවුන්ගේම රටවල නඩු පැවරීමේ මුක්තියද විදේශ සංචාරවලදී රාජ්‍ය තාන්ත්‍රික මුක්තියද භුක්ති විඳිය හැකිය. රාජ්‍ය නායකයින් සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද එක්සත් ජනපද සම්බාධකවලට යටත් වීමට ඇති ඉඩකඩ අඩුය. මන්ද යත්, එසේ කිරීමෙන් රාජ්‍ය තාන්ත්‍රික සහ අනෙකුත් කටයුතු බරපතල ලෙස අවුල් කළ හැකි බැවිනි. ඉතා ප්‍රසිද්ධියට පත් මෑත උදාහරණයක, මාධ්‍යවේදී ජමාල් ඛෂෝගි ඝාතනය සම්බන්ධයෙන් ඔටුන්න හිමි මොහොමඩ් බින් සල්මාන් කුමරු වෙනුවට සෞදි අරාබියේ ජ්‍යෙෂ්ඨ ජෙනරාල්වරයෙකුට එක්සත් ජනපදය විසින් සම්බාධක පනවන ලද්දේ, එක්සත් ජනපද බුද්ධි අංශ විසින් මෙම ඝාතනයට මොහොමඩ් බින් සල්මාන් කුමරු සෘජුව අණ කර තිබූ බව නිගමනය කර තිබුණු පසුබිමකය.

සැබෑ ලෝකයේ උදාහරණ මතුකර දැක්වීම සඳහා සිද්ධි අධ්‍යයනද ඇතුළුව, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් විසින් දේශීය වශයෙන් භාවිතා කරනු ලබන ක්‍රමෝපායන් මෙම උපායමාර්ග පිළිබඳ අත්පොතෙහි විස්තර කෙරේ. පහත දැක්වෙන කොටස මගින් දේශීයව මෙම ක්‍රමෝපායන් වලක්වා ගන්නේ කෙසේද සහ අවම කරන්නේ කෙසේද යන්න ගෙන හැර දක්වයි.

# චෞර පාලන තන්ත්‍රය සඳහා දේශීය ප්‍රතිචාර

තම මව් රටවල දූෂණයට එරෙහිව සටන් කරන ක්‍රියාකාරීන් හට භාවිතා කළ හැකි, චෞර පාලන ත්‍රාන්ත්‍රික ක්‍රමෝපායන්වලට එරෙහිව දේශීය මට්ටමින් ගත හැකි ප්‍රතිචාර මෙම කොටස මගින් දැක්වේ. මෙම ප්‍රතිචාරවලට ක්‍රමානුබද්ධ දූෂණ අවදානම් කෙරෙහි අවධානය යොමු කිරීම, දූෂණයට සහ වෙනත් නීති විරෝධී මූල්‍යයට එරෙහි සටනට ප්‍රමුඛත්වය දීම, දූෂණ විරෝධී ප්‍රයත්නයන් සවිබල ගැන්වීම සහ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ට විදේශ අධිකරණ බල ප්‍රදේශවල ඔවුන්ගේ අයථා වත්කම් භුක්ති විඳීම සඳහා වීසා ලබා ගැනීමට ඉඩ සලසන නීතියෙන් ගැලවීමේ මාර්ග වසා දැමීම ඇතුළත් වේ.

චෞර පාලන තන්ත්‍රය මගින් ආරක්ෂාව, සමෘද්ධිය සහ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි එල්ල වන තර්ජනයට සරිලන අන්දමේ ප්‍රමුඛතාවක් දක්වා චෞර පාලන තන්ත්‍රයට එරෙහි සටන දෘශ්‍යමාන ලෙස ඉහළ නැංවීම මගින්, දේශපාලන නායකයින්ට සහ සිවිල් සමාජ සංවිධානවලට අතිශයින්ම දූෂිත, අධිකාරවාදී පාලන තන්ත්‍රයන් පිළිබඳ අනතුරු හැඟවීම සඳහා එක්ව ක්‍රියා කළ හැකිය. ඔවුන්ගේම චෞර පාලන ත්‍රාන්ත්‍රික රජයන් සහ ජාත්‍යන්තර ප්‍රජාව විසින් ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීමට අතීතයේ ගනු ලැබූ උත්සාහයන් හේතුවෙන් එක හා සමානව මුළාවෙන් මිදී කලකිරීමට පත් අධිකාරීවාදී සමාජ තුළ වෙසෙන ජනයා නැවත සම්බන්ධ කරගන්නා අතරම, පාරජාතික දූෂණය නිසා ඇති වන පැතිරී පවත්නා හානිය ගැන නොදැන සිටිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තුළ ජනයා සම්බන්ධ කර ගැනීමත් ඔවුන්ට කළ හැකි වේ.

## ක්‍රමානුබද්ධ දූෂණ අවදානම් පිළිබඳ අවධානය

පාරජාතික චෞර පාලන තන්ත්‍රය ආපසු හැරවීමේ පළමු පියවර වන්නේ ලොව පුරා සිටින දේශපාලන නායකයින් විසින් ගැටලුවේ පරිමාණය සහ එය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා තම රටවල් ඉටු කරන සුවිශේෂී කාර්යභාරය පිළිගැනීමයි.

ඓතිහාසික වශයෙන්, රාජ්‍ය තාන්ත්‍රික හේතූන් මත හෝ ආර්ථික සබඳතා අනතුරේ නොහෙළීම සඳහා හෝ වෙනත් රටවල දේශපාලන ප්‍රභූන් සම්බන්ධ දූෂණවලට පැහැදිලි දෝෂාරෝපණයන් එල්ල කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩු පසුබට වී ඇත. නිදසුනක් වශයෙන්, විදේශ ආධාර සහ සංවර්ධන ආධාර දෙපාර්තමේන්තු බොහෝ විට "දූෂණයට එරෙහිව සටන් කිරීම" වැනි වඩාත් ගැටුමට තුඩුදෙන ප්‍රවේශයට වඩා "යහපාලනය ප්‍රවර්ධනය කිරීම" වැනි සුහද භාෂාවට කැමති ආකාරය මගින් මෙය පිළිබිඹු වේ.

කෙසේ වෙතත්, දූෂණය විසින් නිර්මාණය කරන ලද ගෝලීය ආරක්ෂක අවදානම් පිළිබඳ සිය අවබෝධය වර්ධනය කරගනිමින් පවතින බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී රටවල් සඳහා මෙම ක්‍රමය වෙනස් වෙමින් පවතී. ඊට අමතරව, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන් තුළම හෝ ඇත්ත වශයෙන්ම යම් ප්‍රමාණයක අදහස් ප්‍රකාශනයේ නිදහස ඇති ඕනෑම සමාජයක් තුළම දූෂණය සම්බන්ධ කතා පිළිබඳ සාකච්ඡාවේ අඩුවක් නොමැත. දේශපාලන ප්‍රතිවාදීන්ට යුක්ති සහගත හෝ එසේ නොවන අන්දමින් දූෂණ චෝදනා එල්ල කිරීම වනාහී රාජ්‍ය නිලතල සඳහා ඔවුන්ගේ අවංකභාවය සහ නිපුණතාව පිළිබඳ විශ්වාසය බිඳ දැමීමේ පහසුම සහ බලවත්ම ක්‍රමයකි. එනමුත්, දූෂිත දේශපාලඥයින් සම්බන්ධයෙන් මහත් කලබල ඇති කරවන සුළු ටැබ්ලොයිඩ් පුවත්පත් වාර්තා හෝ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සහ ඔවුන්ගේ පවුල් බටහිර අගනගරවල භුක්ති විඳින ආකර්ෂණීය ජීවන රටාවන් පිළිබඳ වර්ණවත් නිරූපණයන් පවා, හෝ ඒ මගින්, බොහෝ විට එවැනි හැසිරීම්වලට ප්‍රථමයෙන් ඉඩ සලසන දූෂණය සඳහා ඇති ක්‍රමානුබද්ධ අවදානම් පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම බොහෝ විට සිදු නොවේ. සැලකිල්ලට භාජනය නොකළ විට, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ගේ සුඛවාදී නිරූපණ මඟින් ගැටලුව වඩාත් නරක අතට හැරෙන බව සහතික කෙරේ.

දූෂණයේ පැවැත්ම සහ බලපෑම බොහෝ විට පශ්චාත් කොමියුනිස්ට්වාදී සහ සංවර්ධනය වෙමින් පවතින රටවල දේශීය ජනගහනයට ඛේදජනක ලෙස පැහැදිලි වද්දී, සොරකම් කරන ලද අරමුදල් විශුද්ධිකරණය කර සඟවා ඇති බදු ක්ෂේමස්ථාන සහ ධනවත් මූල්‍ය මධ්‍යස්ථානවල සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් බොහෝ විට එය පැවසිය නොහැක. මුදල් විශුද්ධිකරණයේ සහ කීර්ති නාමය මවා පෑමේ සැබෑ කාර්යය සාමාන්‍යයෙන් සිදුවන්නේ රහසිගතව වන බැවින් මෙය පුදුමයට කරුණක් නොවේ. මේ අතර, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සහ ඔවුන්ගේ පවුල් බටහිර අගනගරවල ගත කරන වරප්‍රසාදිත ජීවන රටාවෙන් අදහස් වන්නේ ඔවුන් සාමාන්‍ය ජනතාව සමඟ සෘජුව සම්බන්ධ වන්නේ කලාතුරකින් වන බවයි. ඇත්ත වශයෙන්ම, විදේශ ආයෝජන ගලා ඒම තුළින්, එහි ප්‍රභවය කුමක් වුවත්, ඔවුන්ගේ ආර්ථිකයන්ට ප්‍රතිලාභ ලැබෙන බව දේශීය ජනතාවට හැඟෙන්නට පවා පුළුවන.

සොරකම් කළ ධනය දේශසීමා හරහා යැවෙන ආකාරය සහ එය තම සමාජයට පිළිගැනීමේ සැබෑ ඇඟවුම් පිළිබඳව මහජනතාවට අවබෝධ කර ගැනීමට උපකාර කළ හැක්කේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයින්ගේ පැහැදිලි නායකත්වය, සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය සහ අනතුරුව වැඩිවන මාධ්‍ය ආවරණයට පමණි. සෘජු සදාචාරාත්මක විරෝධතාවලින් ඔබ්බට, දූෂණයට පහසුකම් සැලසීම තුළින් ජාතික විශ්වසනීයත්වයට, ආර්ථික අවස්ථාවට, ජාතික ආරක්ෂාවට සහ ප්‍රජාතන්ත්‍රවාදී ජීව ගුණයට කෙරෙන හානිය පිළිබඳ සාකච්ඡා කිරීම වැදගත් වේ. එනමුත් එදිනෙදා ගැටළු සමඟ පොරබදමින් සිටින පුද්ගලයින්ට මෙම සංකල්ප දුරවබෝධ බවක් පෙන්නුම් කළ හැකිය. රටවල් කිහිපයක් තුළ මහජන උනන්දුව ජනනය කිරීමට උපකාරී වී ඇති එක් විශේෂ ආකර්ශනීය උදාහරණයක් වන්නේ, සැක සහිත විදේශ ධනය ගලා ඒම් මගින් දැනටමත් නිවාස අවශ්‍යතා සපුරාලීමේ අරගලයක නිරත නාගරික මධ්‍යස්ථානවල නිශ්චල දේපළ වටිනාකම් ඉහළ යා හැකි ආකාරය ඉස්මතු කිරීමට දරන උත්සාහයයි.

පාරජාතික චෞර පාලන තන්ත්‍රය මගින් එල්ල කෙරෙන අභියෝගය සාකච්ඡා කිරීම සඳහා ගනු ලබන දේශපාලන, මාධ්‍ය සහ සිවිල් සමාජ නායකත්වයේ වැදගත්කම අතිශෝක්තියෙන් දැක්විය හැක්කක් නොවේ. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් දූෂිත ක්‍රියාවන්හි යෙදීමට භාවිතා කරන ක්‍රම ගැන හුදෙක් ප්‍රසිද්ධියේ සහ නිරන්තරයෙන් කථා කිරීම වනාහී නිසැකවම ඔවුන්ට සතුරු පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ගනු ලබන වැදගත්ම පියවර වේ.

## දූෂණයට සහ වෙනත් නීතිවිරෝධී මුදල්වලට එරෙහි සටනට ප්‍රමුඛත්වය දීම

කෙසේ වෙතත්, චෞර පාලන තන්ත්‍රයට එරෙහි විශ්වසනීය ව්‍යාපාරයක් සඳහා ආඛ්‍යානය වෙනස් කිරීමට වඩා වැඩි යමක් අවශ්‍ය වේ. බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී රටවල් - විශේෂයෙන්ම සොරකම් කළ ධනය සඳහා වාහක හෝ ගබඩාවන් ලෙස සිය මූල්‍ය පද්ධති නිත්‍ය පිළිවෙතක් ලෙස භාවිතා කෙරෙන රටවල් - මෙය අවබෝධ කරගනිමින් සිටින බැවින් එය ආරම්භ වනුයේ තම ආයතන අධිකාරවාදී බලපෑමේ ආක්‍රමණයෙන් ආරක්ෂා කර ගැනීම සඳහා වන දිගුකාලීන ප්‍රතිසංස්කරණවලිනි.

පසුගිය දශක කිහිපය තුළ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට නව අභියෝග එල්ල වී ඇත්තේ ඔවුන් වැඩි වැඩියෙන් පාරජාතික වූ තර්ජන භූ දර්ශනයකට ප්‍රතිචාර දක්වන බැවිනි. නිදසුනක් වශයෙන්, එක්සත් ජනපදයේ, චෞර පාලන තන්ත්‍රයට එරෙහි සටන ඇතුළුව අනෙකුත් ප්‍රමුඛතාවලට හානියක් වන පරිදි මත්ද්‍රව්‍ය ජාවාරම් සහ ත්‍රස්ත මර්දන ක්‍රියාකාරකම් කෙරෙහි නීතිය ක්‍රියාත්මක කිරීම අසමානුපාතික ලෙස අවධානය යොමු කර ඇති බව තර්ක කළ හැකිය. පාරජාතික දූෂණය මගින් මෙම අනෙකුත් තර්ජන නිර්මාණය කෙරෙන සහ උග්‍ර කෙරෙන ප්‍රමාණය පිළිබඳව අපි වැඩිදුර අවබෝධ කරගන්නා විට මෙය විශේෂයෙන් වැදගත් වේ.

ඇත්ත වශයෙන්ම, නීතිය ක්‍රියාත්මක කරන ආයතන සතුව බොහෝ විට දූෂිත ක්‍රියාවන් විමර්ශනය කිරීම සහ ඒවාට නඩු පැවරීම සඳහා අවශ්‍ය කරන නීතිමය අධිකාරීන් බොහොමයක් පවතී. ඔවුන්ට කලාතුරකින් ලැබෙන දේ වන්නේ සංවේදී නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය දේශපාලන පිටුබලය හෝ බොහෝ විට අධිකරණ බල ප්‍රදේශ කිහිපයක් පුරා විහිදෙන සංකීර්ණ මූල්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් ය.

## එක්සත් ජනපදය: චෞර පාලන තාන්ත්‍රික වත්කම් යළි අයකර ගැනීමේ මුලපිරීම

චෞර පාලන තාන්ත්‍රික වත්කම් යළි අයකර ගැනීමේ මුලපිරීම - The Kleptocracy Asset Recovery Initiative (KARI) යනු විමර්ශන සහ නඩු පැවරීම් හරහා විදේශීය දූෂණ කටයුතු වලින් ලැබෙන මුදල් ආපසු අයකර ගැනීම සඳහා අධිකරණ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබන අන්තර් ක්‍රියාකාරී වැඩසටහනකි. 2010 දී එම මුලපිරීම දියත් කළ දා සිට එය රටවල් 11 ක නඩු වලින් ඩොලර් බිලියන 1.9 ක් අත්පත් කරගෙන ඇත.

කැපී පෙනෙන සාර්ථකත්වයන් අතර 2008 දී එක්සත් ජනපදය, ස්විට්සර්ලන්තය සහ කසකස්තානය විසින් රාජ්‍ය නොවන BOTA පදනම නිර්මාණය කිරීම වන අතර අවසානයේ ඒ හරහා කසකස්තානයේ දුප්පත්ම ජනතාව වෙත ඩොලර් මිලියන 115ක් ආපසු ලබා දෙන ලදී. Equatorial Guinea හි ජනාධිපතිගේ පුත් Teodorin Obiang ගේ සුඛෝපභෝගී ජීවන රටාව විමර්ශනය කිරීමේදී ද එම මුලපිරීම ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය, එයට වරක් මයිකල් ජැක්සන්ට අයත් දියමන්ති ඔබ්බවන ලද අත්වැසුම් අල්ලා ගැනීම ද ඇතුළත් ය. වඩාත් මෑතක දී, මැලේසියාවේ සංවර්ධන අරමුදලෙන් ඩොලර් බිලියන 4.5ක් පමණ පැහැරගත් 1MDB සිද්ධියට සම්බන්ධ වත්කම් අවහිර කිරීමට ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ එය කටයුතු කළේය. මැලේසියාවේ එවකට අගමැති නජීබ් රසාක් නෙරපා හරින ලද 2018 මැතිවරනයේදී ඡන්ද දායකයින්ගේ පසුබෑමක් ඇති කිරීමට විමර්ශනය උපකාරී විය.

එක්සත් ජනපද ඩොලරය විසින් ලබා දෙන අධිකරණ බල සීමාව සහ ගෝලීය මුදල් වර්ගයක් ලෙස එහි තත්ත්වයද ඇතුළුව, අනුප්‍රාප්තික එක්සත් ජනපද පාලනතන්ත්‍ර තුනක ශක්තිමත් දේශපාලන පිටුබලයකින් සහ සැලකිය යුතු සම්පත් මගින් මෙම මුලපිරීම ප්‍රතිලාභ ලබයි. එහෙත්, අනෙකුත් රජයන් සමග පමණක් නොව, චෞර පාලනතන්ත්‍රයේ වින්දිතයින්ට වන්දි ගෙවීමට සහාය වීම සඳහා විශ්වාස කළ හැකි සිවිල් සමාජ සංවිධාන සමඟද සංකීර්ණ දේශසීමා චෞර පාලනතන්ත්‍ර නඩු හඹා යාම සහ නඩු පැවරීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවය පෝෂණය කිරීමේ වැදගත්කම සඳහා ද එය ආදර්ශයකි.

## වත්කම් අහිමි කිරීම සහ යළි අයකර ගැනීම

එක්සත් ජනපදයේ සහ අනෙකුත් ගමනාන්ත රටවල දූෂණ විරෝධී නීති ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම බොහෝ විට, අවම වශයෙන් කෙටි කාලීනව, විධායක ප්‍රමුඛතා ගැලපීම සහ ප්‍රතිපාදනවලට අරමුදල් සැපයීම පිළිබඳ කාරණයකි. එසේ කිරීමෙන් චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් බවට පත් වීමට සිටින පුද්ගලයින් වෙත ප්‍රබල පණිවිඩයක් යැවෙන අතර ඔවුන් හේතුවෙන් වින්දිත වූ ජනතාව අතර නව දූෂණ විරෝධී නීති සම්මත කිරීමෙන් පමණක් කිසිදා කළ නොහැකි තරමට විශ්වසනීයත්වය ගොඩනැගේ. මෙයට සමීපව බැඳී ඇත්තේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් අත්පත් කරගත් සොරකම් කරන ලද වත්කම්, ඒවායේ නිජබිම්වල චෞර පාලන තන්ත්‍රයේ වින්දිතයින්ට ආපසු ලබා දීමේ වැදගත් කාර්යයයි.

සොරකම් කරන ලද මහජන මුදල් අත්හිටුවීම සහ ආපසු අයකර ගැනීම සඳහා, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් තම මුදල් නව ස්ථාන වෙත ගෙනයාම වැලැක්වීමට, වත්කම් සොරකම් කළ හෝ නීතිවිරෝධී ඒවා ලෙස හඳුනාගත් පසු ඒවා ඉක්මනින් අත්හිටුවීමට හැකියාව ලබාදෙන නීතිමය සහ ආයතනික ක්‍රියාදාමයන් රටවල් සතුව තිබිය යුතුය මෙම නෛතික ක්‍රියාවලීන්ට අන්තර් රාජ්‍ය අන්‍යෝන්‍ය නෛතික ආධාර ගිවිසුම් හෝ මූල්‍ය බුද්ධි කාර්යාල අතර අවබෝධතා ගිවිසුම් ඇතුළත් වන අතර, ඒවා කාලෝචිත ලෙස සන්නිවේදනය කිරීම සහ වත්කම් අහිමි කිරීම සඳහා පහසුකම් සැලසීමට උපකාරී වේ. සොරකම් කරන ලද අරමුදල් අත්හිටුවීමට සහ ආපසු අයකර ගැනීමට අවශ්‍ය කරන ආයතන සහ ක්‍රියාවලීන් ගොඩනැගීම සඳහා, දේශීය ක්‍රියාකාරීන්ට සහ රජයේ ක්‍රියාකාරීන්ට තමන් වෙත සහය ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මුල පිරීම් කිහිපයක් දෙසට යොමු විය හැකිය. සොරකම් කරන ලද වත්කම් නැවත අයකර ගැනීම සහ නැවත සිය රටට ගෙන්වා ගැනීම සඳහා නීතිමය රාමු සැකසීම පිළිබඳ මාර්ගෝපදේශ කිහිපයක් ලෝක බැංකු සමූහයේ සොරකම් කළ වත්කම් යළි අයකර ගැනීමේ (STAR) මුලපිරීම සහ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) විසින් ප්‍රකාශයට පත් කර ඇත. මීට අමතරව, වත්කම් යළි අයකර ගැනීම සඳහා වන පාලනයේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය පිළිබඳ බාසල් ආයතනය (ICAR) විසින් වත්කම්-යළි අයකර ගැනීමේ ප්‍රයත්නයන් පිළිබඳ දත්ත පද්ධතියක් ප්‍රකාශයට පත් කරන අතර මෙම ක්ෂේත්‍රයේ පුහුණුව සහ තාක්ෂණික සහාය ලබා දෙයි. චෞර පාලන තන්ත්‍රයන් විසින් සොරකම් කරන ලද වත්කම් ආපසු අයකර ගැනීමේ හැකියාව වර්ධනය කර ගැනීමට අපේක්ෂා කරන රටවලට ජාත්‍යන්තර සහය පවතින බව ලෝක බැංකු සමූහයේ සොරකම් කළ වත්කම් යළි අයකර ගැනීමේ මුලපිරීම සහ වත්කම් යළි අයකර ගැනීම සඳහා වන පාලනයේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය පිළිබඳ බාසල් ආයතනයෙහි කාර්යය මගින් පෙන්නුම් කෙරේ.

## මුදල් විශුද්ධිකරණ විරෝධී පද්ධති ශක්තිමත් කිරීම

සමකාලීන චෞර පාලන තන්ත්‍රයේ කේන්ද්‍රීය ලක්ෂණය වන්නේ සොරකම් කරන ලද අරමුදල් දේශසීමා හරහා නිර්නාමිකව මාරු කිරීමේ හැකියාව වන බැවින් නීතිවිරෝධී මූල්‍ය ප්‍රවාහයන්ට එරෙහිව වඩාත් ශක්තිමත් ආරක්ෂාවන් ඇති කිරීම වනාහී ආරම්භය ගත යුතු තාර්කික ස්ථානයයි.

මෙම ක්‍රියාවලියේදී විවිධ රටවල් අතිච්ඡාදනය වන භූමිකාවන් ඉටු කරයි. ආවේණික දූෂණයෙන් පෙළෙන රටවල මූල්‍ය ආයතනවලට මුදල් විශුද්ධිකරණයට එරෙහි දුර්වල පාලනයන් තිබිය හැකි අතර, ඒවා විශ්වාස කළ නොහැකි ලෙස සලකන හෝ රට තුළ සැකයන් ඇති කිරීමට අකමැති හෝ පුද්ගලික ඉතුරුම් කැට ලෙස ඒවා භාවිතා කරන කොල්ලකාරී දේශපාලන ප්‍රභූන්ගේ පාලනයට

කෙලින්ම යටත් වන චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් විසින් ඒවා මුළුමනින්ම මඟ හැරීමත් ඒ සමගම සිදුවිය හැකිය. බදු ක්ෂේමස්ථාන ලෙස හැඳින්වෙන, ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා සිතාමතාම අඩු බදු අනුපාත සහ අවම නියාමනයක් පවත්වා ගෙන යන අධිකරණ බල ප්‍රදේශවල බැංකු, බොහෝ විට සොරකම් කළ ධනය එහි නිජබිම් වෙතින් ප්‍රධාන මූල්‍ය මධ්‍යස්ථාන වෙත ගෙන යාමේදී බොහෝ විට නළ මෙන් ක්‍රියා කරයි. ලන්ඩන් හෝ මියාමි වැනි ධනවත් නගරවල පවතින පෞද්ගලික ධනය පැතිරීම සැලකිල්ලට ගත්විට, සාර්ථක ලෙස විශුද්ධිකරණය කරන ලද අරමුදල් සඳහා අවසාන ගමනාන්තය බොහෝ විට ඒවා මගින් නියෝජනය කෙරෙන අතර ඔවුන්ගේ නිජබිමට වඩා අඩුවෙන් කැපී පෙනෙන ලෙස එම මුදල් සඟවා තැබීම හෝ භුක්ති විඳීම ඒවායෙහිදී කළ හැකිය.

සෑම අවස්ථාවකදීම, ප්‍රතිකර්මය එක හා සමාන වේ: එනම්, දූෂණයෙන් ව්‍යුත්පන්න වූ නීතිවිරෝධී මූල්‍ය ප්‍රවාහයන් හඳුනා ගැනීමට, ඒවා කඩාකප්පල් කිරීමට සහ ඒවාට බාධා කිරීමට හැකි මුදල් විශුද්ධිකරණයට එරෙහි පද්ධති බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල ක්‍රියාත්මක කිරීමයි.

මූල්‍ය කටයුතු කාර්ය සාධක බලකාය (FATF) වර්ෂ 1989 දී ගෝලීය මුදල් විශුද්ධිකරණයට එරෙහි රැකවල්කරු ලෙස ආරම්භ කරන ලදී. එහි සාමාජික බල ප්‍රදේශ 37 සහ ප්‍රාදේශීය සංවිධාන දෙකට වඩාත්ම වැදගත් ගෝලීය මූල්‍ය මධ්‍යස්ථාන ඇතුළත් වේ. මූල්‍ය කටයුතු කාර්ය සාධක බලකාය (FATF) හි නිර්දේශ 40 මගින් මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම සඳහා "පුළුල් සහ ස්ථාවර රාමුවක්" සැපයේ. දූෂණ විරෝධී අරමුණු සඳහා, වඩාත්ම වැදගත් විධිවිධානවලට පහත දෑ ඇතුළත් වේ:

- රජයේ සහ පෞද්ගලික අංශයේ මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් ආයතනගත කිරීම.
- නව ගිණුම්, ඉලෙක්ට්‍රොනික් ක්‍රම හරහා මුදල් හුවමාරු කිරීම්, නියෝජිත බැංකුකරණය සහ තෙවන පාර්ශවයන් සම්බන්ධ වෙනත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගණුදෙනුකරුවන්ගේ මූල්‍ය තත්ව විශ්ලේෂණය සිදු කිරීමට මූල්‍ය ආයතනවලට ක්‍රමවේද ඇති බව සහතික කිරීම. ඉහළ දූෂණ අවදානම් සහිත තනතුරු දරන "දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගලයන්", රාජ්‍ය නිලතල දරන්නන් සහ ඔවුන්ගේ පවුල් සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දැක්වීම මෙයට ඇතුළත් වේ.
- සැකකටයුතු ගනුදෙනු මූල්‍ය බුද්ධි අංශ වෙත වාර්තා කරන ලෙස මූල්‍ය ආයතනවලට නියම කිරීම සහ අවශ්‍ය නම්, නීතිය ක්‍රියාත්මක කිරීම තුළින් ඒවා වාර්තා කර විමර්ශනය කළ හැකිය.
- බැංකු මෙන්ම සේවාදායක අරමුදල් හසුරුවන අනෙකුත් අංශ, මුදල් විශුද්ධිකරණයට එරෙහි වගකීම්වලට යටත් වන බව සහතික කිරීම. මේවාට නිශ්චල දේපල වෙළඳාම් නියෝජිතයන්, නීතිඥයින්, කැසිනෝ, වටිනා ලෝහ අලෙවිකරුවන් සහ විශ්වාසය සහ සමාගම් සපයන්නන් ඇතුළත් වේ.
- මුදල් විශුද්ධිකරණ වාහක ලෙස භාවිත වීම වැළැක්වීම සඳහා සමාගම්වල වාසිදායක හිමිකාරිත්වය හෙළිදරව් කිරීම අවශ්‍ය බවට නියම කිරීම (මේ පිළිබඳව වැඩි විස්තර ඊළඟ කොටසේ දැක්වේ).
- අන්‍යෝන්‍ය නෛතික සහය හා අපරාධකරුවන් සියරටට භාර දීමේ ඉල්ලීම් සහ වෙනත් ආකාරයේ ජාත්‍යන්තර සහයෝගීතාවයන්ට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම.

මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය මෑතකදී තම සාමාජිකයින් මේවා සහ අනෙකුත් මුදල් විශුද්ධිකරණයට එරෙහි වගකීම් කෙතරම් ඵලදායී ලෙස ආරක්ෂා කරන්නේද යන්න ඒවාට අදාළ ව්‍යවස්ථාදායක විධිවිධාන ඔවුන් සතුව තිබේද යන්න වෙනුවට නිරීක්ෂණය කිරීම ආරම්භ කළේය. මෙම ප්‍රවේශය පැන නැගුනේ නව නීති සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොවීම හෝ නිසි ලෙස ක්‍රියාත්මක නොවීම (සහ සමහර අවස්ථාවලදී, ක්‍රියාත්මක වීම කිසිවිටක අපේක්ෂා නොකිරීම) සම්බන්ධයෙන් සැලකිලිමත් වීම තුළිනි. මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකායේ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සැලකිය යුතු මට්ටමකින් සිදු නොවන රටවලට විවිධ නිරීක්ෂණ ලැයිස්තුවලට ඇතුළත් වීමේ අවදානමක් ඇති අතර එය ජාත්‍යන්තර ආයෝජකයින්ගේ සහ පරිත්‍යාගශීලීන්ගේ විශ්වාසයට බරපතල ලෙස අහිතකර බලපෑමක් ඇති කළ හැකිය.

එබැවින් මූල්‍ය කටයුතු කාර්ය සාධක බලකාය (FATF) හි නිර්දේශ 40 කාලෝචිත හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා ප්‍රධාන ප්‍රමුඛතාවයක් විය යුතු අතර, දූෂණය සහ වෙනත් නීතිවිරෝධී මූල්‍ය මගින් එල්ල වන තර්ජනය ඔවුන්ගේ රජය විසින් කෙතරම් බැරෑරුම් ලෙස සලකනවාද යන්න පිළිබඳව මාධ්‍ය සහ සිවිල් සමාජ සංවිධාන සඳහා මිණුම් ලකුණක් ද විය යුතුය.

## සමාගම්, නිශ්චල දේපළ සහ අනෙකුත් මුදල් විශුද්ධිකරණ වාහකයන්හි හිමිකාරිත්වයේ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම

"සාර්ථකත්වයේ රහස වන්නේ කිසිවක් අයිති කර නොගැනීම නමුත් සියල්ල පාලනය කිරීමයි" යන ප්‍රකාශය සිදු කිරීමේ ගෞරවය ජෝන් ඩී රොක්ෆෙලර් නමැති මූල්‍යකරුවාට බොහෝ විට පුද කෙරේ. සොරකම් කළ අරමුදල් නිර්නාමිකව විශුද්ධ කිරීමට ඇති හැකියාව මත ඔවුන්ගේ අඛණ්ඩ දණ්ඩමුක්තිය රඳා පවතින සමකාලීන චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සඳහා මෙය විශේෂයෙන් සත්‍ය වේ.

විශේෂයෙන්ම, සමකාලීන මුදල් විශුද්ධිකරණ කූටෝපායන් තුළ ෂෙල් සමාගම් (සැලකිය යුතු මෙහෙයුම් කටයුතු හෝ අදාළ වත්කම් යනාදියද රහිතව භෞතික පැවැත්මක්ද නොමැතිව සංස්ථාපිත සමාගම්) සහ පෙරටුගාමී සමාගම් අද්විතීය හා සාර්වත්‍රික කාර්යභාරයක් ඉටු කරයි. බොහෝ රටවල් දැන් තම බල ප්‍රදේශය තුළ ලියාපදිංචි වූ හෝ ක්‍රියාත්මක වන සමාගම්වල හුදෙක් නීත්‍යානුකූල හිමිකාරිත්වයට වඩා වාසිදායක හිමිකාරිත්වය හෙළිදරව් කිරීම අවශ්‍ය බවට නියම කිරීම සඳහා නීති සම්පාදනය කරමින් සිටී. මෙය චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ට සහ අනෙකුත් අපරාධකරුවන්ට ලිපි ලේඛන සම්බන්ධ කාර්යයන්වලදී නීතිඥයින් සහ ගණකාධිකාරීවරුන් "පඹයන්" ලෙස භාවිතා කිරීම වඩාත් අපහසු කරවයි. වාසිදායක

හිමිකාරත්ව ලේඛනවලට ප්‍රවේශ විය හැක්කේ අපරාධ විමර්ශන සිදු කරන නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට හෝ පාරිභෝගිකයින්ගේ මූල්‍ය තත්ව විශ්ලේෂණයේ නිරත මූල්‍ය ආයතනවලට හෝ පමණක්ද නොඑසේනම් හුදෙක් පොදු ජනතාවට ඒවා විවෘත විය යුතුද යන්න පිළිබඳව යම් විවාදයක් පවතී. වඩාත් සීමාකාරී ප්‍රවේශයකට පක්ෂව සිටින අය පුද්ගලිකත්වය, දේශපාලන හෝ වාණිජ අරමුණු සඳහා දත්ත අයථා ලෙස භාවිතා කිරීමේ හැකියාව සහ වාසිදායක හිමිකරුවන් ඔවුන්ගේ විධිවිධාන ප්‍රසිද්ධියට පත් කිරීම ගැන අඩුවෙන් කනස්සල්ලට පත්වන්නේ නම්, ශක්තිමත් අනුකූලතාවක් ඇතිව සිටීමේ හැකියාව යනාදිය පිළිබඳ සැලකිල්ල යොමු කිරීම් සඳහන් කිරීමට නැඹුරු වෙති.

විනිවිදභාවය වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයන් පෙන්වා දෙන්නේ, පවතින අපරාධ නඩු වලදී නීතිය ක්‍රියාත්මක කරන ආයතන ප්‍රතික්‍රියාශීලීව ලේඛන වෙත ප්‍රවේශ වීමට නැඹුරු වන අතර, මාධ්‍යවේදීන් සහ සිවිල් සමාජ කණ්ඩායම් Global Witness සංවිධානය සහ වෙනත් අය කර ඇති පරිදි දත්ත ප්‍රක්‍රීය ලෙස (පූර්ව ක්‍රියාකාරී යමකට ප්‍රතිචාර දක්වනවාට වඩා එවැන්නක් නිර්මාණය හෝ පාලනය කරන අන්දමින්) භාවිතා කරන බවයි. මෙම සියුම්ව පරික්ෂාවට ලක් කිරීමේ සහ නිරාවරණය කිරීමේ සම්භාවිතාව සැලකිය යුතු ලෙස වැඩි වීම චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සහ අනෙකුත් අපරාධකරුවන් ඔවුන්ගේ ෂෙල් සමාගම් අධිකරණ බල ප්‍රදේශවල පොදු ලේඛනවල කිසිසේත්ම ලියාපදිංචි කිරීමෙන් වළක්වනු ඇත. එය වංචා සඳහා ඇති අවස්ථා අඩු කරමින්, ව්‍යාපාරවලට තම හවුල්කරුවන් සහ ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් මූලික මූල්‍ය තත්ව විශ්ලේෂණය සිදු කිරීමටද ඉඩ සලසයි. බාහිර පරිශීලකයින්ට ලේඛන සම්බන්ධයෙන් ඇති ගැටළු ඉස්මතු කිරීමට සහ ඒවා පරිපාලනය කරන රාජ්‍ය ආයතනවලට වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීමටද හැකියාව පවතී.

වාසිදායක හිමිකාරත්වය හෙළිදරව් කිරීමෙන් ප්‍රතිලාභ ලබන ආශ්‍රිත ක්ෂේත්‍රයක් වන්නේ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සහ මුදල් විශුද්ධිකරණයේ නිරතවූවන් සඳහා වඩාත් ආකර්ෂණීය ආයෝජනයක් වන නිශ්චල දේපලය. නැවතත්, සැබෑ වශයෙන්ම නේවාසික සහ වාණිජ දේපළ අයිති කාටද යන්න පිළිබඳ තොරතුරු, එම මිලදී ගැනීම් සිදු කිරීමට භාවිතා කරන ලද ෂෙල් සමාගම්වලට වඩා, ප්‍රසිද්ධියේ ප්‍රවේශ විය හැකි ඉඩම් ලේඛනවල ඇතුළත් කිරීම, දූෂණයෙන් ලැබෙන ආදායම සොයා ගැනීම සඳහා පරීක්ෂකයින්ට සහාය විය හැකිය.

සමාගම් සහ නිශ්චල දේපලවල හිමිකාරිත්වයේ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම වනාහී චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සහ අනෙකුත් අපරාධකරුවන්ගෙන් බහුතරයක් සඳහා මුදල් විශුද්ධිකරණයේ පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට යොදා ගත හැකි ඵලදායී ක්‍රමයකි. එනමුත් අපිරිසිදු මුදල් සෑම විටම ආර්ථිකයේ අඳුරුතම කොන් වෙත ගලා යන අතර පරීක්ෂාවට ලක්වීම වැඩි වන විට වෙනත් වාහකයින් වඩාත් ආකර්ෂණීය විය හැකිය. උදාහරණයක් ලෙස, භාර අරමුදල් සහ ලාභ නොලබන ආයතන වනාහී සමහර රටවල සැලකිල්ල දැක්වීම වර්ධනය වෙමින් පවතින ක්ෂේත්‍රයකි. බටහිර සම්බාධක සහ මුදල් විශුද්ධිකරණයට එරෙහි පාලනයන් මගහැරීමේ අරමුණින් අධිකාරවාදී පාලන තන්ත්‍රයන් විසින් විශේෂයෙන් නිර්මාණය කරන ලද විකල්ප ගෙවීම් ක්‍රම සහ ඩිජිටල් මුදල් වර්ගයන්හි මතුවීම, පාර්ශව අතර සිදුවන මුදල් ගණුදෙනු පරීක්ෂාවට ලක් කිරීමේ කාර්යය සඳහා නව අභියෝග ඉදිරිපත් කරයි.

## එක්සත් රාජධානිය: සැලකිය යුතු පාලනයක් ඇති පුද්ගලයින්ගේ ලේඛනය (PSC)

එක්සත් රාජධානිය 2016 දී සිය සැලකිය යුතු පාලනයක් ඇති පුද්ගලයින්ගේ ලේඛනය හඳුන්වා දුන් අතර, සමාගම්වල වාසිදායක හිමිකාරිත්වය ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම අනිවාර්ය කළ යුක්රේනයට පසු දෙවන රට බවට පත් විය.

ප්‍රමුඛ ගෝලීය මූල්‍ය මධ්‍යස්ථානයක් ලෙස ලන්ඩනයේ පිහිටීම, පොහොසත් සංස්කෘතික ගමනාන්තයක් ලෙස එහි ආකර්ශනීය බව සහ අක්වෙරළ මූල්‍ය මධ්‍යස්ථාන ලෙස බොහෝ බ්‍රිතාන්‍ය විදේශ භූමි ප්‍රදේශ සහ රාජ්‍ය වල රඳා පැවතීමේ තත්ත්වය හේතුවෙන් එක්සත් රාජධානිය මුදල් විශුද්ධිකරණය කරන්නන් සඳහා ආකර්ශනීය ගමනාන්තයක් වූ අතර එය එලෙසම පවත්වාගෙන යනු ලබයි.

2018 ජූලි මාසයේදී Global Witness විසින් සිදු කරන ලද සැලකිය යුතු පාලනයක් ඇති පුද්ගලයින්ගේ ලේඛනයේ විස්තීර්ණ විශ්ලේෂණය මගින් සොයා ගනු ලැබුවේ සමාගම් දහස් ගණනක් අතිශය සැක සහිත හිමිකාර දත්ත ගොනු කර ඇති බව හෝ කිසිසේත්ම නීතිරීතිවලට අනුකූල නොවන බවයි. නිදසුනක් වශයෙන්, විදේශීය සමාගමක් තම හිමිකරු ලෙස ප්‍රකාශයට පත් කළ සමාගම් 10,000කට වඩා වැඩි ප්‍රමාණයක් අතරින් සියයට 72ක් බදු ක්ෂේමස්ථාන මත පදනම් විය. සමාගම් 100කට වඩා පාලනය කළ හිමිකරුවන් විසින් සමාගම් 9,000කට වඩා පාලනය කරන ලද අතර, සමාගම් 7,848ක් මුදල් විශුද්ධිකරණය සඳහා භාවිත කළ බවට සැක කෙරෙන වෙනත් සමාගමක් සමඟ හිමිකරුවෙකු, නිලධාරියෙකු හෝ තැපැල් කේතයක් පොදුවේ භාවිතා කර ඇත.

ක්‍රියාකාරිකයින් දත්ත සමුදායේ ඇති තොරතුරු වල ගුණාත්මක භාවය සහ සත්‍යාපනය පිළිබඳව දිගින් දිගටම කනස්සල්ල පළ කළද, 2019 දී සැලකිය යුතු පාලනයක් ඇති පුද්ගලයින්ගේ ලේඛනයෙහි ලියාපදිංචි පරිශීලකයින්ගේ සමීක්ෂණයකින් සියළුම නීතිය ක්‍රියාත්මක කරන ආයතන ඔවුන්ගේ විමර්ශන අතරතුර එයට ප්‍රවේශ වී ඇති බවත් බොහෝ අය අවම වශයෙන් සතිපතා එසේ සිදු කල බවත් සොයාගෙන ඇත.

විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා බොහෝ රටවල ක්‍රියාත්මක කරනු ලබන එක් උපාය මාර්ගයක් වන්නේ “ධනය වාර්තාකරණයයි”. මෙය වනාහී රාජ්‍ය නිලධාරීන් ඔවුන්ගේ ධනය හෝ වත්කම් ඔවුන්ගේ නිල කාලයට පෙර සහ/හෝ එම කාලය තුළ වාර්තා කළ යුතු බවට වන රජයේ නියෝගයකි. එක්සත් රාජධානියේ මේවා Unexplained Wealth Orders (UWOs) හෙවත් පැහැදිලි කළ නොහැකි ධනය පිළිබඳ නියෝග ලෙස හැඳින්වේ. මූලික ගොනු කිරීම් මගින්, අදාළ රාජ්‍ය නිලධාරියාගේ කිසියම් පැහැදිලි කළ නොහැකි

හෝ සැක කටයුතු ධනය වැඩි වීමක් හඳුනා ගැනීම සඳහා, පසුකාලීන වාර්තා සමග සංසන්දනය කළ හැකි පදනමක් නිර්මාණය කරයි. සිවිල් සමාජ සංවිධානවලට වගවීමේ ක්‍රියාවලියට සම්බන්ධ වීමට හැකි වන පරිදි මෙම වාර්තා බොහෝ විට මහජනතාවට ලබා දෙන අතර, ධනය වාර්තා කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි විශ්වාසයක් අවශ්‍ය කෙරෙන, නිලධාරියා විසින් ලබා දෙනු ලබන වත්කම් පිළිබඳ ස්වයං ප්‍රකාශයක් හරහා ඒවා ඉදිරිපත් කරනු ලැබේ. කෙසේ වෙතත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන ධනය පිළිබඳ වාර්තා සත්‍යාපනය කිරීම සඳහා ස්වාධීන විමර්ශනයන් සිදු කරමින් අධිකරණ බල සීමාවන් කිහිපයක් විසින් මෙම වාර්තා පසු විපරම් කරනු ලබයි.

අවසාන වශයෙන්, විනිවිදභාවයේ සිදුවන හදිසි වර්ධනය වීම්වලට අතීත වැරදි පිළිබඳ පුළුල් සාක්ෂි අනාවරණය කර ගැනීමේ හැකියාවක් ඇතැයි අපේක්ෂා කිරීම වැදගත් වේ. ඇත්ත වශයෙන්ම, ප්‍රතිවිරුද්ධ ප්‍රවණතාවය සත්‍ය වන විට, මෙමගින් මහජනයා අතර දූෂණය පිළිබඳ ඉහළ සංජානනයන් ජනනය කළ හැකිය. Global Witness සංවිධානය මගින් සිදු කරන ලද අධ්‍යයනය මගින් සැලකිය යුතු පාලනයක් ඇති පුද්ගලයින් පිළිබඳ ලේඛනය සමඟ ඇති ප්‍රවණතා පිළිබඳව උදාහරණ මගින් පැහැදිලි කර තිබිය හැකි නමුත්, එවන් අධ්‍යයනයක් ප්‍රථමයෙන් නොතිබුනේ නම් ඒවා කිසිදා හෙළි නොවනු ඇත. දෙවනුව, දූෂණ විරෝධී ප්‍රයත්නයන් නිසා වෙනත් ආකාරයකින් මුළාවෙන් මිදී කලකිරීමට පත් විය හැකි ජනගහනයට මෙම විරුද්ධාභාසය පැහැදිලි කර දීම සඳහා මාධ්‍ය සහ සිවිල් සමාජ සංවිධානවල සහාය ඇති ශක්තිමත් දේශපාලන නායකත්වය වැදගත් වේ.

## විදේශ බලපෑම්වල මූල්‍ය අවදානම් සීමා කිරීම

අධිකාරවාදී පාලන තන්ත්‍රවලින් සිදුවන මූල්‍ය ප්‍රවාහයන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තුළ සාරධර්ම සහ භාවිතයන් කෙරෙහි බරපතල පීඩාකාරී බලපෑමක් ඇති කළ හැකිය. අධිකාරවාදී පාලන තන්ත්‍රයන් සමඟ වන ආර්ථික සම්බන්ධකම් මත මූල්‍යමය වශයෙන් යැපෙන දේශපාලන නායකයන් හෝ ව්‍යාපාර මානව හිමිකම්, විදේශ ප්‍රතිපත්ති හෝ පමණක් නොව ජාතික ආරක්ෂක හේතු මත පවා ඒවාට විරුද්ධ වීමට මැලි විය හැකිය. දුර්වල ප්‍රජාතාන්ත්‍රික රටවල් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් තුළ පමණක් නොව, බලගතු පුද්ගලයන් සෘජුව ඉලක්ක කර ඔවුන් සිය සහයෝගයට යොදාගැනීම සඳහා විදේශ ප්‍රතිපත්ති මෙවලම් ලෙස අල්ලස් ගැනීම සහ අයුතු ලාභ සලසා දීම නිසා දීමනා ලැබීම් වැනි දූෂිත භාවිතයන් අධිකාරවාදීහුද නිත්‍ය පිළිවෙතක් ලෙස භාවිතා කරති. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදී රටවල් තම ආයතන විදේශ මූල්‍ය බලපෑම්වලින් පරිවරණය කිරීමට පියවර ගත යුතුය.

මෙය රාජ්‍ය නිලධාරීන්ට තරම් වැදගත් වන අන් තැනක් නැත. අනුකූල නොවීම සඳහා දැඩි දඬුවම් ලබාදීම මගින් අනුබල ලබාදෙනු ලබන වත්කම් හෙළිදරව් කිරීම් සහ මූල්‍ය ඇල්ම පිළිබඳ ලේඛන, දේශපාලන තීරණ ගැනීමේදී අපක්ෂපාතීත්වය සහ අවංකභාවය සහතික කිරීම සඳහා වැදගත් ආරක්ෂාවන් සපයයි. විදේශීය රජයන් සහ ඔවුන්ගේ වාණිජ ප්‍රතියුක්තයින් විසින් සිදු කරනු ලබන පෙලඹවීම් සහ වෙනත් උපදේශන කටයුතු සඳහා සීමා කිරීම් (හෝ ඇත්ත වශයෙන්ම මුළුමනින්ම තහනම් කිරීම්) පැනවීමද භයානක සම්බන්ධතා ගැටුම් වැලැක්වීමේ ඵලදායී ක්‍රම වේ.

### සැඟවුණු වෙනිසියුලානු ධනය

2020 අගෝස්තු මාසයේදී, හිටපු වෙනිසියුලානු භාණ්ඩාගාරික ක්ලෝඩියා ඩයස් රත්රන් මිලදී ගැනීමෙන් පැහැදිලි කළ නොහැකි සමුච්චිත ධනය සැඟවීමට උත්සාහ කර ඇති බවට වාර්තා මගින් චෝදනා කරනු ලැබීය. 2014 සිට, Díaz දූපත් රාජ්‍යයක් වන ශාන්ත වින්සන්ට් සහ ග්‍රෙනඩින්ස් හි ෂෙල් සමාගමක් ආරම්භ කළ බවට සහ ඇය ඩොලර් මිලියන 9.5 කට වඩා වටිනා රන් දඬු 250 ක් මිලදී ගැනීමට පුරුදුව සිට ඇති බවට චෝදනා එල්ලවී ඇත. වසර කිහිපයකට පසු, ඩයස්ගේ (Díaz) නියෝජිතයෙකු සමාන ගනරන් ප්‍රමාණයක් විකුණා එයින් ලැබෙන මුදල් ස්විස් බැංකු ගිණුමක තැන්පත් කරන තෙක්, එම බාර් ලිච්ටෙන්ස්ටයින් හි පෞද්ගලික සුරක්ෂිතාගාරයක ගබඩා කර ඇති බවට චෝදනා එල්ල විය.

දශක දෙකක් තුළ ජාතික භාණ්ඩාගාරයෙන් ඩොලර් බිලියන 300ක් තරම් ප්‍රමාණයක් සොරකම් කර, වෙනිසියුලාව ලෝකයේ වඩාත්ම දූෂිත රටක් බවට පත් කිරීමට උදව් කිරීම සම්බන්ධයෙන් මෙම ගනුදෙනු සහ සම්බන්ධ වූ ෂෙල් සමාගම් සහ ස්විස් බැංකුකරුවන් අපරාධ විමර්ශනය යටතේ පවතී. බර රන් දඬු වල නව්‍ය භාවිතය සහ භෞතික භූවමාරුව මගින් සමහර චෞරතාන්ත්‍රිකයින් තම සොරකම් කළ ධනය සැඟවීමට කොපමණ දුරක් ගමන් කරන්නේද යන්න පෙන්නුම් කරයි.

එක්සත් ජනපදයේ පීඩනයට මුහුණ දෙමින්, ලිච්ටෙන්ස්ටයිනය වෙනිසියුලානු නිලධාරීන් කිහිප දෙනෙකුට චෝදනා එල්ල කර මදුරෝගේ රජය වෙත සම්බාධක පැනවීය. කාඩිෆ් විශ්ව විද්‍යාලයේ මූල්‍ය අපරාධ පිළිබඳ විශේෂඥයෙකු වන මයිකල් ලෙවි ප්‍රකාශ කළේ “වෙනිසියුලාව අනර්ඝ නීචයෙක් බවට පත්ව ඇති බවයි... නිහඬ පිළිවෙතක් අනුගමනය කරනු ලබන බැංකුකරුවන් වසර ගණනාවක් ඔවුන්ගේ මුදල් ගැනීමට සතුටු වූ නමුත් දැන් සෑම කෙනෙකුම හැකි සෑම අයුරකින්ම තම කීර්ති නාමය ආරක්ෂා කර ගැනීමට පමණක් නොව නියාමන සහ සාපරාධී දඬුවම් පවා වළක්වා ගැනීමට රට මඟ හරිමින් සිටිති."

දේශපාලන පක්ෂ, බලපෑම් කරන කණ්ඩායම්, මාධ්‍ය ආයතන, ප්‍රචාරක කණ්ඩායම් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ හා සාමාන්‍ය ජනතාවගේ අදහස් හැඩගැස්වීමේ ලා ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරන අනෙකුත් සංවිධාන සඳහා අරමුදල් සැපයීම ද පැහැදිලි සහ සැලකිය යුතු අවදානමක් නියෝජනය කරයි. විවෘත ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල මෙවැනි සංවිධාන හිමිකර ගැනීමට, ඒවාට පරිත්‍යාග සිදු කිරීමට හෝ වෙනත් ආකාරයකින් බලපෑම් කිරීමට අධිකාරීවාදී පාලන තන්ත්‍රයන්ට සහ ඔවුන්ගේ ප්‍රතියුක්තයින්හට අවසර දිය යුතු මට්ටම, විභව සාවද්‍ය ප්‍රචාරයන් වෙත ප්‍රවේශය මර්දනය කිරීම පිළිබඳ පුළුල් විවාදයක කොටසකි. කෙසේ වෙතත්, "බලපෑම් කර්මාන්තයේ" නිරත පුද්ගලයින්ගෙන්

ඔවුන්ගේ අරමුදල්වල මූලාශ්‍ර සහ ඒ වෙනුවෙන් ඔවුන් විසින් සිදු කර ඇති කාර්යය පිළිබඳ විස්තර හෙළි කිරීමට නියම කර සිටීම මතභේදාත්මක නොවිය යුතුය. තොරතුරු ප්‍රසිද්ධියේ බෙදා හැරීම සහ දේශපාලන බලපෑම් පෞද්ගලිකව අත්පත් කර ගැනීම සඳහා මුදල් ගෙවන්නේ කවුරුන්ද යන්න පිළිබඳ විනිවිදභාවය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හෝ පෞද්ගලිකත්වය පිළිබඳ සලකා බැලීම් කෙරෙහි බලපාන්නේ නැති නමුත් පුරවැසියන්හට දැනුවත් තේරීම් කිරීම සඳහා අත්‍යවශ්‍ය වන පසුබිමක් සපයයි.

## රජය තුළ සහ ඉන් පිටත දූෂණ විරෝධී ක්‍රියාකරුවන් සවිබල ගැන්වීම

වැඩිදියුණු කරන ලද විනිවිදභාවය සහ හෙළිදරව් කිරීමේ ක්‍රියාමාර්ග හරහා ඔවුන්ගේම ආයතන ආරක්ෂා කර ගැනීම මගින්, ප්‍රජාතන්ත්‍රවාදී රටවල් පාරජාතික චෞර පාලන තන්ත්‍රයට එරෙහි සටනේ නියැලී සිටින පුද්ගලයින්හට පාර්ශව අතර සිදුවන මුදල් ගණුදෙනු පරීක්ෂාවට ලක් කිරීමේ තවත් මෙවලම් ලබා දී ඔවුන් සවිබල ගන්වනුද ඇත. මෙයට නීතිය ක්‍රියාත්මක කරන ආයතන, විමර්ශනාත්මක මාධ්‍යවේදීන් සහ සිවිල් සමාජය ඇතුළත් වේ. එනමුත් ඔවුන්ගේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රක්‍රිය අන්දමින් සහයෝගය දැක්වීම සඳහා තවත් බොහෝ දේ කළ හැකි මෙන්ම කළ යුතු වේ.

### නීතිය බලාත්මක කිරීම නවීකරණය කිරීම

ඉහත සඳහන් කළ පරිදි, පාරජාතික දූෂණය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වීම සවිබලගැන්වීම බොහෝ විට දේශපාලන නායකත්වය හා සම්බන්ධ වූද කාලය ගතවන විමර්ශන සහ පිරිවැය අධික නඩු පැවරීම් සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම හා සම්බන්ධ වූද කාරණයක් වේ. එනමුත් නව නීති අධිකාරීන් සහ නවෝත්පාදනයන් විසින්ද පාරජාතික දූෂණයට එරෙහි සටනේ ප්‍රතිඵල ඇති කරවනු ලබන සමහර ක්ෂේත්‍ර තිබේ.

පුද්ගලික අංශය සහ දූෂණ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන සිවිල් සමාජ කණ්ඩායම් සමඟ සම්බන්ධව කටයුතු කිරීම වනාහී බොහෝ නීතිය ක්‍රියාත්මක කරන ආයතන වැඩි වැඩියෙන් ප්‍රක්‍රිය අන්දමින් නියැලෙන ක්ෂේත්‍රයකි. ඕනෑම රජයකට ගත හැකි වඩාත් වැදගත්ම පියවරක් වන්නේ, මුදල් විශුද්ධිකරණකරුවන් විසින් සූරාකෑමේ අවදානමක් ඇති බැංකු සහ අනෙකුත් අංශ සමඟ සමීපව කටයුතු කොට ඔවුන්ට තර්ජන පිළිබඳව දැනුම් දීම, ඔවුන්ගේ අත්දැකීම් වලින් ඉගෙන ගැනීම සහ පාරජාතික දූෂණයට පහසුකම් සැලසීමෙන් ඇතිවන අවදානම් සහ ප්‍රතිවිපාක පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමයි.

තම නිල හෝ ප්‍රකාශිත ආදායම් මූලාශ්‍රවලට වඩා බොහෝ සෙයින් අධිකව පුද්ගලික ධනය ඇති බව පෙනෙන රාජ්‍ය නිලධාරීන් ඉලක්ක කර ගන්නා නව නීති ඇතුළත් වන සංවර්ධනය වෙමින් පවතින තවත් ක්ෂේත්‍රයක් තිබේ. එක්සත් රාජධානියේ මෑතකදී හඳුන්වා දුන් Unexplained Wealth Orders (UWOs) හෙවත් පැහැදිලි කළ නොහැකි ධනය පිළිබඳ නියෝග, ඉහත සඳහන් කළ පරිදි, මෙම ක්‍රියාමාර්ග අතරින් වඩාත් පුළුල් ලෙස වාර්තා වී ඇති ක්‍රියාමාර්ගය වන නමුත්, බොහෝ රටවල් විසින් සැකකරුවන්ට ඔවුන්ගේ පුද්ගලික ධනයේ නීත්‍යානුකූල මූලාශ්‍රය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන හෝ එසේ නොමැති නම් ඒවා රාජ සන්තක කිරීමට ලක්වීමට සිදුවන ඒ හා සමාන නීති පවත්වාගෙන යනු ලබයි. වඩාත් පුළුල් මට්ටමින් සිදු කෙරෙන සිවිල්-වත්කම් අහිමි කිරීමේ ක්‍රියාවන් මෙන්ම, අපරාධ නඩු පැවරීම් සිදු නොවූ අවස්ථාවක අපරාධවලින් උපයාගත් බවට චෝදනා කරන වත්කම් රාජසන්තක කිරීම සිවිල් නිදහස හා සම්බන්ධ බරපතල ගැටළු මතු කරන අතර, පසුව නඩු පැවරීම විරල දෙයක් නොවේ.

නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රයත්නයන්ට සහාය වීමේ තවත් ක්‍රමයක් නම්, මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් සැක කරන චෞර පාලන ත්‍රාන්ත්‍රිකයෙකුට නඩු පැවරීම සඳහා අවශ්‍ය පාදක කරගන්නා වරදවල විෂය පථය පුළුල් කිරීමයි. බොහෝ රටවල, හුදෙක් සැක සහිත අරමුදල් සන්තකයේ තබා ගැනීම සාපරාධී වරදක් නොවේ; ඒවා නිශ්චිත අපරාධයකින් ලබගන්නා ලද බව ද ඔප්පු කළ යුතුය. කෙසේ වෙතත්, වලංගු අපරාධ ලැයිස්තුව බොහෝ විට ඔප්පු කිරීමට අපහසු හෝ වෙනත් සීමාවන්ට යටත් වන බරපතල අපරාධවලට සීමා වේ - වෙනත් අධිකරණ බල ප්‍රදේශවලින් සාක්ෂි ලබා ගැනීමේදී සාමාන්‍යයෙන් පවතින විමර්ශන බාධක වල ඉහළින්ම පවතින්නක් වන මෙය නීතිය ක්‍රියාත්මක කිරීම තුළින් වරදකරුවන් බවට පත් කිරීම දුෂ්කර කරවයි.

> **දූෂණ සත්‍යතා කොමිෂන් සභා**
>
> අතීත පාලන තන්ත්‍රයන් හෝ හිටපු සටන්කාමීන් විසින් සිදු කරන ලද සාහසික ක්‍රියා සහ අයිතීන් උල්ලංඝනය කිරීම් අනාවරණය කර ගැනීමට පශ්චාත්-ගැටුම් සැකසුම් තුළ සම්ප්‍රදායිකව භාවිතා කරනු ලැබූ සත්‍ය කොමිෂන් සභා සංක්‍රාන්ති රටවල අතීත චෞර පාලනතාන්ත්‍රික භාවිතයන් අනාවරණය කර ගැනීමටද භාවිතා කළ හැක. මානව හිමිකම් කඩකිරීම් සහ මිලේච්ඡ ක්‍රියාවන් සඳහා පහළ මට්ටම් වල සහභාගිවූවන් ඔවුන්ගේ අතීත අපයෝජනයන් ගැන සාකච්ඡා කිරීමට මැලිකමක් දක්වනවා සේම, චෞර පාලනතාන්ත්‍රික ක්‍රියාවන්හි යෙදී සිටින හිටපු රජයේ නිලධාරීන් ද වැරදිකරුවන් බවට පත් වේ යැයි බියෙන් සහ ඵලවිපාක වලට ලක්වේ යැයි බියෙන් දූෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට පසුබට විය හැකිය. සංක්‍රාන්ති රටවල දූෂණ සත්‍යතා කොමිෂන් සභා යෙදවීමෙන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට එරෙහිව නඩු ගොඩ නැගීමට සහ සොරකම් කළ වත්කම් සොයා ගැනීමට සහ අයකර ගැනීමට සහාය වීමට භාවිතා කළ හැකි සාක්ෂි වෙනුවෙන් හිටපු නිලධාරීන්ට සමාව ලැබෙනු ඇත. දූෂණ සත්‍යතා කොමිෂන් සභා විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි, වෘත්තිකයන්ට අනාගතයේදී වඩා හොඳ වැළැක්වීමේ සහ අවම කිරීමේ උපාය මාර්ග සංවර්ධනය කිරීමට උපකාර වෙමින් චෞර පාලන තන්ත්‍ර පිළිබඳ සාක්ෂි සහ දැනුම සඳහා දායක වනු ඇත.

සිවිල් සමාජ කණ්ඩායම්වලට මෙහිදී වැදගත් කාර්යභාරයක් පැවරී ඇත්තේ, තමන්ගේම විමර්ශන හරහා දූෂිත ක්‍රියාවන් හෙළිදරව් කිරීමෙන් පමණක් නොව, පාරජාතික දූෂණයට එරෙහි නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රයත්නයන් සඳහා දේශපාලන සහයෝගය සහ ප්‍රමාණවත් සම්පත් දිනා ගැනීම සඳහා මහජන පීඩනය ගොඩනැගීම මගිනි.

## විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම

විනිවිදභාවය, වගවීම සහ පුරවැසි සහභාගීත්වය යන මූලධර්ම මත පදනම් වූ විවෘත-රාජ්‍ය ක්‍රියාමාර්ග සහ අනෙකුත් ප්‍රතිපත්ති හා භාවිතයන් අනුගමනය කිරීම දූෂණයට සහ චෞර පාලන තන්ත්‍රයට එරෙහි වීම සඳහා වන ඵලදායී ක්‍රමයක් විය හැකිය. උදාහරණයක් ලෙස, තොරතුරු සඳහා ප්‍රවේශය පිළිබඳ නීති, මූලික අයිතිවාසිකමක් ලෙස පුරවැසියන්හට රාජ්‍ය ආයතනවලින් විමසා තොරතුරු ලබා ගැනීමට ඉඩ සලසයි. නිල ලේඛන ප්‍රසිද්ධියට පත් කිරීමෙන්, තොරතුරු සඳහා ප්‍රවේශය පිළිබඳ නීති සම්පාදනය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන විට රජයේ වගවීම ප්‍රවර්ධනය කිරීමේ මෙවලමක් බවට පත් වේ. රටවල් 120 කට වඩා වැඩි සංඛ්‍යාවක් තොරතුරු සඳහා ප්‍රවේශය පිළිබඳ නීති සම්මත කර බලාත්මක කර ඇත; කෙසේ වෙතත්, බොහෝ රටවල තොරතුරු උකහා ගැනීම සහ පොදු දත්ත වෙත ප්‍රවේශ වීම දුෂ්කර තත්වයක පවතී. ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ශක්තිමත් නීතිමය රාමුවක් ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන අතර, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පුරවැසියන්ගේ දැනුවත්භාවය සහ රජයේ දත්ත වෙත අර්ධ වශයෙන් ප්‍රවේශ වීම තුළින් පවා අධීක්ෂණය වැඩිදියුණු කළ හැකිය. නිදසුනක් වශයෙන්, පුරවැසියන් සහ සිවිල් සමාජය විසින් පොදු ලේඛනවලින් ලබාගන්නා තොරතුරුවල සත්‍යතාව සම්බන්ධයෙන් සිදු කෙරෙන ස්වාධීන පරීක්ෂාවන් මගින් තොරතුරුවල විශ්වසනීයභාවය සහ රජයේ දත්ත විවේචනාත්මකව හා සූක්ෂමව පරීක්ෂා කිරීම වැඩි දියුණු කෙරේ. මෙය අනෙක් අතට නිල ආඛ්‍යානයට ප්‍රතිවිරුද්ධ අදහස් දැක්වීමට හා ප්‍රතිවිරෝධය දැක්වීමට පුරවැසියන්ට බලය ලබා දෙයි. ඒ හා සමානව, ස්වභාවික සම්පත් වැනි ගැටළු පිළිබඳ විවෘත දත්ත පර්යේෂණ තුළින් නිෂ්පාදනය, අපනයන සහ ආදායම පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම මගින් දූෂණයට ඇති ඉඩකඩ අඩු කළ හැකි තීරණාත්මක මිණුම් සලකුණු මහජනතාවට සැපයේ.

අයවැය සහ කොන්ත්‍රාත්තු නිරීක්ෂණය කිරීම සඳහා පුරවැසියන් සම්බන්ධ කර ගැනීම වැනි අතිරේක මුලපිරීම් තුළින්ද සතුටුදායක ප්‍රතිඵල ලබා ගත හැකි වේ. විනිවිද භාවය හා වගවීම පිළිබඳ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ පද්ධතික, මහා දූෂන ක්‍රියාවන් අඩු කිරීම අතර සෘජු සම්බන්ධතාවක් ඇති කර ගැනීම අභියෝගාත්මක වුවද, දූෂණය මැඩලීම සඳහා විවෘත රාජ්‍ය ප්‍රයත්නයන් දායක වන බවට සාක්ෂි තිබේ. 2011 වසරේදී, බංගලාදේශය පොදු ප්‍රසම්පාදන වේදිකාවක් වෙත මාරු වූ අතර එමගින් ප්‍රාදේශීය ප්‍රජාවන්ට කොන්ත්‍රාත්තු සක්‍රියව නිරීක්ෂණය කිරීමටත් ප්‍රසම්පාදන ප්‍රතිඵලවල වෙනස්කම් නිතිපතා වාර්තා කිරීමටත් හැකි විය. එහි ඇගයුමක ප්‍රතිඵලවලින් පෙන්නුම් කරන ලද්දේ දූෂණ අවස්ථා සීමා කිරීමෙහි ලා එම ක්‍රියාමාර්ග ඵලදායී වූ බව ය.

සමස්ථ මට්ටමින්, මෙම ආකාරයේ ක්‍රියාමාර්ග වෙනත් ක්‍රියාමාර්ග සමඟ ඒකාබද්ධ කළ යුතුව තිබෙන නමුත් ඒවා චෞර පාලන ත්‍රාන්ත්‍රික පාලනයට එරෙහිව ඵලදායි ආරක්ෂාවන් විය හැකිය.

අවසාන වශයෙන්, විශේෂයෙන්ම චෞර පාලන ත්‍රාන්ත්‍රික පාලන තන්ත්‍රවලින් පිටතට සංක්‍රමණය වන සන්දර්භයන් තුළ, චෞර පාලන තන්ත්‍රයේ පදනම වන පද්ධතිමය දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා විවෘතභාවයට උපකාර කළ හැකි වන අතිරේක ක්‍රම තිබේ. නිදසුනක් වශයෙන්, දූෂණ සත්‍යතා කොමිෂන් සභා, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් විසින් සිදු කරන ලද අපරාධ පිළිබඳව වැඩිදුර තොරතුරු සපයන මාර්ගයක් විය හැකි අතර එමගින් අර්ථවත් ප්‍රතිසංස්කරණයකට මග පාදයි.

## තොරතුරු හෙළිකරන්නන් ආරක්ෂා කිරීම සහ දිරිගැන්වීම

ක්‍රමානුබද්ධ දූෂණයෙන් පෙළෙන සමාජවල හෝ මුදල් විශුද්ධිකරණයට එරෙහි සහ දූෂණයට එරෙහි ආරක්ෂාවන් විශේෂයෙන් දුර්වල වන අධිකරණ බල ප්‍රදේශවල, දූෂිත භාවිතයන් පිළිබඳ සාක්ෂි ලබා ගැනීම දුෂ්කර හෝ කිසිදා මතු නොවීමට ඉඩ ඇත. නිදසුනක් වශයෙන්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල මුදල් විශුද්ධිකරණය පිළිබඳ විමර්ශන පවත්වන නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට පැහැදිලි හේතූන් මත, අධිකාරීවාදී පාලන තන්ත්‍රවල සිටින ඔවුන්ගේ ප්‍රතිරූප පුද්ගලයන්ගෙන් සහය ලබා ගැනීමට බොහෝ විට අපහසු වේ. එවැනි වාතාවරණයන් තුළ, තොරතුරු හෙළි කරන්නන් බොහෝ විට වැරදි ක්‍රියාවන් හෙළිදරව් කිරීමේ එකම බලාපොරොත්තුව නියෝජනය කරයි.

අධිකාරවාදී සමාජවල සිටින තොරතුරු හෙළි කරන්නෝ බොහෝ විට තමන්, ඔවුන්ගේ පවුල් සහ ඔවුන්ගේ දේපළ බරපතල අවදානමකට ලක් කර ගනිති. නීතිය ක්‍රියාත්මක කරන විදේශීය ආයතනවලට ඔවුන් ඉක්මනින් හා විචක්ෂණශීලී ලෙස ආරක්ෂාව වෙත යොමු කිරීමට හැකි විය යුතු අතර අවශ්‍ය නම් සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහන් හරහා අඛණ්ඩව ආරක්ෂාව සහතික කළ යුතුය. බදු ක්ෂේමස්ථාන තුළ හෝ නීතියේ ආධිපත්‍යය වඩාත් ශක්තිමත් මූල්‍ය මධ්‍යස්ථාන තුළ සිටින තොරතුරු හෙළි කරන්නෝ වෙනත් ආකාරයක අවදානමකට මුහුණ දෙති: ඒ, වෘත්තීය පළිගැනීම් සහ ඔවුන්ගේ ජීවනෝපාය අහිමි වීමේ අවදානමයි.

තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පුළුල් ලෙස වටහාගන්නා අතරම, ඔවුන් දිරිගැන්වීමේ අදහස - නිදසුනක් වශයෙන්, ඔවුන්ගේ සේවායෝජකයාට එරෙහිව පනවනු ලබන සිවිල් හෝ අපරාධ දඩවලින් කොටසක් ඔවුන්ට පිරිනැමීමෙන් - තරමක් මතභේදාත්මක ය. සමහර අධිකරණ බල ප්‍රදේශ විශ්වාස කරන්නේ මෙය සේවා යෝජකයන්ට එරෙහිව සිදු කරන හරයක් නොමැති හිමිකම් ඉල්ලීම් දිරිගන්වන අතර සාක්ෂිකරුවන්ගේ විශ්වාසනීයත්වය අඩාල කරන බවයි. එක්සත් ජනපදය ඇතුළු අනෙකුත් රටවල්, සැලකිය යුතු මූල්‍ය ආරක්ෂණ ජාලයක් පිරිනැමීම, වැරදි ක්‍රියාවන් හෙළිදරව් කිරීමේදී එම් හෙළිදරව් කරන්නන් මුහුණ දෙන සැලකිය යුතු අවදානම සඳහා සාධාරණ වන්දියක් ලෙස සලකයි.

## පැන්ඩෝරා පත්‍රිකා

2021 ඔක්තෝම්බර් මාසයේදී, විමර්ශනාත්මක මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර එකමුතුව- the International Consortium of Investigative Journalists (ICIJ) විසින් බෙලීස්, බ්‍රිතාන්‍ය වර්ජින් දූපත්, හොංකොං සහ පැනමාව ඇතුළු දන්නා බදු ක්ෂේමස්ථාන පදනම් කරගත් අක්වෙරළ සේවා සමාගම් 14 කින් ලේඛන සහ ලිපිගොනු මිලියන 12කට ආසන්න ප්‍රමාණයක් ඇතුළත් කාන්දු වූ මූල්‍ය වාර්තාවල මෙතෙක් ලබාගත් විශාලතම ගොනුව වන පැන්ඩෝරා පත්‍රිකා නිකුත් කරන ලදී. ICIJ මෙම කාන්දුවේ තොරතුරු ඔවුන්ගේ පෙර විමර්ශන සමඟ ඒකාබද්ධ කරන ලද්දේ අරමුදල් සැඟවීමට භාවිතා කරන ජාල සහ අරමුදල් මාරු කිරීමට සහ සැඟවීමට පහසුකම් සපයන බොහෝ සක්‍රීය කරන්නන්ගේ නම් වඩා හොඳින් හඳුනා ගැනීම සඳහා ය. ජෝර්දානයේ II වන අබ්දුල්ලා රජු, කෙන්යාවේ ජනාධිපති උහුරු කෙන්යාටා, චිලියේ ජනාධිපති සෙබස්තියන් පිනේරා, සහ ඉක්වදෝරයේ ජනාධිපති ගිලර්මෝ ලැසෝ සම්බන්ධ කරමින් වත්මන් හෝ හිටපු ගෝලීය නායකයින් සහ රාජ්‍ය නායකයින් 35 දෙනෙකුගේ අක්වෙරළ ගිණුම් හෝ මූල්‍ය සහ බදු විෂමාචාර පිළිබඳ තොරතුරු කාන්දුවේ අඩංගු බව ICIJ විසින් තහවුරු කිරීම කැපී පෙනේ. සමස්තයක් වශයෙන් ගත් කල, රටවල් 90 කට අධික සංඛ්‍යාවක, විශේෂයෙන් රුසියාව සහ ලතින් ඇමරිකාවේ නිලධාරීන් 336 දෙනෙකු විසින් සිදු කරන ලද වරද තහවුරු කල හැකි අක්වෙරළ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු එම ලේඛනවලට ඇතුළත් වේ. විශේෂයෙන් දකුණු ඩැකෝටා, ෆ්ලොරිඩා, ඩෙලවෙයාර්, ටෙක්සාස් සහ නෙවාඩා යන රෙගුලාසි-සැහැල්ලු ප්‍රාන්තවල මූල්‍ය වැරදි හැසිරීම් සඳහා එක්සත් ජනපදය පදනම් කරගත් භාරයන් අඛණ්ඩව භාවිතා කිරීම ද පත්‍රිකා මගින් ඉස්මතු කර ඇත. තොරතුරු කාන්දුවේ සම්පූර්ණ ගෝලීය සහ දේශපාලන ප්‍රතිවිපාක තවමත් වර්ධනය වෙමින් පවතින නමුත්, පත්‍රිකාවල අඩංගු හෙළිදරව් කිරීම් දැනටමත් විරෝධතා, විමර්ශන සහ නම් කරන ලද අයගේ ප්‍රතික්ෂේප කිරීම් අවුලුවා ඇත.

## වෛෆර පාලන තන්ත්‍රයට එරෙහි ස්වාධීන මාධ්‍ය සහ සිවිල් සමාජ ජාලවලට සහාය වීම

International Consortium of Investigative Journalists විමර්ශනාත්මක මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර එකමුතුව සහ එහි හවුල්කරුවන් විසින් සංවර්ධනය කරන ලද දේශසීමා සහයෝගීතාවයේ නව්‍ය මාදිලියක්, පාරජාතික දූෂණයට එරෙහි සටනේ වඩාත්ම වැදගත් මෑතකාලීන වර්ධනය බවට සැකයක් නැත. එක් ප්‍රවෘත්ති අංශයක් අතිශය උද්යෝගීව සහ බොහෝ විට අකාර්යක්ෂම ලෙස විවිධ භාෂා දුසිම් ගණනකින් පවතින ලේඛන සිය දහස් ගණනක් පරීක්ෂා කිරීමට උත්සාහ කරනවා වෙනුවට, වරකදී පුවත් සඳහා තරඟ කළ ප්‍රවෘත්ති සංවිධාන විසින් මහජනතාව විශේෂයෙන් උනන්දුවක් දක්වන සිද්ධීන් පිළිබඳව ඔවුන්ගේ සම්පත් සහ ජාතික විශේෂඥතාව එක් සංචිතයකට ගෙන ඒම මෙහිදී සිදු කෙරේ. 2016 වසරේ පැනමා පත්‍රිකා වලින් පටන් ගත් විට, එහි ප්‍රතිඵලය වූයේ, ලොව ධනවත්ම අපරාධකරුවන් තම සොරකම් කළ මුදල් සංචලනය කරන සහ සඟවන ආකාරය පෙර නොවූ විරූ මට්ටමකට නිදර්ශනය කරන නිර්දය හෙළිදරව් කිරීමකි. මේවාට Paradise Papers, Luanda Leaks සහ වඩාත් මෑතක FinCEN ගොනු ද ඇතුළත් වේ.

වෛෆර පාලන තන්ත්‍රයට එරෙහිව සටන් කිරීම කෙරෙහි අවධානය යොමු කළ සිවිල් සමාජ සංවිධාන මෑත වසරවලදී ඵලදායී නව ක්‍රම සහ ක්‍රමෝපායයන්ද සංවර්ධනය කර ඇත. විශේෂයෙන්ම, සමාජ මාධ්‍යවල වර්ධනය, දූෂණය හෙළිදරව් කිරීමට සහ ප්‍රතිසංස්කරණවලට සහාය වීමට මහජනතාව වැඩි වශයෙන් සම්බන්ධ කර ගැනීමේ හැකියාව පුළුල් කර ඇත.

අපකීර්තිමත් 1MDB සිද්ධියට එවකට අගමැති රජීබ් නසාක් සම්බන්ධ යැයි කියනු ලබන බව හුවා දැක්වීමට බර්සි හවුල විසින් ගතික සමාජ මාධ්‍ය ප්‍රචාරක ව්‍යාපාරයක් ව්‍යාප්ත කළ අවස්ථාව ඇතැම් විට මැලේසියාව විසින් මෙයට හොඳම උදාහරණය ඉදිරිපත් කරන ලද අවස්ථාව විය හැකිය. මෙම උත්සාහයන් 2018 මැතිවරනයේදී ඔහුගේ විස්මිත පරාජයට හේතු වූවාට සැක නැත. තවත් වැදගත් ප්‍රවණතාවක් නම්, යම් මතයක් ප්‍රවර්ධනය කිරීමේ සාම්ප්‍රදායික කටයුතුවලින් ඔබ්බට ගොස් විවිධ පාර්ශ්වකරුවන් සහ මීට පෙර පැවතියාට වඩා පුළුල් පුද්ගල කුසලතා පරාසයක් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් ක්‍රියාකාරිකයින්හට වඩාත් ජවසම්පන්න සහ ඒත්තු ගැන්වෙන ප්‍රචාරණ ව්‍යාපාර පැවැත්වීමට ඉඩ සැලසීමයි. ජාත්‍යන්තර මට්ටමින්, එක්සත් ජනපද NED ආයතනය විසින් වසර ගණනාවක් තිස්සේ වෛෆර පාලන තන්ත්‍රය ආශ්‍රිත ගැටලු පිළිබඳ අධ්‍යාපනික සහ ජාලකරණ සැසි සඳහා අදාළ රාජ්‍ය නිලධාරීන්, මාධ්‍යවේදීන්, විද්වතුන්, ක්‍රියාකාරීන් සහ අනෙකුත් ප්‍රවීණයන් කැඳවා ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රටවල් විශාල ප්‍රමාණයක් පුරා විහිදුනු විශාල සහ විවිධත්වයෙන් පිරි ජාලයක වර්ධනයක් ඇති විය. මේවා ප්‍රතිපත්ති සම්පාදකයින් සෘජුව සම්බන්ධ වී ඇති (හෝ අවශ්‍යයෙන්ම සම්බන්ධ වී සිටිය යුතු) වර්ධනයන් නොවන නමුත් ප්‍රතිසංස්කරණ සඳහා වන ගම්‍යතාව දැඩි සේ වර්ධනය කරවීම සඳහා සිවිල් සමාජ සංවිධානවල වර්ධනය වන විභවය සහ හැකි සෑම විටම මෙම ප්‍රයත්නයන්ට සහාය වීමේ වැදගත්කම පෙන්නුම් කරයි.

ස්වාධීන මාධ්‍ය සහ සිවිල් සමාජ සංවිධානවල ගෝලීය ජාල අතිච්ඡාදනය වීමේ මෙම මෑතකාලීන වර්ධනය, පාරජාතික වෛෆර පාලන තන්ත්‍රයේම අපූර්ව පිලිබිඹුවකි. ඇතැම් විට ඒ හේතුවෙන්ම, එය ඊට එරෙහි අපගේ වඩාත් ඵලදායී ආයුධවලින් එකක් බව ඔප්පු වෙමින් තිබේ.

ප්‍රතිපත්ති සම්පාදකයින් මෙම ආකෘතිය මෙහෙයවන්නන් නොවිය හැකි නමුත්, එහි අඛණ්ඩ ව්‍යාප්තියට සහාය වීම සඳහා ඔවුන්ට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට ඇත. සමහර ප්‍රජාතන්ත්‍රවාදී රජයන් වර්තමානයේදී

නීතිවිරෝධී මූල්‍යකරණයට එරෙහිව සටන් කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක වීම සහ පුද්ගලික අංශය අතර සහයෝගීතාව ක්‍රියාකාරීව ශක්තිමත් කරමින් සිටින නමුත්, තවමත් සමාජ ව්‍යාපාරයන්හි යෙදෙන්නන්ගේ සහ ක්‍රියාකාරීන්ගේ වැදගත් අධීක්ෂණ සහ ප්‍රතිපත්ති-සංවර්ධන භූමිකාවන් වැලඳ ගන්නවාට වඩා ඔවුන් කරදරයක් ලෙස සැලකීම කරති. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන්ට චෞර පාලන ත්‍රාන්ත්‍රික පද්ධති තුළ සමාජ ව්‍යාපාරයන්හි යෙදෙන්නන් නිල රාජ්‍යතාන්ත්‍රික නාලිකා හරහා දෘශ්‍යමාන ලෙස සම්බන්ධ කර ගැනීම, ඔවුන්ට පුහුණුවීම් සහ ජාලකරණ අවස්ථා ලබා දීම සහ ඔවුන් ක්‍රියාත්මක වන සතුරු පරිසරයෙන් පිටත දත්ත හා අනෙකුත් සම්පත් ගබඩා කිරීමට ඔවුන්ට ආරක්ෂිත ක්ෂේමස්ථානයක් ලබා දීම යනාදිය මගින් ඔවුන්ට සහාය විය හැකිය. ජාත්‍යන්තර මට්ටමින්, ගෝලීය රැස්වීම් සඳහා සිවිල් සමාජ සංවිධානවලට යම් හෙයකින් ආරාධනා කළද, එහිදී වැදගත් ගිවිසුම් සහ ප්‍රතිඵල හැඩගැස්වීමේදී ඔවුන්ට සෘජු භූමිකාවක් ලබා දෙනවාට වඩා බොහෝ විට එම රැස්වීම්වල නොවැදගත් තැනකට ඔවුන් දමනු ලැබේ. එනමුත් ක්ෂේත්‍රයේ පෙරමුණේ සිට ඔවුන් ලබා ඇති අත්දැකීම් මගින් අදහස් වන්නේ එම රැස්වීමවලට සම්බන්ධ වන ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුට වඩා බොහෝ විට වඩාත් ප්‍රයෝජනවත් දෘෂ්ටිකෝණයන් සහ ප්‍රයෝජනවත් යෝජනා ඔවුන් සතුවන බවයි.

විමර්ශනාත්මක මාධ්‍යවේදීන් සහ සමාජ ව්‍යාපාර ක්‍රියාකාරිකයින් මුහුණ දෙන විශාලතම බාධාව වන්නේ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සහ ඔවුන්ගේ ප්‍රතියුක්තයින් විසින් ඔවුන්ට අපහාස නඩු පැවරීමේ තර්ජනයයි. එක්සත් ජනපදය තුළ "මහජන සහභාගීත්වයට එරෙහි උපාය මාර්ගික නඩු (SLAPP)" ලෙස හඳුන්වනු ලබන්නෙහි බොහෝ විට අභිප්‍රාය වන්නේ නඩුවක නෛතික ලක්ෂණ ප්‍රදර්ශනය කිරීම නොව, සියුම් පරීක්ෂාවට ලක්වීම පීඩාකාරී නෛතික පිරිවැය මගින් වැළැක්වීම සහ යටපත් කිරීමයි. පොදු යහපත සඳහා වන නඩු වලදී අපහාස කිරීම කළ බවට වන ප්‍රකාශ කිරීම්වලට එරෙහිව විශේෂ ආරක්ෂාවක් හඳුන්වා දෙන මහජන සහභාගීත්වයට එරෙහි උපාය මාර්ගික නඩුවලට එරෙහි නීති මගින්, උදාහරණයක් ලෙස පිරිවැය සීමාවන් පැනවීම මගින්, ප්‍රජාතන්ත්‍රවාදී රටවල් තුළ මෙම නීතිමය පද්ධතීන් අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීමට උපකාර කළ හැකිය. එවැනි තර්ජනවලට මුහුණ දෙන මාධ්‍යවේදීන් සඳහා සහාය සපයන මූලපිරීම් සංවර්ධනය කිරීම සහ ඒවාට දායක වීමද, උදාහරණයක් ලෙස Global Media Defense Fund ගෝලීය මාධ්‍ය ආරක්ෂක අරමුදල වැනි දෑ, ප්‍රයෝජනවත් වේ.

වඩාත්ම භයානක පාලන තන්ත්‍රයන් සහ පුද්ගලයන් පිළිබඳව විමර්ශනය කිරීමේදී මාධ්‍යවේදීන් සහ සමාජ ව්‍යාපාර ක්‍රියාකාරිකයින් බොහෝ විට මුහුණ දෙන දැඩි පුද්ගලික අවදානම්වලින් ඔවුන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ටද පියවර ගත හැකිය. මාධ්‍යයට එරෙහි ප්‍රචණ්ඩත්වය තව දුරටත් ප්‍රශ්නයක් වන්නේ තැනකට ගොස් යමක් සෙවීමේ අවදානම පැහැදිලිව පෙනෙන අධිකාරවාදී පාලන තන්ත්‍රයන් තුළ පමණක් නොව, ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තුළමද එය ප්‍රශ්නයක් වේ. ස්ලෝවැකියාවේ Jan Kuciak, මෝල්ටාවේ Daphne Caruana Galizia සහ වෙනත් අයගේ ඝාතනයන් තුළින් එය පෙන්නුම් කර ඇත. මෙම ඝාතනවල අරමුණ මාධ්‍යවේදීන් සහ ඔවුන්ගේ පුවත් හුදෙක් අතුරුදහන් කිරීම වන හෙයින් මෙවන් අනාගත ඝාතන වැළැක්විය හැකි හොඳම ක්‍රමය වන්නේ එවැනි සිද්ධීන් දැඩි ලෙස විමර්ශනය කර, ඒවාට වගකිවයුත්තන් හෙළිදරව් කර එහි වගකීම බාර ගත යුතු තැනට ඔවුන් පත් කිරීමයි. මෙය, මාධ්‍යවේදීන් සහ ක්‍රියාකාරීන් ඝාතනය කිරීම සැමවිටම ආපසු කැරකෙන කාරණයක් බවට පණිවිඩයක් චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් වෙත යවයි. මන්ද යත්, බොහෝ විට දේශීය වශයෙන් පමණක් සැලකිල්ලට යොමු කෙරෙන්නට තිබුණු ඔවුන්ගේ පුවත් නීතිය ක්‍රියාත්මක කරන්නන්ගේ සහ මාධ්‍යවල අවධානය ආකර්ෂණය කර ගන්නා ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර සිද්ධීන් බවට එමගින් පත්වන බැවිණි.

## වීසා සම්බන්ධයෙන් පවතින නීතියෙන් ගැලවීමේ මාර්ග මැඩලීම

"ගෝල්ඩන් වීසා" ලෙස නම් කර ඇති වීසා, එනම්, සත්කාරක රට තුළට සැලකිය යුතු ආයෝජන ගෙන ඒමට හුවමාරුවක් වශයෙන් එහි පුරවැසිභාවය සඳහා මග සලසන වීසා, ධනවත් පුද්ගලයන්ට දෙවන සහ තෙවන රටවල පුරවැසිභාවය ලබා ගැනීමට ඉඩ ලබා දී ඇත. ඔවුන් විදේශයන්හි පුරවැසිභාවය ලබා ගන්නා විට, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්හට මුදල් විශුද්ධිකරණය කිරීම සඳහා සහ තම නීතිවිරෝධී අරමුදල්වල මූලාරම්භය වසන් කිරීම සඳහා විදේශීය මූල්‍ය වෙළඳපොළවල් සහ නීතිමය ආයතන වෙත වඩාත් වැඩි ප්‍රවේශයක් ලැබේ. ඔවුන් රට තුළ ව්‍යාපාර කිරීමට අදහස් කරන්නේ නම්, එම ද්විතීයික රටවල ප්‍රජාතන්ත්‍රවාදය සහ දූෂණ විරෝධී ප්‍රයත්නයන් පිරිහීයාමේ අවදානම ඇති කරමින් ඔවුන් සිය චෞර පාලන ත්‍රාන්ත්‍රික භාවිතයන් ඔවුන් සමඟ එම රටට රැගෙන යා හැකිය.

චෞර පාලන තන්ත්‍රිකයින්හට ගෝල්ඩන් වීසා සැපයීම නවතා වෙනත් රටවල ඔවුන්ගේ නීති විරෝධී ක්‍රියාකාරකම් ව්‍යාප්ත කිරීමට හෝ විදේශයන්හි මුදල් විශුද්ධිකරණය කිරීමට ඔවුන්ට ඇති හැකියාව සීමා කිරීමට උපකාරී වන්නේ අදාළ ක්‍රියාමාර්ගවලට ක්‍රියාකාරීව සහභාගීවීමට කැමැත්ත පළ කරන බොහෝ රටවල් සමග චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ට එරෙහිව ගනු ලබන මනා සේ සම්බන්ධීකරණය වූ ක්‍රියාමාර්ග පමණි. පාරජාතික චෞර පාලන තන්ත්‍රයේ පීඩාකාරී බලපෑම් වලින් තම රටෙහි ප්‍රජාතන්ත්‍රවාදයේ අඛණ්ඩතාව සහ ආයතන ආරක්ෂා කර ගැනීම සඳහා රටවල් ඔවුන්ගේ ගෝල්ඩන් වීසා වැඩසටහන් නිමා කිරීමට තීරණය කළ හැකිය.

චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්හට ගෝල්ඩන් වීසා ලබා දීමට එරෙහිව ඒකාබද්ධ ප්‍රයත්නයක් ඇති කිරීම සඳහා විමර්ශන කටයුතු ඉහළ නැංවීම සහ තොරතුරු හුවමාරු කිරීම මෙහිදී ගත හැකි තවත් විසඳුම් වේ. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් පසුබිම් පරීක්ෂාවේදී අනාවරණය වූ දූෂිත භාවිතයන් සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් මත වීසා බලපත්‍ර ප්‍රතික්ෂේප කර ඇති අතර, වීසා ප්‍රතික්ෂේප කිරීමට හේතු රහසිගතව තබා ඇත. ගෝල්ඩන් වීසා වගවීම් පනත යනුවෙන් නම් කරන ලද යෝජිත නීති සම්පාදනය H.R. 4142 යටතේ රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් දූෂණ හෝ මානව හිමිකම් කඩකිරීම් වල යෙදෙන බවට සොයා ගන්නා පුද්ගලයන් සඳහා වීසා ප්‍රතික්ෂේප කිරීම් පිළිබඳ දත්ත ගබඩාවක් තබා ගන්නා අතර, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් ද්විතීයික පුරවැසිභාවය ලබා ඔවුන්ගේ නීතිවිරෝධී ක්‍රියාවන් පාරජාතික වශයෙන් ව්‍යාප්ත කිරීම වැළැක්වීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයක් දියත් කිරීමේ අරමුණින් මෙම තොරතුරු යුරෝපා සංගමය සහ ෆයිව් අයිස් සාමාජිකයින් සමඟ බෙදා ගනී.

2021 ජුලි මස මැද වන විට, මහා පරිමාණ ආයෝජකයින් සඳහා එක්සත් ජනපදය තුළ ගෝල්ඩන් වීසා ලබා දෙන EB-5 වීසා වැඩසටහන අවලංගු වී තාවකාලිකව නවතා ඇති නමුත් අතීතයේ එසේ සිදු කළ නවතා දැමීම් එම වීසා අලුත් කිරීම නැවැත්වූයේ නැත. එක්සත් ජනපදයේ වීසා අලුත් කළද, නොකළද, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සහ මානව හිමිකම් අපයෝජනය කරන්නන් සඳහා වීසා ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ තොරතුරු බෙදාගැනීම ඉහළ නැංවීම, චෞර පාලන තන්ත්‍රයට එරෙහි සටනේ යෙදී සිටින වෙනත් රටවලට උපකාර කිරීමේදී අත්‍යවශ්‍ය වනු ඇත. විමර්ශන පවත්වා, වීසා අයදුම්කිරීම්වල චෞර පාලන ත්‍රාන්ත්‍රික භාවිතයන් අනාවරණය කර ගැනීම සඳහා වෙනත් අයුරකින් මූලාශ්‍ර කිසිවක් නොමැති රටවල් එයට ඇතුළත් වේ.

# පාරජාතික චෞර පාලන තන්ත්‍ර ක්‍රමෝපායන්

මෙම කොටස දේශීය හෝ ජාතික ක්ෂේත්‍රවලින් ඔබ්බට ගොස් පාරජාතික චෞර පාලන ත්‍රාන්ත්‍රික ක්‍රමෝපායන් සහ උපාය මාර්ග විස්තර කරයි. මෙම පාරජාතික ක්‍රමෝපායන් වර්ග හතරක් භාවිතා කරමින් ලැයිස්තුගත කර ඇත: (1) දේශපාලනය හා නීතිය මත පදනම් වූ, (2) ආර්ථිකය හා මූල්‍ය මත පදනම් වූ, (3) බලහත්කාරය සහ ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ සහ (4) සන්නාමකරණය සහ ආඛ්‍යානය මත පදනම් වූ

සමකාලීන චෞර පාලන තන්ත්‍රයේ පාරජාතික සාරය එය ඉතිහාසය පුරා ඇති අනෙකුත් දූෂණවලින් වෙන්කර හඳුනා ගනී. ඔවුන්ගේ අභිප්‍රායන්, ක්‍රම හෝ අරමුණු කුමක් වුවත්, සියලුම චෞර පාලන ත්‍රාන්ත්‍රිකයෝ ගෝලීය ආර්ථිකයේ දුර්වලතාවලින් අයුතු ප්‍රයෝජන ගැනීමට, විවිධ අධිකරණ බල ප්‍රදේශවල වෘත්තීය අතරමැදියන් සම්බන්ධ කර ගැනීමට, දේශසීමා හරහා නිර්නාමිකව අරමුදල් මාරු කිරීමට සහ විදේශයන්හි ඔවුන් කෙරෙහි ප්‍රසාදයක් නොමැති නිරීක්ෂණ සහ විරුද්ධත්වයේ මූලාශ්‍ර ලුහුබැඳීමට ඇති හැකියාව මත රඳා පවතිති.

මෙයින් අදහස් කරන්නේ චෞර පාලන තන්ත්‍රය සඳහා ඇති අවස්ථා උපරිම කිරීමට අධිකාරවාදී පාලන තන්ත්‍ර දරන උත්සාහයන් ඔවුන්ගේම දේශසීමා ඉක්මවා වැඩි වැඩියෙන් සිදු වන බවයි මෙයට පුළුල් ලෙස වර්ග තුනක් ඇතුළත් වේ: විරුද්ධත්වය සහ සියුම් පරීක්ෂාව මැඩලීම සඳහා පාරජාතික මර්දනය; ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තුළ ආර්ථිකය ග්‍රහණයට ගැනීම; සහ විදේශ ප්‍රතිපත්ති අරමුණු ඉදිරියට ගෙන යාම සඳහා බලගතු පාලන තන්ත්‍රයන් විසින් "උපායමාර්ගික දූෂණය" වැඩි වැඩියෙන් භාවිතා කිරීම.

## දේශපාලනික සහ නෛතික ක්‍රමෝපායන්

### *උපායමාර්ගික දූෂණය*

මෑත වසරවල වැඩි සැලකිල්ලක් යොමු වන කාරණයක් වන්නේ විදේශ ප්‍රතිපත්ති අරමුණු ඉදිරියට ගෙන යාම සඳහා අධිකාරවාදී පාලන තන්ත්‍රයන් සහ ඔවුන්ගේ වාණිජ ප්‍රතියුක්තයින් විසින් දූෂිත භාවිතයන් සිතාමතාම භාවිතා කිරීමයි. හිටපු එක්සත් ජනපද පරිපාලන නිලධාරීන් විසින් 2020 වසරේ දී සකසන ලද විදේශ කටයුතු පිළිබඳ රචනයක මෙය "උපායමාර්ගික දූෂණය" ලෙස නම් කර ඇති අතර, ඔවුහු විශේෂයෙන්ම චීනය සහ රුසියාව විසින් ගෝලීය පරිමාණයෙන් දූෂණය "ආයුධකරණය" කිරීම පෙන්වා දුන්හ. වත්මන් සහ හිටපු නිලධාරීන් සිය සහයෝගයට යොදාගැනීම සඳහා අධිකාරීවාදීන් විසින් විබාදක ප්‍රාග්ධනය සහ අනර්ථකාමී මූල්‍ය භාවිතා කිරීම එයට ඇතුළත් වේ.

The Center for International Private Enterprise - ජාත්‍යන්තර පුද්ගලික ව්‍යවසාය මධ්‍යස්ථානය "අධිකාරවාදී පාලන තන්ත්‍රවලින් ගලා එන විනිවිදභාවය, වගවීම සහ වෙළඳපල දිශානතිය නොමැති මූල්‍යකරණයක්" ලෙස විබාදන ප්‍රාග්ධනය නිර්වචනය කරයි. එය NED විසින් "තියුණු බලය" ලෙස හඳුන්වනු ලබන, "ඉලක්කගත රටවල දේශපාලන සහ තොරතුරු පරිසරයන් බිඳගෙන යන, විනිවිද යන, හෝ සිදුරු කරන" අධිකාරීවාදී බලපෑමේ වෙනත් ආකාරයන් ඌනපූරණය කරයි.

උපායමාර්ගික දූෂණය යනු චෞර පාලන ත්‍රාන්ත්‍රික ආර්ථිකයන්හි අපනයනය කරන ලද අතුරු ඵලයක් නොවන නමුත් රාජ්‍ය පාලන ක්‍රමයේ මෙවලම් ලෙස අල්ලස්, බලෙන් ගැනීම් සහ වෙනත් දූෂිත භාවිතයන් ඍජුව සහ හිතාමතා භාවිතා කිරීම එයට ඇතුළත් වේ. එනම්, දූෂණය මත දේශීය පදනම් ගොඩනගා ගෙන ඇති පාලන තන්ත්‍රයන් විසින් එවැනි භාවිතයන් විදේශ ප්‍රතිපත්තියේ ස්වාභාවික මෙවලම් ලෙස සැලකීම පුදුමයක් නොවේ.

රාජ්‍ය පාලිත සමාගම් එවැනි උත්සාහයන් සඳහා නියමාකාර වාහකයක් නිතර සපයයි. ස්වාධීන ව්‍යවසායන් ලෙස වෙස්වළා ගැනීමෙන්, ඔවුන්ගේ ක්‍රියාකාරකම් මෙහෙයවන පාලන තන්ත්‍රයන්හට සිය ආයතනික ධුරාවලියේ සාමාජිකයින් විසින් සිදු කරන ලද ඕනෑම හානිකර ක්‍රියාවක් පිළිබඳ දැනුම හෝ වගකීම ප්‍රතික්ෂේප කිරීමට ( එය විශ්වාස කළ හැකි වුවත් නැතත්) ඇති හැකියාව ඔවුහු සපයති. ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘතිවලින් සහ වෙනත් ආයෝජනවලින් අයුතු ලාභ සලසා දීම නිසා සැපයෙන දීමනා ලබා දීම මගින් ඔවුහු බොහෝ විට සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රභූ පැලැන්තියෙන් දේශපාලන වාසි ලබා ගැනීමට කටයුතු කරති. හිටපු හොංකොං නිලධාරියෙකු වන පැට්‍රික් හෝ, 2019 වසරේ දී එක්සත් ජනපදය විසින් සිරගත කරනු ලැබුවේ, පුද්ගලික සමාගමක් වශයෙන් බාහිරට පෙනෙන නමුත් කොමියුනිස්ට් පක්ෂයට පුළුල් සම්බන්ධතා ඇති CEFC China Energy සමාගම

වෙනුවෙන් චැඩ් සහ උගන්ඩාවේ ජනාධිපතිවරුන්ට අල්ලස් දීම හේතුවෙනි. උසාවියේදී හෝ තර්ක කළේ ඔහු පුද්ගලික අංශයේ අල්ලස් ගැනීමේ නිරත නොවූ නමුත් හුදෙක් "චීන රාජ්‍යයේ න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම සඳහා" ක්‍රියා කළ බවයි. චීනයේ රජය විසින් පාලනය කරනු ලබන සමාගම් ද Belt and Road මුලපිරීම ඔස්සේ දැවැන්ත අල්ලස් ගැනීම් සහ වෙනත් දූෂණවල නියැලී ඇත. දේශපාලනිකව දේශීය ප්‍රභූන් සිය සහයෝගයට යොදාගැනීම හෝ අවදානමට ලක්විය හැකි රටවල් බීජං වෙත "ණය උගුලකට" හසුකර ගැනීමට හිතාමතා කරන උත්සාහයකට වඩා මෙය බොහෝ විට වාණිජ අභිලාෂයන් හා ආනුෂංගිකව සම්බන්ධ වී ඇතත් එවැනි දෑ මෙහිදී සිදු වී ඇත. එහෙත් එවැනි ප්‍රගතීන්ට ගොදුරු විය හැක්කේ සංවර්ධනය වෙමින් පවතින ලෝකය පමණක් යැයි අදහසක් ඉදිරිපත් කිරීම වැරදිය. දූෂණ වංචා සිද්ධිවල පැටලී [සිටියද](#) රුසියාවේ Nord Stream 2 නල මාර්ග ව්‍යාපෘතිය, යුරෝපීය රජයන් එයට පොලඹවා ගනු ලැබ ඇති අතර එය වනාහී යුක්රේනයේ වියදමින් රුසියානු බලශක්ති සැපයුම් මත යුරෝපයේ යැපීම වැඩි කිරීම මගින් ක්‍රෙම්ලිනයේ දුෂ්ට අභිප්‍රායන් ඉදිරියට ගෙන යාමේ නිර්ලජ්ජිත උත්සාහයක් බව සඳහන් කිරීම අවශ්‍ය නොවේ.

ජර්මානු මාෂල් අරමුදල "අනර්ථකාරී මූල්‍ය" ලෙස [හඳුන්වන](#) දේ යෙදවීමට චෞර පාලන තන්ත්‍රය විසින් නිර්මාණය කරන ලද එම හිඩැස්ම ප්‍රයෝජනයට ගනිමින් අධිකාරීවාදී පාලන තන්ත්‍රයන් සෘජුවම ප්‍රජාතන්ත්‍රවාදයට පහර දෙයි. ඔවුන් සාමූහිකව පසුගිය දශකය තුළ රටවල් 33ක් තුළ ඩොලර් මිලියන 300 ක් පමණ වියදම් කළේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් අඩපණ කිරීම සඳහා සැලසුම් කර ඇති පියවර වෙනුවෙනි.

ජාත්‍යන්තර සංවිධානවලට රිංගා ඒවා යටිකුරු කර දැමීම පිණිස අල්ලස් දීමේ ක්‍රියාවලියටද ඔවුහු දක්ෂ වී සිටිති. මෙය බොහෝ විට සිදු කරනු ලබන්නේ ජාතික කීර්තිය සඳහා වන අතර, උදාහරණයක් ලෙස Federation Internationale de Football Association (FIFA) - ජාත්‍යන්තර පාපන්දු සංගමයේ නිලධාරීන්ට අල්ලස් දීමෙන් රුසියාව සහ කටාරය 2018 සහ 2022 වසරවලදී ලෝක කුසලාන තරඟාවලි ලබා ගත් බවට එක්සත් ජනපදය විසින් එල්ල කරනු ලබන [චෝදනා](#) මගින් එය නිරූපණය කෙරේ. එහෙත් ඊටත් වඩා සැලකිය යුතු මට්ටමකින්, ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ සම්මතයන් සකසන එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවලට සිදු කෙරෙන මෙවැනි දූෂිත බලපෑම් සැලසුම් කර ඇත්තේ ගෝලීය නීති මෙම රටවලට වාසිදායක ලෙස යොමු කරගැනීම පිණිසය. මේ ආකාරයෙන්, සෘජු ආර්ථික තරඟයක් ලෙස මහජනතාවට පෙනෙන දේ බොහෝ විට එක්සත් ජනපදය විසින් මෙහෙයවනු ලබන නීති-පාදක ප්‍රවේශය සහ ගෝලීය නිසි පාලනය, ජාතික අවශ්‍යතා (හෝ වඩාත් නිවැරදිව, ඇතැම් රටවල පාලක ප්‍රභූන්ගේ අවශ්‍යතා) වෙත පෙරළීම මූලික වූ ප්‍රවේශයන්අතර තරඟයක් වසන් කරයි.

මෑත වසරවල සිදු වූ වඩාත්ම වැදගත් වර්ධනයක් නම්, අධිකාරවාදී පාලන තන්ත්‍රයන් කෙතරම් මට්ටමකට එකිනෙකාගේ වඩාත්ම සාර්ථක චෞර පාලන ත්‍රාන්ත්‍රික ක්‍රමෝපායන් අනුගමනය කරනවා පමණක් නොව දූෂිත අරමුණු හඹා යාම සඳහා ක්‍රියාකාරීව සහයෝගීව කටයුතු කරනවාද යන්නයි. නිදසුනක් වශයෙන්, අප්‍රිකාව පුරා සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් පුරා, චීන කොමියුනිස්ට් පක්ෂය විසින්, අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා දූෂිත ආඥාදායකයින්ට රුකුල් දීමට ඊනියා "මාලිගා රාජ්‍යෝපාය" වෙනුවෙන් ඇතැම් විට ඩොලර් මිලියන සිය ගණනක් වියදම් කරන්නට ඇත. එනමුත් ඇතැම් විට මෙම ප්‍රවණතාවයේ පැහැදිලිම උදාහරණය වන්නේ වෙනිසියුලාවේ නිකොලස් මදුරෝගේ පාලන තන්ත්‍රය පවත්වාගෙන යාම සඳහා ප්‍රමුඛ අධිකාරීවාදී පාලන තන්ත්‍රයන් විසින් දරන ලද විස්තීරණ උත්සාහයයි. විශේෂයෙන්ම රටේ තෙල් අංශයේ ආයෝජනය හරහා මදුරෝගේ ඉතා ගිජු පාලන තන්ත්‍රයේ වැරදි වසා දැමීම සඳහා රුසියාව සිය සම්පූර්ණ පරාසයක ආර්ථික, රාජ්‍යතාන්ත්‍රික, හමුදාමය සහ වැරදි තොරතුරු ප්‍රචාරය කිරීමේ මෙවලම් යොදවා ඇත. මදුරෝට එක්සත් ජනපද සම්බාධක මග හැරීමට උපකාර කිරීම සඳහා ඉරානය වර්තමානයේ ඉන්ධන, රත්‍රන් සහ ආයුධ නැව්ගත කරමින් සිටී. එමෙන්ම චීනය ජාත්‍යන්තර සංසදවලදී එම පාලන තන්ත්‍රයට රාජ්‍ය තාන්ත්‍රික ආවරණයක් සපයා ඇති අතර අවම වශයෙන් ඩොලර් බිලියන 20ක ණය ඒ වෙත සපයා ඇත. ලෝකයේ ප්‍රධාන ප්‍රජාතන්ත්‍රවාදී රටවල් යුක්රේනය වැනි අවදානමට ලක්විය හැකි හවුල්කරුවන්ට සහාය වීමට උත්සාහ කර ඇති ආකාරයටම, ප්‍රජාතන්ත්‍රවාදී සංක්‍රාන්තිය වෙතින් තර්ජනයක් එල්ල වූ අවස්ථාවේ වෙනිසියුලාවේ "තමන්ගේම කෙනෙකු" ආරක්ෂා කිරීමට ලෝකයේ බලවත්ම චෞර පාලන ත්‍රාන්ත්‍රිකයෝ සාර්ථක අන්දමින් යුහුසුළු වූහ.

උපායමාර්ගික දූෂණය පිළිබඳ විභව සහයෝගීතාවයේ විකාශනය වන තවත් ක්ෂේත්‍රයක් තුළට, සම්බාධක, මුදල් විශුද්ධිකරණයට එරෙහි ආරක්ෂණ සහ නීතිවිරෝධී මූල්‍ය ප්‍රවාහයන් නිදහසේ හැසිරවීමට ඔවුන්ට ඇති හැකියාව මත ඇති වෙනත් සීමා කිරීම් මග හැරීමට ඉඩ සලසන විකල්ප ගෙවීම් සංවර්ධනය කිරීම සඳහා අධිකාරවාදී පාලන තන්ත්‍රවල බල කිරීම ඇතුළත් වේ. විශේෂයෙන්ම, චීනය සහ රුසියාව විසින් ඔවුන්ගේ මහ බැංකු විසින් නිකුත් කරනු ලබන සහ පාලනය කරනු ලබන සාධ්‍ය ඩිජිටල් මුදල් සංවර්ධනය කිරීමට දරන උත්සාහයන්වලට, ආර්ථික රාජ්‍ය තන්ත්‍ර මෙවලම් භාවිතයෙන් දූෂණය සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ඉලක්ක කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී රටවලට ඇති හැකියාව නිශේධනය කිරීමේ හැකියාව පවතී. මේවා විශාල වශයෙන් භාවිතා වන "ගුප්ත කේතන මුදල්" හෙවත් ක්‍රිප්ටොකරන්සීස් වෙතින් වෙනස් වන්නේ ඒවා විමධ්‍යගත නොවීමත්, ඒ වෙනුවට, නීති විරෝධී මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා අධිකාරවාදී පාලන තන්ත්‍රයන් වෙත නව වාහකයක් සපයමින් හා දේශීය වශයෙන් පවතින විරුද්ධත්වයේ මූල්‍ය ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරමින් ඒවා මහ බැංකු විසින් පරිපාලනය සහ අධීක්ෂණය කරනු ලැබීමත් හේතුවෙනි.

## සතුරන්ට එරෙහිව නීතිය භාවිත කිරීම

මූල්‍ය අපරාධ සහ නීතිවිරෝධී මුදල් ගලායාම් හෙළිදරව් කරන විමර්ශනාත්මක මාධ්‍යවේදීන්ට එරෙහිව නඩු පැවරීමට සහ ඔවුන් නිශ්ශබ්ද කිරීමට චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් විසින් වැඩි වැඩියෙන් මහජන සහභාගීත්වයට එරෙහි උපායමාර්ගික නඩු භාවිතා කර ඇත. "සතුරන්ට එරෙහිව නීතිය භාවිත කිරීම " ලෙස හැඳින්වෙන මෙම නඩු, මාධ්‍යවේදීන්ට හෝ ඔවුන්ගේ මාධ්‍ය සංවිධානවලට නඩුවලට එරෙහිව සටන් කරමින් එවැනි ඉහළ නෛතික ගාස්තු ගොඩගැසීමට බල කිරීම අවසානයේ ඔවුන්ට වියදම් කළ හැකි සීමාව ඉක්මවීම හේතුවෙන් පසුබැසීමට සිදුවීමෙන් මාධ්‍යවේදීන් නිහඬ කිරීමට සුවිශේෂී

ලෙස ඵලදායී වේ. ඇත්ත වශයෙන්ම, රටවල් 41 ක දූෂණය පිළිබඳ වාර්තා කරන මාධ්‍යවේදීන් සඳහා විදේශ ප්‍රතිපත්ති මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද [සමීක්ෂණයකින්](#) හෙළිදරව් වූයේ ඔවුන්ගේ කාර්යයන්ට පවතින ලොකුම බාධාව නීතිමය තර්ජන බවයි - එය ශාරීරික හිරිහැර හෝ රජයේ නිරීක්ෂණයට භාජනය වීමට වඩා ඉහළ මට්ටමක පවතී - ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට 73ක් දූෂණ කටයුතු විමර්ශනය කිරීමට එරෙහිව නීතිමය පියවර ගන්නා බවට තර්ජනය කිරීම්වලට ලක් වී ඇත.

මාධ්‍යවේදීන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වීම නඩු පැවරීමටත් පෙර සිටම, ඔවුන්ගේ ක්‍රියාකාරකම් කෙරෙහි හානිකර බලපෑමක් ඇති කරයි. නඩු පැවරීම හුදෙක් නොවැළැක්විය හැකි බව දැන සිටීම මාධ්‍යවේදීන් සිය වාර්තා පළ කිරීමෙන් වළක්වාලයි; කතිපයාධිකාරී චරිත පිළිබඳ සිය විමර්ශන සඳහා ප්‍රසිද්ධ මාධ්‍යවේදියෙකු කියා සිටින්නේ [ඔවුන්ගේ වාර්තාකරණයෙන් සියයට 50 ක්](#) නීතිය සම්බන්ධ කාරණා හේතුවෙන් ප්‍රකාශයට පත් නොකළ බවයි.

මෙම උපාය මාර්ගයේ අන්තර්ජාතික ස්වභාවය පැහැදිලි වන්නේ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් විසින් විත්තිකරුවන්ට වඩා අපහසු නඩු පැවරීමට නැඹුරු නීති පද්ධති ඇති [විදේශීය අධිකරණවල නඩු පැවරීමට පක්ෂව "කඩේ යාමට"](#) ගැති ව සිටීමයි. මාධ්‍යවේදීන් නිහඬ කිරීම සඳහා නඩු පැවරීමේ සිදුවීම් සමස්ත යුරෝපා සංගමය (EU) හා එක්සත් ජනපදයේ ඒකාබද්ධ එකතුවට වඩා ඉහළ අගයක් ගන්නා එවැනි ක්‍රමයක් එක්සත් රාජධානියේ පවතී. යුරෝපීය කොමිසම සහ එක්සත් ජනපදයේ ප්‍රාන්ත ගණනාවක් විසින් පැමිණිලිකරුට අදාළ නඩුව තමන්ට වාසිදායක වනු ඇති බවට ඔප්පු කරන ලෙස ඉල්ලා සිටින, නඩු පවරන පාර්ශවයන්ට විත්තිකරුන් ඉදිරියේ ඉහළ නීතිඥ ගාස්තුවක් දැරීමට සිදු වන පරිදි බල කරන නීති සම්පාදනය කිරීමට ප්‍රතිඥාවක් ලබා දී හෝ දැනටමත් SLAPP-විරෝධී නීති සම්මත කර ඇත.

## ආර්ථික සහ මූල්‍ය ක්‍රමෝපායන්

### වංචනික ජාත්‍යන්තර ප්‍රසම්පාදන හරහා ද ඇතුළුව, විදේශීය රාජ්‍ය නිලධාරීන් සහ රාජ්‍ය ජාත්‍යන්තර සංවිධානවල නිලධාරීන් හට අල්ලස් ලබා දීම

ඔවුන් විසින්ම තම රට තුළ දී අල්ලස් සහ දූෂණය සඳහා පෙළඹවීම හා ලබා ගැනීම සේම, තමන්ගේම පෞද්ගලික වාසිය තකා හෝ රෙජීමයේ විදේශ ප්‍රතිපත්තියේ මෙවලමක් ලෙස වේවා, විදේශීය සගයන්ගේ අල්ලස් ලබා ගැනීම සඳහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් නිරන්තරයෙන් කටයුතු කරති. අල්ලස් සඳහා පෙළඹවීම හෝ අල්ලස් ලබා ගැනීම සාපරාධී කිරීම සඳහා UNCAC විසින් අත්සන් අත්‍යාවශ්‍ය නොකිරීම හැර, විදේශීය අල්ලස්වල සංඝටක අංග දේශීය අල්ලස්වලට සමාන වේ. එක්සත් රාජධානියේ අංක 2010 දරන අල්ලස් පනත අල්ලස් හා දූෂණ සම්බන්ධයෙන් විශ්ව අධිකරණ බලය අවධාරනය කරමින් මෙම අසාමාන්‍ය පියවර ගත් අතර, දැන් ඒ සඳහා එක්සත් ජනපදය තුළ ද ඉල්ලුම වර්ධනය වෙමින් පවතී. මෙමගින් ප්‍රජාතන්ත්‍රවාදීන්ට තම රටවල් තුළ අල්ලස් සඳහා පෙළඹවීම හෝ ලබා ගැනීම සම්බන්ධයෙන් විදේශීය චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හැකි වේ. වංචනික ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සාමාන්‍යයෙන් ආර්ථික හා දේශපාලන බල අධිකාරයන් අතර සබඳතා කෙරෙහි යොමු කරයි. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් නිතිපතා වංචනික ජාත්‍යන්තර ප්‍රසම්පාදන භාවිතයන්හි නිරත වන අතර තම පුද්ගලික අර්ථික වාසිය සඳහා සහ චෞර පාලන තන්ත්‍රයන්ට සහාය වීම සඳහා බලපෑම් කිරීමට අරමුදල් සැපයීමට සහ සහාය මිල දී ගැනීම සඳහා මහජන අරමුදල් විශාල වශයෙන් අවභාවිතා කරති. කෘතිමව පුම්බන ලද සහ ඉතා මිල අධික ජාත්‍යන්තර ප්‍රසම්පාදන ගනුදෙනු හරහා අයුතු ලාභයක් සලසාදීම නිසා ලබන විශාල ගෙවීම සඳහා කටයුතු කිරීමට, බදු ක්ෂේමස්ථාන වල ෂායා වෙළෙන්දන් නිර්මාණය කිරීමට සහ ව්‍යාජ ඉන්වොයිසි ඉදිරිපත් කිරීමට චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් බොහෝ විට ඔවුන්ගේ බලපෑම භාවිතා කරයි. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් බොහෝ විට අවි ආයුධ හා උණ්ඩ මිලදී ගැනීම, හෝ ජාත්‍යන්තර වෙළෙන්දන් මහා පරිමාණ ගිවිසුම් ඇතුළු ඉහළ අගයක් ගන්නා ජාත්‍යන්තර ප්‍රසම්පාදන ගනුදෙනු ඉලක්ක කරති. 2021 මුල් භාගයේදී අල් ජසීරා විමර්ශනයක් විසින් බංග්ලාදේශ හමුදාව ඊශ්‍රායල සමාගමකින් නවීන නිරීක්ෂණ උපකරණ මිලදී ගෙන හංගේරියාවේ දැනට නොපවතින සමාගමක නමින් මිලදී ගැනීමේ ලේඛන කූට ලෙස වෙනස් කර ඇති බවට චෝදනා කළේය. එමෙන්ම [exposé](#) විසින් වත්මන් බංග්ලාදේශ හමුදා ප්‍රධානියාගේ සහෝදරයා එහි ප්‍රාථමික ගනුදෙනු සම්බන්ධීකාරයා බව ද අනාවරණය කර සිටියේය.

### අපරාධ හා සම්බන්ධ සහ සඟවන ලද මුදල් විශුද්ධිකරණය කිරීම

ඔවුන්ගේ පුරෝකථනය කළ අපරාධ හෝ අනාගත අභිප්‍රායන් කුමක් වුවද, සියලු චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් තමන්ගේ නීති විරෝධී අරමුදල් ප්‍රභවයන් සඟවා තබා ගැනීමේ හැකියාව මත රැඳී සිටිති. එසේ කිරීම සඳහා, ඔවුන් සෑම විටම පාහේ ඔවුන්ගේ උපන් රට හැර වෙනත් බල ප්‍රදේශවල පදනම් වූ අවශ්‍ය නිපුණතා හා විශේෂඥතාවයන් සහිත වෘත්තීය අතරමැදියන්ගේ සේවය ලබා ගනී. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් සහ වෙනත් අපරාධකරුවන් තම බඩු මලු තුළ මුදල් ජාවාරම් කිරීමේ සිට සංකීර්ණ දර්පණ වෙළඳ සැලසුම් හරහා දක්වා අපරාධවලින් ලැබෙන මුදල් විශුද්ධිකරණය කිරීමට ඔවුන් සතුව ඇති ඕනෑම උපක්‍රමයක් භාවිතා කරයි. නමුත් ඕනෑම මුදල් විශුද්ධිකරණ යෝජනා ක්‍රමයකට මූලික අදියර තුනක් තිබේ:

1. **ස්ථානගත කිරීම:** නීති විරෝධී අරමුදල් සාපරාධී ක්‍රියාකාරකම් වලින් දුරස් කිරීම. මෙය අල්ලසක් ලබා ගත් මුදල් බැංකු ගිණුමකට තැන්පත් කිරීම තරම් සරල විය හැකිය.

2. **යටපත් කර සැඟවීම:** නීතිවිරෝධී ලෙස උපයා ගත් අරමුදල්වල ප්‍රභවය, සාමාන්‍යයෙන් විවිධ නීතිමය මෙවලම් (විශේෂයෙන් නාමික සමාගම්) සහ විවිධ

බල ප්‍රදේශවල වූ මූල්‍ය ආයතන හරහා.සැඟවීම. මෙම අදියරය තුළ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් බොහෝ විට නීතිඥයින්, සමාගම් නියෝජිතයින්, ගණකාධිවරුන්, බැංකුකරුවන් සහ අරමුදල් සහ ආයෝජන කළමනාකරුවන් මත තම විශ්වාසය රඳවා තබති.

3. **ඒකාබද්ධ කිරීම:** සාර්ථකව විශුද්ධිකරණය කරන ලද අරමුදල් වත්කම් හා ආයෝජන ලෙස නීත්‍යානුකූල ආර්ථිකය තුළ නැවත ඉස්මතු වේ. යටපත් කර සැඟවීම සඳහා සහාය වූ අයට අමතරව, දේපල වෙළඳාම් නියෝජිතයන්, කලාත්මක හා පුරාවස්තු අලෙවිකරුවන් සහ සුබෝපභෝගී භාණ්ඩ වෙළෙන්දන් බොහෝ විට මේ හා සම්බන්ධ වී සිටිති.

මූල්‍ය පද්ධතිය තුළ විධිමත් නාලිකා තුළ වූ තෙවන පාර්ශවීය නාමික ආයතන හෝ අක් වෙරළ ගිණුම් හරහා සහ රහසිගත හෝ බදු ක්ෂේමස්ථාන තුළ පිහිටුවා ඇති නීතිමය ආයතන හරහා අරමුදල් ගලා යා හැකිය. තොග මුදල් ජාවාරම, අවිධිමත් වටිනාකම් හුවමාරු පද්ධති (IVTS) හෝ මුදල් ප්‍රේෂණ හෝ මුදල් කුරියර් සේවා ඇතුළු අවිධිමත් නාලිකා හරහා ද අරමුදල් ගලා යාම කළ හැකිය. කෙසේ වෙතත්, විශාල මුදල් ප්‍රමාණයක් හුවමාරු කිරීම බැංකු වැනි විධිමත් මූල්‍ය ආයතන විසින් අනාවරණය කර ඒ පිළිබඳව අනතුරු ඇඟවීම සිදු කළ හැකිය. මෙම අනතුරු ඇඟවීම් මඟහරවා ගැනීම සඳහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් සමහර විට ද්විපාර්ශ්වික වාණිජ වෙළඳ පද්ධතියේ සංකීර්ණතාවයෙන් වාසි ලබාගත හැකි වෙළඳාම පදනම් කරගත් මුදල් විශුද්ධිකරණය (TBML) භාවිතා කරති. ජාත්‍යන්තර නැව්ගත කිරීම් සඳහා වූ රේගු ප්‍රකාශන සහ වෙළඳ ඉන්වොයිසි අධි තක්සේරු කිරීම හෝ අවතක්සේරු කිරීම මගින් භාණ්ඩ ආනයනය හා අපනයනය TBML විසින් අවභාවිතා කරයි. මෙම නැව්ගත කිරීම් හි දෛනික වෙළඳාමේ දී ඩොලර් බිලියන ගණනක භාණ්ඩ ඇතුළත් වන බැවින්, නැව්ගත කරනු ලබන භෞතික භාණ්ඩ සත්‍යාපනය කිරීමට සහ විෂමතා අනාවරණය කර ගැනීම සඳහා ඒවායේ වටිනාකම තීරණය කිරීමට රේගු නිලධාරීන්ට බොහෝ විට නොහැකි වේ. ගෝලීය මූල්‍ය අඛණ්ඩතාව (GFI) සිදු කළ අධ්‍යයනයක් විසින් ජාත්‍යන්තර වශයෙන් චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් විසින් හුවමාරු කරන අරමුදල් වලින් සියයට 60 කට වඩා වැඩි ප්‍රමාණයක් TBML සතු බවට යෝජනා කරයි.

මෙම අපිරිසිදු අරමුදල් විශුද්ධිකරණය කළ පසුව, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් සාමාන්‍යයෙන් මෙම අරමුදල් ජනප්‍රිය ගමනාන්ත රටවල් වලින් එකකට හුවමාරු කරයි. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ ධනය සඳහා වඩාත්ම කැපී පෙනෙන ගමනාන්ත අතර ලන්ඩන් සහ නිව් යෝර්ක් නගර දෙක පවතී. එම නගර වල දේපල හෝ යටිතල පහසුකම් ආයෝජන මිල අධික වන අතර ඒවායේ ඉහළ වටිනාකම රඳවා ගනු ඇත. කෙසේ වෙතත්, වැඩි වැඩියෙන් චෞර පාලන ත්‍රාන්ත්‍රික ජාලයන් ඩුබායි වැනි බටහිර නොවන අගනගරවල ද වෙනත් ආරක්ෂිත ස්ථාන සොයමින් සිටියි. විශේෂයෙන් බොහෝ බල ප්‍රදේශවල දේපල වෙළඳාම් අවශ්‍යතා මාරු කිරීම සඳහා අඩු වාර්තාකරණ අවශ්‍යතා

## බ්‍රසීලයේ පෙට්‍රොබ්‍රාස් සහ ඔඩෙබ්රෙච් වංචා සිද්ධි

2014 දී, *Operacao Lavo Jato(Operation Car Wash)* නම් අපරාධ විමර්ශනය බ්‍රසීලයේ ආරම්භ වූ අතර, ප්‍රධාන යාන්ත්‍රණය ලෙස වංචනික ප්‍රසම්පාදන සම්බන්ධ වූ ලොව විශාලතම දූෂණ වංචාවලින් එකක් හෙළිදරව් විය. දේශපාලකයින් සහ ආණ්ඩුවේ පරිපාලකයින්, බ්‍රසීලයේ තෙල් හා ගෑස් සමාගම වන පෙට්‍රොබ්‍රාස් වෙතින් වංචාකාරී කොන්ත්‍රාත්තුවලදී අල්ලස් සහ අයථා මුල්‍යමය ගෙවීම් වෙනුවෙන් ඩොලර් බිලියන ගනනක් සංස්ථා දූසිම් ගනනකට ප්‍රදානය කළහ. 2014 වසරේ ෆිෆා ලෝක කුසලාන තරඟාවලිය වැනි විශාල ව්‍යපෘතිවලට සහාය ලබා දුන් ඉදිකිරීම් සමාගමක් වන Grupo OAS වෙත පෙට්‍රොබ්‍රාස් හරහා උද්ධමනිත මිලගණන් යටතේ ඩොලර් බිලියන ගණනක කොන්ත්‍රාත්තුවලට හුවමාරුවක් ලෙස හිටපු බ්‍රසීල ජනපති ලූලා ද සිල්වා ඩොලර් මිලියන 22.1ක අල්ලස් මුදලක් පිළිගත්තේ කෙසේද යන්න පිළිබඳව මූලික මුදල් විශුද්ධිකරණ විමර්ෂණයකදී අනාවරණය කරන ලදී. එම විමර්ෂණය මගින් ඉන් අනතුරුව අනාවරණය කරන ලද්දේ, 2014 වර්ෂයේ පැවති මැතිවරණයේදී ප්‍රතිඵල ශක්තිමත් කිරීම පිණිස Grupo OAS විසින් අදාල අරමුදල්වල කොටසක් ජනපතිවරයාගේ දේශපාලන පක්ෂයට නැවත ලබාදුන් බවයි.

පරීක්ෂකයින් තව තවත් සිය සෙවීම් පුළුල් කළ අතර, බ්‍රසීලයේ දේශපාලනික හා ව්‍යාපාරික පෙලේ ප්‍රභූන් සිය ගණනාවක් අපහසුතාවට ලක් කරමින් අල්ලස් සහ එකඟ වන ලද අල්ලස්වලට හුවමාරු ලෙස කොන්ත්‍රාත්තු පදනම මත සමාගම් ගණනාවක් වෙත බිලියන ගණනින් මුදල් සපයන ලද වංචාසහගත ප්‍රසම්පාදන කටයුතු අනාවරණය කරගන්නා ලදී. එසේ බලපෑමට ලක් වූ පාර්ශ්වයන් අතුරින් ලතින් ඇමෙරිකාවේ විශාලතම ඉදිකිරීම් සමූහ ව්‍යාපාරය වන බ්‍රසීලයේ ස්ථාපිත Odebrecht SA බහුජාතික සමාගම ප්‍රධාන විය. Odebrecht SA සමාගම බ්‍රසීලය තුල කොන්ත්‍රාත්තු සඳහා අල්ලස් ලබාදීමට වැරදිකරු වූවා පමණක් නොව, ඩොලර් බිලියන 3.3ක ලාභයක් මත ලතින් ඇමෙරිකාවේ රටවල් 12ක් තුල අල්ලස් ලෙස ඩොලර් මිලියන 788ක් ගෙවමින් සමස්ත මහාද්වීපය පුරා එලෙස සිදු කරන බවට පිළිගන්නා ලදී. Odebrecht SA සමාගමෙන් ලද අරමුදල් මගින් මහාද්වීපය පුරා ජනපතිවරු රැසක් පත්කරගන්නා ලද අතර, ආර්ජන්ටිනාව, කොලොම්බියාව, ඉක්වදෝරය, පේරු සහ වෙනිසියුලාව යන රටවල විමර්ශන සිදු කරමින් පවතී. OAS සේම, Odebrecht SA සමාගම ලුයිස් ලූලා ද සිල්වාගේ අනුප්‍රාප්තිකයා වන ඩිල්මා රූසෙෆ් සහ රූසෙෆ්ගෙ දෝෂාභියෝගයට පසු ජනපති ධුරයට පත් වූ එවකට උප ජනපති මයිකල් ටේමර් වෙතද නීත්‍යනුකූල නොවන ලෙස අරමුදල් සපයා ඇත.

2015 අප්‍රේල් වන විට දේශපාලන අවභාවිතය හා දුස්කළමනාකරණය හේතුවෙන් හටගත් සමස්ත පාඩුව ඩොලර් බිලියන 17ක් වූ බව පෙට්‍රෝබ්‍රාස්හි නව ප්‍රධාන විධායක නිලධාරි නිවේදනය කළ අතර, ඊට එරෙහි මතභේදාත්මක තත්ත්වයන් හා නීති කෘත්‍යයන්ගෙන් ඉදිරියේ ඇති විය හැකි මූල්‍යමය හානිකර තත්ත්යන් හේතුවෙන් අදාල වසරේ රටේ සමස්ත දල දේශීය නිෂ්පාදිතය සියයට 0.75කින් අඩු විය හැකි බව ආර්ථික විශේෂඥයින් විසින් සොයාගන්නා ලදී.

පවත්වා ගෙන යන බැවින් දේපල වෙළඳාම් චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ ආකර්ෂණය වේ. 2021 දී GFI විසින් සිදු කළ වාර්තාවක් ඇස්තමේන්තු කර ඇත්තේ 2015 සිට 2020 දක්වා කාලය තුළ ඩොලර් බිලියන 2.3 කට වැඩි ප්‍රමාණයක් එක්සත් ජනපද දේපල වෙළඳාම් හරහා මුදල් විශුද්ධිකරණය කර ඇති බවයි-මෙය දේපල වෙළඳාම් මුදල් විශුද්ධිකරණය (REML) ලෙස හැඳින්වේ- එසේ වාර්තා වූ සිද්ධීන්ගෙන් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින් (PEPs) සම්බන්ධ වන අතර එයින් චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් ඊට සම්බන්ධ වී ඇති බවට හඟවයි. මීට අමතරව, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් ඇතුළු ඉහළ ආදායම් ලබන පුද්ගලයින්ගේ REML ක්‍රියාකාරකම් සඳහා නීතිඥයින් සහ දේපල වෙළඳ නියෝජිතයන් ඇතුළු වෘත්තිකයන් නැවත නැවතත් පහසුකම් සලසා ඇති බව GFI වාර්තාවෙන් සොයාගෙන ඇත.

මෙම සියලු ක්‍රියාකාරකම් වලදී, විශේෂයෙන් මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියේදී, වෘත්තීය අතරමැදියන්ගේ කාර්යභාරය ද අවතක්සේරු කළ නොහැකිය. නොදැනුවත් හෝ අක්‍රමික නීතිඥයින්, ගිණුම්කරුවන්, නොතාරිස්වරුන්, බැංකුකරුවන්, දේපළ වෙළඳ නියෝජිතයන් සහ අනෙකුත් වෘත්තිකයන් යොදා ගනිමින් අපරාධ ක්‍රියාදාමයන් සඳහා පෙරමුණක් හා නාලිකාවයක් ලෙස ඔවුන් හරහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ මුදල් හුවමාරු කිරීමට අරමුදල් සහ පදනම් පිහිටුවා ගැනීම සිදු නොවේ නම් ගෝලීය චෞර පාලන තන්ත්‍රය තුළ ඇති ඩොලර් ට්‍රිලියන ගණනක වූ ගැටළුව ද නොපවතිනු ඇත. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් විසින් ක්‍රියාත්මක කරන ලද වඩාත් කම්පන සහගත මුදල් විශුද්ධිකරණ සැලසුම් සමහරක් Deutsche Bank and HSBC බැංකුව ඇතුළුව බහුජාතික බැංකු හා සම්බන්ධ වන අතර, එමගින් ඩොලර් බිලියන ගණනක් මුදල් විශුද්ධිකරණය නිසි ලෙස වැළැක්වීමට හෝ වාර්තා කිරීමට අපොහොසත් වීම නිසා දැඩි ලෙස දඩ මුදල් ද එම බැංකුවලට එරෙහිව නියම කරන ලදී. නීතිඥයින් ද චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ යෝජනා ක්‍රමවල නිරන්තර හවුල්කරුවන් වෙති, එහිදී ඔවුන් නීති විරෝධී අරමුදල් සම්බන්ධ ව්‍යාපාරික ගනුදෙනු වලදී අතරමැදියන් ලෙස සේවය කරති. මෙම නීති වෘත්තිකයන් සමහර විට සම්පූර්ණයෙන් දැනුවත්ව චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ට සේවය කරන අතර, බොහෝ විට ඔවුන් නොසැලකිලිමත්කම නිසා හවුල්කරුවන් බවට ද පත් වෙති; නීති වෘත්තිකයන්ගේ ගෝලීය භූමිකාව පැනමා පේපර්ස් හා සැක සහිත ගනුදෙනුකරුවන් වෙනුවෙන් ආයතන දහස් ගණනක් නිර්මාණය හා පරිපාලනමය සහාය ලබා දුන් පැනමා නීති සමාගමක් වන Mossack Fonseca තීරනාත්මක මැදිහත් වීම විසින් ඉස්මතු කරන ලදී.

## ආර්ථිකය ග්‍රහණය කර ගැනීම

ඉහත සාකච්ඡා කළ පරිදි, සීතල යුද්ධයේ අවසානය පුරාම කම්කරු උපකල්පනය, ගෝලීයකරණය හා ආර්ථික බලවතෙකු ලෙස චීනයේ නැගිටීමත් සමඟ බටහිර රටවලින් ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ස්වභාවිකව පශ්චාත් කොමියුනිස්ට් වාදී හා සංවර්ධනය වෙමින් පවතින ලෝකයට සම්ප්‍රේෂණය විය. අවාසනාවකට මෙන්, එවැනි සම්මතයන් හා භාවිතයන් ව්‍යාප්ත කිරීම, ඇත්ත වශයෙන් ප්‍රාග්ධනය ද, ප්‍රජාතන්ත්‍රවාදය සහ ඒකාධිපති සමාජ අතර ද්වි-මාර්ග නාලිකාවක් බව ඔප්පු වී තිබේ. එමෙන්ම මෙම සංසිද්ධියේ ප්‍රධාන වාහකයා වන්නේ චෞර පාලන තන්ත්‍රයයි.

වඩාත් පැහැදිලිවම, නීතිඥයින්, බැංකුකරුවන්, දේපල වෙළඳ නියෝජිතයන් සහ වෙනත් වෘත්තීය අතරමැදියන්ට දූෂණ හා සම්බන්ධ මුදල් විශුද්ධිකරණය කිරීම සහ එහි නියැළී සිටින චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ කීර්ති නාමය ආරක්ෂා කිරීමට සහ සුදු හුනු ගෑම සඳහා පෙර නොවූ විරූ මූල්‍ය දිරිගැන්වීම් ලබා දී ඇත. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන් තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය පිටුබලය ලබන සමාගම්, කතිපයාධිකාරීන් සහ වෙනත් අපැහැදිලි ප්‍රභවයන් සඟවමින්, චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ කීර්ති නාමය ආරක්ෂා කිරීමට සහ සුදු හුනු ගෑම හි යෙදී සිටින රාජ්‍ය-කටයුතු, රාජ්‍ය-සම්බන්ධතා සහ ලොබි සමාගම් සම්බන්ධයෙන් ද එය එසේම වේ. කෞතුකාගාර, කලාගාර, විශ්ව විද්‍යාල සහ පෞද්ගලික පාසල් වැනි සංස්කෘතික හා අධ්‍යාපන ආයතන ද මෙම පුද්ගලයින්ගේ සහ සංවිධානවල පරිත්‍යාගශීලිත්වයෙන් ප්‍රතිලාභ ලබයි. කතිපයාධිකාරීන් විසින් යුරෝපීය පාපන්දු කණ්ඩායම් පරාජය කිරීමත්, ඒකාධිපතීන්ගේ සමාජ රැස්වීම්වලදී කලාත්මක අංගයන් ඉටු කිරීම සඳහා කීර්තිමත් කලාකරුවන්ට අධික මුදලක් ගෙවීම, ඇමරිකානු ජාතික පැසිපන්දු සංගමය චීන වාරණයට අනුගත වෙමින් ෂින්ජියැන්ග් හි මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ හොලිවුඩ් නිෂ්පාදකයින් කොමියුනිස්ට් පක්ෂයේ උදහසට ලක් නොවන පරිදි චීනය සම්බන්ධ සංවේදී ගැටළු මඟහරවා ගැනීම වැනි දෑ සමඟ ක්‍රීඩා හා විනෝදාස්වාද අංශ පවා ගැඹුරු ඒකාධිපති බලපෑමට ලක්ව ඇත.

ක්‍රමානුකූලව, දූෂණයට වන මෙම නිරාවරණය තමාගේ සාරධර්ම, සම්මතයන් සහ වෘත්තීය ප්‍රමිතීන් කෙරෙහි විඛාදන බලපෑමක් ඇති කළ හැකිය. එවැනි නිරාවරණයක් ප්‍රමාණවත් තරම් පුළුල් වන විටක, ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල වඩාත්ම බලගතු කොටස්කරුවන් අතර ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ කැපවීම පවත්වා ගෙන යන සම්මතයන් සහ උපකල්පනයන් යටපත් කිරීමට ආරම්භ කළ හැකිය.

පාරජාතික දූෂණ සඳහා පහසුකම් සැලසීම සඳහා ඔවුන්ගේ වෘත්තීමය අංශවල භූමිකාවන් වෙත අන්ධ ඇස් යොමු කළ ධනවත් රටවල්, දැන් අපිරිසිදු මුදල් අධික ලෙස ගමන් මලු සමඟ ගමන් කරන බව සොයා ගැනීමට පටන් ගෙන ඇත. 2016 දී පැනමා පත්‍රිකා ලෝකයේ බලවත්ම පුද්ගලයින් තම පෞද්ගලික ධනය ස්ථාන මාරු කර සඟවා ගන්නා ආකාරය පිළිබඳ පෙර නොවූ විරූ ඉඟියක් ලබා දුන්නේය. එක්සත් ජනපදයේ, 2016 මැතිවරණයේදී රුසියාවේ මැදිහත්වීම පිළිබඳ විශේෂ උපදේශන විමර්ශනයෙන් හෙළි වූයේ වොෂිංටන් ඩීසී හි බලපෑම් වෙළඳපොල සහ ලෝකයේ වඩාත්ම දූෂිත පාලන තන්ත්‍රයන් අතර පැවති දිගුකාලීන සම්බන්ධතාවයයි. ප්‍රධාන බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු වාර්තාව කින් හෙළි වූයේ රුසියානු ආයෝජන යම් තාක් දුරට දේශපාලන බලපෑමේ පුරෝගාමියෙකු ලෙස ක්‍රියා කර ඇති අතරම එය "විසඳිය නොහැකි" දෙයක් බවයි. එමෙන්ම යුරෝපා සංගම් මූල්‍ය අංශය ද ඩොලර් බිලියන සිය ගණනක සැක සහිත

ගනුදෙනු කිසිදු අනතුරු ඇඟවීමක් මතු නොකර යුරෝපා සංගම් මූල්‍ය පද්ධතියට ඇතුළු වූ බැංකු වංචාව කින් තවමත් පීඩා විඳිමින් සිටී.

දූෂිත සාරධර්ම, භාවිතයන් සහ සම්මතයන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවලට සම්ප්‍රේෂණය කිරීම අනිවාර්යයෙන්ම ලෝකයේ ඒකාධිපති නායකයින් අතර ප්‍රවේශමෙන් සම්බන්ධීකරණය කරන ලද ප්‍රධාන සැලැස්මක් නොවන බව සැලකිල්ලට ගැනීම ද ඉතා වැදගත් වේ. ප්‍රමාණවත් ආරක්ෂාකාරී ක්‍රියාමාර්ගයක් නොමැතිව ඒකාධිපති පාලන තන්ත්‍රයන්ගෙන් එන ප්‍රාග්ධනයට ඔවුන්ගේ මූල්‍ය පද්ධති සහ සමාජයන් විවෘත කිරීම ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වාභාවික හා පුරෝකථනය කළ හැකි අතුරු ඵලයක් වෙයි. එහෙත් එහි බලපෑම වන්නේ පාරජාතික දූෂණයේ වාසි සහ දූෂණයට හේතු වන සාධක සහ පාරජාතික දූෂණයේ ප්‍රතිලාභවලට යටත්ව ප්‍රජාතන්ත්‍රවාදී රටවල වෘත්තිකයන් වැඩි වැඩියෙන් ආකර්ෂණය කර ගැනීමයි. සරලව කිවහොත්, ඔවුන්ගේ ජීවනෝපාය සඳහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ට සේවය කිරීම මත යැපෙන අය ඒකාධිපති චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ පාලනයට එරෙහිව සටන් කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර්ගයන්ට සහාය දැක්වීමට ඇති ඉඩකඩ බෙහෙවින් අඩුය.

## බලහත්කාරය හා ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ ක්‍රමෝපායන්

### පාරජාතික මර්දන ව්‍යාපාර

ඒකාධිපති පාලන තන්ත්‍රයන් වෙනත් රටවල විවේචකයින්, විරුද්ධවාදීන් සහ ඩයස්පෝරාව බොහෝ හේතු නිසා ඉලක්ක කරන නමුත් දූෂණය එවැනි ක්‍රියාකාරකම්වල පොදු ලක්ෂණයක් ලෙස පවතී. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් නිතරම උත්සාහ කරන්නේ තමන්ගේම දූෂිත භාවිතයන් පිළිබඳ ජාත්‍යන්තර පරීක්ෂාව යටපත් කිරීමට සහ ලොව පුරා සිටින විරුද්ධවාදීන්ට මඩ ගැසීමට හා බාධා කිරීමට දූෂණ චෝදනා භාවිතා කිරීමයි.

එවැනි උත්සාහයන් සඳහා වෘත්තීය අතරමැදියන් කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කිරීම ද පුදුමයක් නොවේ. සැලකිය යුතු නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට පෙර විමර්ශන මාධ්‍යවේදීන්ට සහ සිවිල් සමාජ සංවිධානවලට අධික නීතිමය පිරිවැයක් දැරීමට නීතිඥයින් විසින් අසාධාරණ ලෙස නඩු පැවරීමද සිදු විය හැකිය. ප්‍රතිවාදී චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් ලුහුබැඳීම සඳහා ඔවුන්ට විදේශීය නීති පද්ධති භාවිතා කළ හැකිය, ඒ පිළිබඳ වඩාත් කුප්‍රකට උදාහරණය වන්නේ 2000 දශකයේ ලන්ඩනයේ රුසියානු කතිපයාධිකාරීන් අතර පුළුල් ලෙස නඩු පවරා ගැනීමයි.

රාජ්‍ය සම්බන්ධතා සමාගම් සහ බලපෑම් කළ හැකි ලොබිවාදීන්, ඊට වෙනස් ආකාරයකින් බොහෝ විට ආරක්ෂක කාර්යභාරයක් ඉටු කරන්නේ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ අඳුරු මූලාරම්භය සඟවා සුදු හුනු ගෑමට සහ ඔවුන් නීත්‍යානුකූල නායකයින්, ව්‍යාපාරිකයින් හෝ දානපතියන් ලෙස ඉදිරිපත් කිරීමට උදව් කිරීමෙනි. මඩ ගැසීමේ ව්‍යාපාර හරහා දේශපාලන විරුද්ධවාදීන් ඉලක්ක කර ගැනීමට ද ඒවා භාවිතා කළ හැකිය - එහිදී බොහෝ විට සෙසු චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ට බිය වී එහි දූෂිත රහස් හෙළිදරව් කිරීමට තර්ජනය කරයි.

ස්වාභාවික ලෙස, ඉහත විස්තර කර ඇති ආකාරයේ සැලකිය යුතු ආර්ථික ග්‍රහණයක් පවතින රටවල මෙම ආකාරයේ ක්‍රියාකාරකම් පහසු වන අතරම, දූෂණ හා මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වල නිරත ඒකාධිපති පාලන තන්ත්‍රයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම පිළිගත හැකි දෙයක් ලෙස පත්ව ඇත.

ඒ හා සමානව නැතහොත් ඊටත් වඩා සැලකිලිමත් විය යුතු කරුණ නම්, වැඩි අවධානයක් යොමු නොවන්නේ නම්, විදේශීය දේශපාලන ප්‍රතිවාදීන් ලුහුබැඳීම සඳහා ජාත්‍යන්තර නීතිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයන් ජය ගැනීමට ඒකාධිපති පාලන තන්ත්‍රයන් විසින් උත්සාහ කිරීමයි. චීනයේ Xi හි දේශීය දූෂණ විරෝධී ව්‍යාපාරයේ විදේශීය දිගුවක් වන - Operation Fox Hunt - වඩාත්ම ව්‍යාජ චෝදනා මත පාලන තන්ත්‍රයට තර්ජනයක් වන බව වටහාගෙන ඇති චීන ජාතිකයින්ට හිරිහැර කිරීම සහ බලහත්කාරයෙන් මෙරටට ගෙන්වා ගැනීම සඳහා අදාළ පිටුවහල් කිරීමේ ගිවිසුම් අවභාවිතා කර ඇත. රුසියාව සිය විවේචකයින්ට එරෙහිව ඉන්ටර්පෝල් රතු දැන්වීම් අනිසි ලෙස භාවිතා කිරීම ද හොඳින් ලේඛනගත කර ඇත: සියලු දෙනා දන්නා පරිදි එහිදී දැවැන්ත බදු වංචාවක් අනාවරණය කර ගැනීමෙන් පසු රුසියානු බලධාරීන් විසින් නීතිඥ සර්ජි මැග්නිට්ස්කි ඝාතනය කිරීම ප්‍රසිද්ධ කිරීමට ගත් උත්සාහය නිසා මූල්‍ය සැපයුම්කරු බිල් බ්‍රව්ඩරයට හිරිහැර කිරීමට එම සිද්ධිය ප්‍රසිද්ධව භාවිතා කළේය.

## නාමකරණය සහ ආඛ්‍යාන පදනම් කරගත් ක්‍රමෝපායන්

### කීර්තිනාම විශුද්ධිකරණය

විශ්ව විද්‍යාල, චින්තකයින් සහ සංස්කෘතික ආයතන සඳහා පරිත්‍යාග කිරීමෙන් චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් ඔවුන්ගේ නීති විරෝධී අරමුදල් විශුද්ධිකරණය කර ඔවුන්ගේ කීර්තිනාමය ද වර්ධනය කරගෙන තිබේ. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්, දානපතියන් හා කලා අනුග්‍රාහකයන් ලෙස ඔවුන්ගේ ප්‍රතිරූපය වර්ධනය කර ගන්නා අතරතුර, ඔවුන්ගේ නීති විරෝධී ක්‍රියාකාරකම් වලින් අවධානය වෙනතකට හරවා, ඔවුන්ගේ ධනය විශුද්ධිකරණය කිරීම සහ ප්‍රභූ විශ්ව විද්‍යාල හා සංස්කෘතික ආයතන සමඟ සම්බන්ධ වීමෙන් සමාජ හා ප්‍රාග්ධන ප්‍රතිලාභද ලබා ගනිති.

මෙම වාසිවලින් චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් විදේශයන්හි මෙන්ම තම රට තුළද ප්‍රතිලාභ ලබයි. බටහිර ප්‍රභූ ඝනයේ විශ්ව විද්‍යාල සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම, විශේෂයෙන් විශාල පරිත්‍යාගයන් නිසාවෙන් චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ට හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට ප්‍රමුඛතාවය ලබා දීම, හරහා තම රටේ සමාජ තත්ත්වය කීර්ති නාමය ඉහළ නැංවීමට හේතු විය හැකිය. එපමණක් නොව, විශ්ව විද්‍යාල සහ චින්තකයින් සඳහා පරිත්‍යාග කිරීම මගින් පර්යේෂණ වලට බලපෑම් කිරීමෙන් හෝ

අධ්‍යාපනය හා සම්බන්ධ උත්සවවලදී කථික අවස්ථා ලබා ගැනීමෙන් මහජන කතිකාවත් හැඩගැස්වීමට චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ට සඳහා අවස්ථාව ඇති කර දීමට හැකිය. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් විසින් - බටහිර ආයතනවලට ඔවුන්ගේ සහයෝගය ලබා දීමෙන් විදේශයන්හි බලගතු ප්‍රභූන් අතර අනුග්‍රහය ලබා ගැනීම හෝ ඔවුන් චින්තකයන් හා විශ්ව විද්‍යාල වලට කරන්නා වූ බලපෑම හරහා ඔවුන් තම රටේ පිහිටුවන ප්‍රජාතන්ත්‍ර විරෝදී ආණ්ඩුවක් සාමාන්‍යකරණය කිරීම මගින් - තම මව් රටේ කීර්ති නාමය ඉහළ නැංවීමට හෝ දුර්වල මූල්‍ය විනිවිදභාවයකින් යුත් පාලන තන්ත්‍රයන් ආරක්ෂා කිරීමට පරිත්‍යාග භාවිතා කළ හැකිය.

කීර්තිනාම විශුද්ධිකරණය විවිධ තර්ජන ඇති කරන අතර පාරජාතික චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ ජාලය තවදුරටත් ශක්තිමත් කරයි. දූෂිත පුද්ගලයින්ගෙන් විශාල පරිත්‍යාග භාර ගන්නා ආයතන එමගින් ඔවුන්ගේ කීර්ති නාමයට හානි කළ හැකිය. විශ්ව විද්‍යාලයක සාමාජිකයෙකු හෝ චින්තකයෙකු ස්වයං වාරණයක් පවරන්නේ නම් හෝ ධනවත් පරිත්‍යාගශීලීන්ගේ අදහස් කෙරෙහි අනවශ්‍ය වැඩි අවධානයක් යොමු කරන්නේ නම්, ආයතනයේ හෝ චින්තකයින්ගේ පර්යේෂණ හා ක්‍රියාකාරකම්වල අඛණ්ඩතාව ද අඩපණ විය හැකිය. එපමණක් නොව, කීර්තිනාම විශුද්ධිකරණය සඳහා විශ්ව විද්‍යාල හෝ වෙනත් ආයතන සාර්ථකව භාවිතා කිරීම චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් හට ඔවුන්ගේ ප්‍රජාවන්හි සහ විදේශයන්හි ඔවුන්ගේ තත්වය ශක්තිමත් කර ඔවුන්ගේ බල පදනම ද ශක්තිමත් කරයි.

කීර්ති නාම විශුද්ධිකරණය යනු මූලික වශයෙන් අන්තර්ජාතික ප්‍රවේශයක් වන අතර එය චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන්ගේ අනිසි ධනයේ ප්‍රභවයන් සැඟවීම සඳහා අතිච්ඡාදනය වන චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් සහ නීති විරෝධී ජාලයන් මත රඳා පවතින අතර විශ්ව විද්‍යාල සහ වෙනත් ආයතනවලට එවැනි විශාල පරිත්‍යාග පිළිබඳව නිසි සත්‍යාපන ක්‍රියාදාමයක් ක්‍රියාත්මක කිරීම දුෂ්කර කාර්යයක් වේ. එක්සත් ජනපදයේ පදනම් හෝ වෙනත් නීත්‍යානුකූල ආයතන පිහිටුවීම හරහා චෞර පාලන ත්‍රාන්ත්‍රිකයන් ඔවුන්ගේ පරිත්‍යාගවල විදේශීය ප්‍රභවයන් සැඟවීමට ද හැකි වනු ඇත. එක්සත් ජනපදයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුව, මෑත වසරවලදී විශ්ව විද්‍යාල සඳහා ලැබෙන විදේශ පරිත්‍යාග වැඩිවීම ත් සමඟ එය 2007 සිට 2013 දක්වා ඩොලර් බිලියනයක සිට 2013 සිට 2019 දක්වා ඩොලර් බිලියන 4 කට වඩා වැඩි වී තිබෙන අතර, එමගින් තරඟකාරීත්වය පවත්වා ගැනීම සඳහා විදේශීය පරිත්‍යාග භාර ගැනීමට විශ්ව විද්‍යාල දිරිමත් කරනු ලබන අතරම නීති විරෝධී ප්‍රභවයන්ගෙන් ලැබෙන පරිත්‍යාග වැළැක්වීම සඳහා පුළුල් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ උත්සාහයන්ට ද බාධා කරයි.

කීර්තිනාමය විශුද්ධිකරණය, විශාල තෑගි පරිත්‍යාග කිරීමේ විෂයය පථයෙන් ඔබ්බට ද යා හැකිය; චෞර පාලන ත්‍රාන්ත්‍රික පාලන තන්ත්‍රයන් තම රටවල කීර්තිනාමය හෝ ඔවුන්ගේ පුද්ගලික කීර්තිනාමය ඉහළ නැංවීම සඳහා සංචාරක කර්මාන්තය, සමාජ මාධ්‍ය සහ පොප් සංස්කෘතිය ප්‍රයෝජනයට ගත හැකිය. පෞද්ගලික සාදවල හෝ ප්‍රසිද්ධ උත්සවවලදී චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ට සහය දක්වමින් සිය කලා නිර්මාණ ඉදිරිපත් කිරීම වෙනුවෙන් ජනප්‍රිය සංගීතඥයන් හෝ නළු නිළියන් සඳහා මුදල් ගෙවීමට නීති විරෝධී අරමුදල් භාවිතා කිරීම, ඔවුන්ගේ භාවිතයන් කෙරෙහි ඇති අපසහායකත්වය වැඩි කරන අතර මහජනයා විසින් වැලඳ ගන්නා "යහපත්" පෞරුෂයක් ඔවුන් කෙරෙහි ඇති කෙරේ. සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සහ ඔවුන්ගේ නීති විරෝධී ක්‍රියාකාරකම් වෙත යොමුවන අවධානය වෙනතකට යොමු කිරීම සඳහා, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ සිටින රටක් ලෙස හෝ දේශගුණික විපර්යාසවලට එරෙහි සටන වැනි ජනප්‍රිය ව්‍යාපාරවලට සහාය දක්වන රටක් ලෙස ප්‍රතිරූපයක් මවා පාමින් චෞර පාලන ත්‍රාන්ත්‍රිකයෝ තම රටවල් සංචාරකයින්හට උපායශීලී ලෙස අලෙවි කළ හැකිය.

මෙම අර්ථයෙන් ගත් කළ කීර්තිනාම විශුද්ධිකරණය කිරීම චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් පිළිබඳ හෙළිදරව් කිරීමට උත්සාහ කරන දේශීය ක්‍රියාකාරීන්ට තර්ජනයක් වන අතර, ඔවුහු වාරණයට හෝ මර්දනයට ලක්වීමේ ඉලක්ක බවට එමගින් පත්වෙති. ඊට අමතරව, සංචාරකයින් හෝ සමාජ මාධ්‍ය භාවිතා කරන්නන් වැනි පුලුල් පදනමක් සහිත ජනගහණයන් ඉලක්ක කර කීර්තිනාම විශුද්ධිකරණයේ අත්කරගන්නා සාර්ථකත්වය චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සහ ඔවුන්ගේ භාවිතයන් සාමාන්‍යකරණය කරන අතර ඇතැම් විට උත්කර්ෂයට නංවයි.

## සංවර්ධන ආඛ්‍යාන

චෞර පාලන ත්‍රාන්ත්‍රික පාලකයින් ඔවුන්ගේ ඒක-පක්ෂ රාජ්‍යයට, "දයාබර" අධිකාරවාදී පාලන තන්ත්‍රයට හෝ සීමිත ප්‍රජාතන්ත්‍රවාදයට යකඩ රාජ්‍ය පාලනයක් හරහා ආර්ථික ආශ්චර්යයක් හෝ වේගවත් ආර්ථික සංවර්ධනයක් ඇති කළ හැකි බවට වාගලංකාරක්තීන් භාවිතා කරමින් ජාත්‍යන්තරව සත්නාම මෙවලමක් ලෙස සංවර්ධනය වටා ආඛ්‍යාන යෙදිය හැකිය. මෙම තර්කනය තුළ ප්‍රජාතන්ත්‍රවාදයට වඩා ආර්ථික සංවර්ධනය ප්‍රමුඛත්වය ගනී. බොහෝ චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සාර්ථක අන්දමින් තර්ක කර ඇත්තේ ඔවුන්ගේ සංවර්ධනය වෙමින් පවතින ජාතිය ප්‍රජාතන්ත්‍රවාදයේ "මනෝරාජික" පරමාදර්ශය සමඟ යම් යම් ප්‍රායෝගික සම්මුතීන් ඇති කර ගත යුතු බවයි. කෙසේවෙතත්, මිනිසුන්ට අයිතිවාසිකම් අවශ්‍ය වීමට පෙර ආහාර අවශ්‍ය වන අතර, යහපාලනයට වඩා ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම ඉතා වැදගත් ය. මෙම සංවර්ධන ආඛ්‍යානය වෙනත් ආකාරයකින් ද ප්‍රයෝජනවත් වේ: එනම්, විදේශ අරමුදල් මගින් සිදුකෙරෙන ඉදිකිරීම් සහ යටිතල පහසුකම් ව්‍යාපෘති චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සඳහා ලාභ උපදවන ඉලක්ක වේ. මේ ආකාරයට සංවර්ධනය කේන්ද්‍ර කරගත් ආඛ්‍යාන ප්‍රවර්ධනය කිරීම වනාහී චෞර පාලන තන්ත්‍රය වෙත ප්‍රතිලාභ සහ ලාභ ගලා ඒම වැඩි කිරීමට දායකවන වඩාත් වක්‍ර මාර්ගයක් වන අතර එමඟින් එය, වඩාත් ඉලක්ක කරගත් කීර්තිනාම විශුද්ධිකරණය කිරීමේ ක්‍රමෝපායට වඩා වෙනස් වේ. විදේශයන්හි ආයෝජන ආකර්ශනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම අපගේ වර්ගීකරණය යටතේ "පාරජාතික" ප්‍රවර්ගය යටතට පත් වුවද, මෙම ආඛ්‍යාන දේශීය හා ජාත්‍යන්තර යන දෙයාකාරයෙන්ම ප්‍රක්ෂේපණය කෙරේ.

# වෛර පාලන තන්ත්‍රය කෙරෙහි පාරජාතික වශයෙන් දක්වනු ලබන ප්‍රතිචාර

අත්පොතේ මෙම කොටස මගින් ජාත්‍යන්තර අල්ලස් ක්‍රියා අපරාධ ලෙස නම් කිරීම හා අල්ලස් ඉල්ලා සිටීම, දූෂිත ක්‍රියාකාරිකයින් හට සීමා පැනවීම, ඒකාධිපති ස්වරූපිත වෛර පාලන තන්ත්‍රයට විරුද්ධව ප්‍රජාතාන්ත්‍රික එකමුතුවක් නිර්මාණය කිරීම, ජාලයක් පරාජය කිරීම පිණිස ජාලයක් නිර්මාණය කිරීම හා ආගමන කාර්යය තුල පවත්නා අඩුලුහුඩුකම් නවතාලීම ඇතුළු වෛර පාලන තන්ත්‍රය වෙත ජාත්‍යන්තර ප්‍රජාව දක්වන ප්‍රතිචාර විදහා දක්වයි. ජාත්‍යන්තර ක්‍රියාකාරීන්, ඉලක්කගත රටවල සංවිධාන සහ ක්‍රියාකාරී පුද්ගලයින් ඇතුළු සිය මව් රටෙන් පිටත සිදුවන දූෂණ ක්‍රියාවලට විරුද්ධව කටයුතු කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරී පුද්ගලයින් වෙනුවෙන් මෙම ප්‍රතිචාර අදාල කරගනී.

සිය ආයතන සුරක්ෂිත කරගැනීම සහ දූෂණයට විරුද්ධ කටයුතුවල නියුතු ආයතන වෙත සහාය ලබාදීම මගින් නීතිය බලාත්මක කිරීම, ආර්ථික වශයෙන් රාජ්‍ය පාලන ක්‍රමය හා සිවිල් සමාජය මත ඇති කරන පීඩනය ඔස්සේ වෛර පාලන තන්ත්‍රය ඉලක්කගත කිරීම ආරම්භ කිරීම සඳහා සුරක්ෂිත, විශ්වාසනීය හා බලගතු තත්ත්වයක් තුල ප්‍රජාතාන්ත්‍රික සමාජ (මෙන්ම ප්‍රජාතාන්ත්‍රික ක්‍රමයට පරිවර්තනය වෙමින් සිටින සමාජද) පවතිනු ඇත.

## විදෙස් අල්ලස් ගැනීම් හා අල්ලස් සඳහා පෙළඹවීම අපරාධ ලෙස නම් කිරීම

විදෙස් දූෂණ ක්‍රියාකාරකම් පනත - Foreign Corrupt Practices Act මගින් විදෙස් රටවල මෙහෙයුම් කටයුතු සිදු කරන සිය සමාගම් මගින්ම විදෙස් නිලධාරීන් විසින් සිදු කරන අල්ලස් කටයුතු අපරාධ ලෙස නම් කිරීම 1977දී පළමු වරට එක්සත් ජනපදය විසින් සිදු කරන ලදී. එතැන් සිට රටවල් ගණනාවක් විසින් පුනරුපණය කර ඇති පරිදි එම රටවල දූෂණය පැතිරවීමට හෝ එම තත්ත්වය උත්සන්න කිරීමට කටයුතු නොකිරීම අතිශය වැදගත් වගකීමක් වූයේ සැබැවින්ම එය OECD Anti-Bribery Convention අල්ලස් විරෝධී සම්මුතියේ හරයාත්මක අවශ්‍යතාවක් වන හෙයිනි. එසේ වුවද, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් සංවිධානයේ විශ්ලේෂණය මගින් පෙන්වා දෙන්නේ එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ස්විට්සර්ලන්තය සහ ඊශ්‍රායලය යන රටවල් හතර පමණක් විදෙස් අල්ලස් හා සම්බන්ධ නීති සම්පාදන කාර්යයෙහි සක්‍රීය ලෙස නියුතු බව සහ ලෝකයේ අපනයනවලින් අඩකට ආසන්න ප්‍රමාණයක් සපයන රටවල් ඊට දඬුවම් පමුණුවාලන්නේ නැති බවයි. ඒ අනුව, විදෙස් අල්ලසට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම වැඩිදියුණු කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවක් වන්නේය.

එමගින් පවා තමා විසින්ම අල්ලස් ඉල්ලා සිටින හෝ බලෙන් ලබාගන්නා දූෂිත විදෙස් නිලධාරීන් ඉලක්ක කිරීම පිළිබඳ කිසිවක් සිදු නොකෙරේ. වෛර පාලන තන්ත්‍රය දිරිමත් කරන සමාගම් පමණක්ම නොව වෛර පාලන තන්ත්‍රයද ඉලක්ක කිරීමට නීතිය බලාත්මක කරනු ලබන ආයතනවලට හැකිවනු පිණිස අල්ලස් සඳහා පෙළඹවීම අපරාධයක් ලෙස නම් කිරීම මීළඟ තාර්කික පියවර වෙයි. සත්‍ය ලෙසම, අන්‍යයන් තමන් හටද එසේ සිදු කරනු ඇතැයි යන අදහස හේතුවෙන් බොහෝ රජයන් විසින් සිදු කිරීමට මැලිවන, සිය දේශසීමාවන් තුල සිදු විය නොහැකි අපරාධ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ බලාධිකාරය ප්‍රදානය කිරීම ද ඇතුලත් ය. එහෙත්, පාරජාතික දූෂණය මගින් සිදු වන හානිය දරුණු හා විශ්වීය කරුණක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී රටවල් විසින් සලකනු ලබන බව හා නීතියේ ආධිපත්‍යය දූෂිත අධිකාරවාදී පාලන තන්ත්‍රවලට අදාල කරගැනීම මගින් වෛර පාලන තන්ත්‍රයට එරෙහිව පහරදීමට ඔවුන්ට ඉඩ හසර සලසන බවටත් පැහැදිලි පණිවුඩයක් එමගින් ලබා දෙයි.

## දූෂිත ක්‍රියාකරුවන්ට සම්බාධක පැනවීම

වෛර පාලන තාන්ත්‍රිකයින් නීතිය ක්‍රියාත්මක කිරීමට ඔබ්බෙන් සිටින විට, දූෂිත ක්‍රියාකරුවන්ගේ නම් ඉදිරිපත් කිරීමට හා අපකීර්තියට පත් කිරීමට, ඔවුන්ගේ කටයුතු අඩාල කිරීමට හා ඔවුන් වගකිව යුතු පිරිසක් බවට පත් කිරීමට ප්‍රයත්න දැරීමට ප්‍රජාතාන්ත්‍රික රජයන් විසින් විවිධාකාර සම්බාධක භාවිත කළ හැකිය. ගෝලීය විනිමය ඒකකයක් ලෙස එක්සත් ජනපද ඩොලරය ගත් කල, විශේෂයෙන්ම එක්සත් ජනපදය වැනි ප්‍රධාන පෙළේ මූල්‍ය මධ්‍යස්ථාන සඳහා එය සුවිශේෂී උපකරණයක් වේ.

එනමුත්, විදෙස් දූෂණයට එරෙහිව තමන්ගේම සම්බාධක පැනවීම් හඳුන්වා දීම සලකා බැලීම කුඩා ප්‍රජාතාන්ත්‍රික රටවලටද වැදගත් වේ. මෙය ප්‍රජාතාන්ත්‍රික එකමුතුබව පිළිබඳ වැදගත් පණිවුඩයක් ලබා දෙනවා පමණක් නොව දූෂණයෙන් උපයනු ලබන ආදායම් රටක මූල්‍ය පද්ධතියට ඇතුල්වීම වැළැක්වීම මගින් ආරක්ෂිත භූමිකාවක් තුල සම්බාධක පැනවීම් භාවිත කිරීමද සිදු කරයි.

අහිංසක ජනයා මත ආර්ථික වශයෙන් අහිතකර ලෙස අතුරු බලපෑම් ඇති කිරීමේ හැකියාව සලකා, විදේශ ප්‍රතිපත්තියෙහි උපකරණ ලෙස ආර්ථික සම්බාධක අධිභාවිත කිරීම හෝ පුළුල් ලෙස භාවිත කිරීම පිළිබඳ නිත්‍ය හා වර්ධනය වන විවාදයක් පවතී. එසේ වුවද, පුළුල් ජනකායක් මත බලපෑමක් ඇති නොකරමින් නිශ්චිත පුද්ගලයින් සහ ඔවුන්ගේ සමීපතමයින් හට දඬුවම් පමුණුවාලීමට Global Magnitsky Act වැනි වැඩසටහන් මගින් ඉලක්කගත සම්බාධක භාවිත කරනු ලබයි. මානව හිමිකම් අපහරණය කිරීම් සහ දූෂණ ක්‍රියාවලට පුද්ගලයින් සෘජුවම වගකියන හා වගවන තත්වයට පත්කිරීම මගින් එසේ සිදුවීම වැළැක්වීම සඳහා ඉලක්කගත සම්බාධක බලගතු උපකරණ ලෙස ක්‍රියා කරයි.

මෑතකාලීනව, විශේෂයෙන් සම ලෙස සිතන ලිබරල් ප්‍රජාතාන්ත්‍රික රටවල් තුළ දූෂණය සම්බන්ධයෙන්

සම්බාධක පනවා ඇති ලැයිස්තු තුල පුද්ගලයින් සහ ආයතන නම් කිරීමෙහි ගෝලීය වශයෙන් ඉහළ යාමක් පවතී. ත්‍රස්ත විරෝධී සම්බාධක නම් කිරීම හා සමානව, ලැයිස්තුගත කරන ලද පුද්ගලයින් මූල්‍ය සහ වීසා ගණුදෙණුවලට මැදිහත්වීම සම්බන්ධයෙන් මෙම ලැයිස්තු මගින් යම් බලසම්පන්න බලපෑමක් ඇති කළ හැකිය. එසේ වුවද, එක්සත් ජාතින්ගේ ආරක්ෂක මණ්ඩලය මගින් ඉදිරිපත් කරන ලද ත්‍රස්ත විරෝධී සම්බාධක මෙන් නොව, දූෂණ විරෝධී සම්බාධක ලැයිස්තු මූලික වශයෙන් ඒකාබද්ධ වී නොපවතින ජාතික තීරණ මත තවමත් රඳා පවතී. චෞර පාලන තන්ත්‍රයට එරෙහි පාරජාතික ප්‍රජාවේ ප්‍රතිචාර ශක්තිමත් කිරීම වෙනුවෙන් වඩාත් ඵලදායී යටපත් කිරීමේ ජාලයන් ගොඩනැංවීම සඳහා දේශසීමා හරහා දේශීය සම්බාධක පැනවීම් ප්‍රයත්නයන් වැඩි වශයෙන් සම්බන්ධීකරණය කළ යුතුය.

## අධිකාරවාදී චෞර පාලන තන්ත්‍රයට එරෙහි ප්‍රජාතාන්ත්‍රික එකමුතුබව

අදාල රජයන් විසින් කඩිනමින් ගත හැකි මීළඟ පියවර වන්නේ ගෝලීය මූල්‍ය පද්ධතිය අපහරණය කිරීම තවදුරටත් නොඉවසන බවට අධිකාරවාදී පාලන තන්ත්‍රයන් වෙත ශක්තිමත්, විශ්වසනීය හා පැහැදිලි පණිවිඩයක් ලබා දීම වන අතර, ඒ අතරේදී අනෙක් ප්‍රජාතාන්ත්‍රික රටවල් සමඟ හැකිතාක් දුරට මුදල් විශුද්ධිකරණයට හා දූෂණයට එරෙහිව දැනට පවත්නා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීමද සිදු කරමින් එය සිදු කළ යුතුය.

බොහෝ රටවලට මෙය දූෂණයට එරෙහි UN Convention Against Corruption, Anti-Bribery Convention, Financial Action Task Force මූල්‍ය කටයුතු කාර්යසාධක බලකායේ නිර්දේශ සහ වෙනත් අදාල ගිවිසුම් යටතේ දැනටමත් සකස් කර ඇති වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන අතිමහත් ප්‍රයත්නයන් වේ. එක්සත් ජාතින්ගේ සංවිධානය, ජී7 කණ්ඩායම, ජී20 කණ්ඩායම, සහ මූල්‍ය කටයුතු කාර්යසාධන බලකාය වැනි ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර ආයතනවලදී මෙම ගැටලුව පිළිබඳ දැඩි ලෙස අවධානය යොමු කිරීමද අදහස් කරයි.

වර්ෂ 2000 කාල සීමාව තුල නීත්‍යනුකූල දේශපාලන විරුද්ධ පාර්ශ්වය ඉලක්ක කරමින් අධිකාරවාදී පාලන තන්ත්‍රයන් විසින් නිරන්තරයෙන් ත්‍රස්ත විරෝධී පියවර අවභාවිත කරන තරමටම එම පාලන තන්ත්‍රයන් විසින් සිය දුෂ්ට අරමුණු සඳහා දූෂණයට එරෙහි කථිකා යටපත් කිරීම ආරම්භ කර ඇති හෙයින් මෙය දැන් පීඩනයක් සහිත කාර්යයක් බවට පත්ව ඇත. බොහෝ ප්‍රබල නායකයින් ක්‍රමය පිරිසිදු කරන බව පවසමින් බලයට පැමිණ ඇති නමුත්, කර ඇත්තේ එය තවත් නරක අතට හැරවීම පමණි. දේශපාලන විරුද්ධ පාර්ශ්වයද සමථයට පත්කරගනිමින් සැබෑ ගැටලුවලට මුහුණ දෙමින් ප්‍රසාදය දිනාගන්නේ කෙසේද යන්න පිළිබඳව නැගී එන අධිකාරවාදීන්හට මනා සිද්ධි අධ්‍යයනයක් වන්නේ චීනයේ චීන කොමියුනිස්ට් පක්ෂය තුල ශී ජින් පින් දූෂණය මුල්කොට සිදුකළ අනපේක්ෂිත මර්දන ක්‍රියාකාරකම්ය. චීන කොමියුනිස්ට් පක්ෂයේ සියලුම මට්ටම්හි පැතිරුණු දූෂණය නිසා හටගත් දිගුකාලීන මහජන අප්‍රසාදය සහ නිලධාරිවාදී අක්‍රියබවට ප්‍රතිචාරී ලෙස 2012 දී දියත් කරන "කොටින් සහ මැස්සන්" යන දෙපිරිසටම එරෙහි ශීගේ දූෂණ විරෝධී වැඩසටහන පුළුල් ලෙස පිළිගැනීමට ලක් විය. තවදුරටත් මධ්‍යම පක්ෂයේ බලපෑම ප්‍රමුඛ පෙළේ රජයේ ආයතනවලට ව්‍යාප්ත කිරීම මගින් ශීගේ බලය මධ්‍යගත කිරීම සාධාරණීයකරණය කිරීම හා වේගවත් කිරීම සඳහාද එය දායක වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වක්‍රාකාරයෙන් හෝ නිර්මිත අයුරින් පද්ධතිය ඔස්සේ මර්දනය කිරීමේ සාධක ශක්තිමත් කිරීම සිදු වෙයි. මෙය ආයතනික ප්‍රතිසංස්කරණ හරහා පමණක් නොව අපකීර්තියට පත් නිලධාරින්ගෙන් හිස් වූ තනතුරුවලට ශී හිතවාදීන් පත් කිරීම මගින් ළඟා කරගන්නා ලදී. ඊට

### ගෝලීය MAGNITSKY වැඩසටහන

රජය මගින් සිදු කරන ලද මහා පරිමාණ බදු වංචාවක සාක්ෂි අනාවරණය කළ මොස්කව් නුවර ජීවත් වූ නීතිඥවරෙයකු වූ සර්ගෙයි මැග්නිට්ස්කි මරාදැමීමට සම්බන්ධිත රුසියානු නිලධාරින්ට එරෙහිව එක්සත් ජනපද සීමාකිරීම් 2012 මුල් Magnitsky පනත මගින් බලාත්මක කරන ලදී. 2016දී එක්සත් ජනපද කොංග්‍රස් මණ්ඩලය විසින් ගෝලීය Magnitsky පනත සම්මත කරන ලද අතර, එමගින් වත්කම් රාජසන්තක කිරීම මෙන්ම ලොව පුරා ව්‍යාප්ත මානව හිමිකම් අපහරණය කිරීම හෝ දූෂණ කටයුතුවල නියුතු යම් පුද්ගලයෙකු හෝ ආයතනයක් මත එක්සත් ජනපද සංචාරක තහනම් කිරීම් පැනවීම එමගින් බලාත්මක කරන ලදී.

ගෝලීය Magnitsky වැඩසටහන 2021 ජනවාරි වන විට රටවල් 34ක ඉලක්කගත ක්‍රියාකාරින් 246 දෙනෙකු වෙත විහිද තිබූ අතර, එහි සාර්ථකත්වය කොපමණද යත් කැනඩාව, යුරෝපා සංගමය හා එක්සත් රාජධානිය ඇතුළු අනෙකුත් ප්‍රජාතාන්ත්‍රික රටවල් ද එහි අනුවාද වශයෙන් ඔවුන්ගේම වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ජපානයේ, ඕස්ට්‍රේලියාවේ හා වෙනත් ස්ථානවල ද නීති සම්පාදනය පිළිබඳව සලකා බලමින් පවතී. බැඳීම් හා එකමුතුබව සහතික කරමින් ප්‍රථම වතාවට 2021 මාර්තු මාසයේදී, ෂින්ජියැංහි සිදු වූ මානව හිමිකම් අපහරණය කිරීම් හා සම්බන්ධ වැරදිකරුවන්ට එරෙහි ගෝලීය Magnitsky සීමාකිරීම් රටවල් කිහිපයක් අතර සම්බන්ධීකරණය කරන ලදී.

ඇතැම් විට විශ්මය සහගත ලෙස සාමාන්‍ය (මෙන්ම අත්‍යවශ්‍ය) සීමා පැනවීම් ක්‍රියාවලිය ගත් කල, එක්සත් ජනපදයේ ගෝලීය Magnitsky වැඩසටහන තුල සිවිල් සමාජ සංවිධාන වැදගත් භූමිකාවක් නිරූපණය කරයි. විභව ඉලක්ක හඳුනා ගැනීම සඳහා එක්සත් ජනපද නිලධාරීන් බොහෝ විට මාධ්‍ය සහ සිවිල් සමාජ විමර්ශන මත රඳා පවතිනවා පමණක් නොව, එක්සත් ජනපද භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් සලකා බැලීම සඳහා මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ දූෂණ පිළිබඳ සාක්ෂි රැස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා ලොව පුරා කණ්ඩායම් 200 කට වැඩි පිරිසක් විධිමත් ලෙස සම්බන්ධ වී සිටිති.

අමතරව, දූෂණයට එරෙහි වැඩසටහනේ විදෙස් අංශය වන Operation Fox Hunt හරහා සත්‍ය ලෙස පලාගිය අයවලුන් නිසැකවම පිටුවහල් කිරීම උදෙසා කටයුතු කර ඇති අතර, ඒ මගින් අසමාන ලෙස ෂීගේ දේශපාලන විරුද්ධවාදීන් හා විවේචකයින් ඉලක්කගත කර ඇත. සිය දූෂණයට එරෙහි ප්‍රයත්නයන් ජාත්‍යන්තරකරණය කිරීම සඳහා මතුපිටින් පෙනෙන තල්ලුකිරීම් හැරුණු විට බීජිංහි ප්‍රමුඛතාවන් පිළිබඳ කියවීම් වනුයේ වෙනත් රටවලට අවශ්‍ය චෝදනා ලත් චෞර පාලන තාන්ත්‍රිකයින් හට [රැකවරණය සැපයීම දිගටම සිදුකරන](#) බවත් සහ සෝද මාවත මුලපිරීම ඔස්සේ බහුලව සිදුවන අල්ලස් හා වංචාවලට විසඳුම් ලබාදීම පිණිස ස්ථිරසාර කිසිවක් සිදු කර නොමැති බවයි.

එබැවින්, චීනයේ දූෂණ විරෝධී ව්‍යාපාරය, පරිමානයෙන් පෙර නොවූ විරූ දෙයක් පමණක් නොව, නයිජීරියාව, පකිස්ථානය, පිලිපීනය සහ රුසියාව සහ තවත් රටවල පසුව [සිදු කරගෙන යන ලද](#) එහි ගොරහැඩි අනුවාදවලට වඩා එහි මූලාරම්භය සහ ප්‍රතිඵල අතින් වඩාත් සංකීර්ණ විය හැකිය. කෙසේ වෙතත්, ඒ සියල්ල හරහා දිවෙන තේමාව නම්, නීතියේ ආධිපත්‍යය දුර්වල රටවල දේශපාලන නායකයින් ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාකාරකම් වෙනුවෙන් මහජන සහාය ලබා ගැනීම සඳහා දූෂණ විරෝධී නාමකරණය වැඩි වැඩියෙන් භාවිතා කිරීමයි.

අධිකාරවාදී චෞර පාලන තන්ත්‍රය හෙළිදරව් කිරීමට සහ එයට දෝෂාරෝපණ එල්ල කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් විසින් සිදු කරනු ලබන අව්‍යාජ සහ ඒකාබද්ධ මහජන සම්බන්ධතා ව්‍යාපාරයක් මගින් මෙම ප්‍රෝඩාව හෙළිදරව් කෙරෙනු ඇති අතර දූෂිත පාලන තන්ත්‍රයන්ට පෙන්වා දෙනු ඇත්තේ, ගෝලීය වශයෙන් නීතියේ ආධිපත්‍යය ඛාදනය කිරීමට ඔවුන් දැරූ උත්සාහයන් නොතකා, ක්‍රීඩාවේ නීති වෙනස් වී නැති බවත්, ඔවුන් ඒ අනුව ක්‍රීඩා කිරීම ආරම්භ කළ යුතු බවත් හා එසේ නොමැති නම් ඔවුන් වගකිව යුතු බවට පත්වනු ඇති බව ය.

## ජාලයක් පරාජය කිරීමට ජාලයක් ගොඩනැගීම

අප දැක ඇති පරිදි, පාරජාතික දූෂණයට අවශ්‍යයෙන්ම විවිධ අධිකරණ බල ප්‍රදේශවල චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ගේම සිට මුදල් විශුද්ධිකරණයට පහසුකම් සපයන වෘත්තිකයන් සහ ඒවා නොදුටුවා සේ සිටින රජයන් දක්වා ක්‍රියාකාරීන් ගණනාවකගේ සහභාගීත්වය ඇතුළත් වේ. චෞර පාලන තන්ත්‍රය යනු මේ වන විට විශාල හා දියුණු වෙමින් පවතින ගෝලීය කර්මාන්තයක් වන අතරම එය ලොව පුරා පැතිරී ඇති තර්ජනයකි. ඊට ප්‍රතිවිරුද්ධව, දූෂණයට එරෙහිව සටන් කිරීමට අවධානය යොමු කරන ජාතික සහ ප්‍රාදේශීය නීතිය ක්‍රියාත්මක කරන ආයතන, ස්වාධීන මාධ්‍ය සහ සිවිල් සමාජ සංවිධානවල ක්‍රියාකාරීත්වය බොහෝ විට සීමා කෙරී ඇත්තේ අධිකරණමය ප්‍රශ්න සහ ප්‍රමාණවත් දේශපාලන පිටුබලය, විශේෂඥ දැනුම හා සම්පත් නොමැතිකම මගිනි ප්‍රතිපත්ති සම්පාදකයින්හට ඔවුන්ගේ ප්‍රයත්නයන්ට සහාය විය හැකි වඩාත් වැදගත් ක්‍රම කිහිපයක් ඉහත දක්වා ඇති අතර, එය චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් සහ ඔවුන්ගේ වෘත්තීය සක්‍රීය කරන්නන් ඉලක්ක කර ගැනීම සඳහා ප්‍රථමයෙන්ම සහ ප්‍රධාන වශයෙන්ම, නව පාරජාතික චෞර පාලන තන්ත්‍ර විරෝධී ජාල මතුවීම අවශ්‍ය වන බව පුනරුච්චාරණය කරයි. නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාමාර්ග සහ සම්බාධක මගින් චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් ටිකෙන් ටික ඉලක්ක කර ගැනීම පාරජාතික දූෂණයේ ක්‍රමානුබද්ධ යටිපෙළ නංවාලීමට ප්‍රමාණවත් නොවනු ඇත. මන්ද, අන් සියල්ලටමත් වඩා මූල්‍ය නිර්නාමිකභාවය සහ මහජන උදාසීනත්වයේ සංකලනය චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්හට දණ්ඩමුක්තිය සහිතව ක්‍රියා කිරීමට ඉඩ සලසන බැවිනි. නඩු පැවරීමේ හෝ සම්බාධක පැනවීමේ අපේක්ෂාව තුළින් නිසැකවම තමන්ගේම ජනතාවගෙන් සොරකම් කරන නායකයින් ඉන් වළක්වාලීම සහ ඔවුන් ඊට වගවන තත්වයට පත් කිරීම යන කාර්යයන් දෙකම සිදු කළ හැකි වේ. එනමුත් ප්‍රතිසංස්කරණ හරහා ක්‍රමානුබද්ධ දුර්වලතා ආමන්ත්‍රණය කිරීම සඳහා මහජන සැලකිල්ල සහ ගම්‍යතාව වැඩි කිරීමෙන් පමණක්ම එසේ කිරීමට ඔවුන්ට ඇති හැකියාව අපට ප්‍රථමයෙන්ම අඩපණ කළ හැකි වේ.

එබැවින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල සැලකිලිමත් ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා, මූලික අභියෝගය විය යුත්තේ ජාත්‍යන්තර විමර්ශනාත්මක මාධ්‍යවේදීන්ගේ එකමුතුව (ICIJ), ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික අනුරක්ෂණය (NED) සහ වෙනත් අය විසින් පුරෝගාමීව ඇති කරන ලද චෞර පාලන තන්ත්‍ර විරෝධී ජාලයන් තවදුරටත් වර්ධනය කිරීමට සහාය වීමයි. අතිරේක ප්‍රශංසනීය චෞර පාලන තන්ත්‍ර විරෝධී ජාත්‍යන්තර මුලපිරීම් අතරට ස්වභාවික සම්පත් සහ ස්වභාවික සම්පත් වලින් උපයා ගන්නා මහජන මුදල් කළමනාකරණය කිරීමේ ලා වගවීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියක් වන Extractive Industries Transparency Initiative (EITI) හෙවත් නිස්සාරණ කර්මාන්තවල විනිවිදභාවය පිළිබඳ මූලාරම්භය මෙන්ම Publish What You Pay හෙවත් ඔබ ගෙවන දේ ප්‍රකාශයට පත්කරන්න (PWYP) මුලපිරීම ඇතුළත් වන අතර නිස්සාරණ කර්මාන්ත ගිවිසුම් සම්බන්ධ තොරතුරු සඳහා මහජන ප්‍රවේශය ඇති කිරීමට එමගින් බල කරනු ලැබේ.

ප්‍රජාතන්ත්‍රවාදී රජයන්වලට තමන් කැමති ඕනෑම අවස්ථාවක දූෂණ විරෝධී ප්‍රතිපත්ති පෙළගැස්වීමේ සහ බලාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීමේ කාර්යය ආරම්භ කළ හැකි බව සත්‍යයකි. කෙසේ වෙතත්, යථාර්ථයේ දී, ඔවුන් සැබවින්ම එසේ කරන බවටත් එය දිගටම කරගෙන යන බවටත් සහතික වනු ඇත්තේ සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය සහ මහජන ප්‍රකෝපය විසින් පමණි. අධිකාරවාදී සමාජ තුළම, මහජනතාව වෙත චෞර පාලන තන්ත්‍රික පාලන තන්ත්‍රයන් හෙළිදරව් කිරීමට හැකි වන්නේත් දූෂිත නායකයින් මත වගකීම පැටවිය හැකි ආකාරයේ දේශපාලන පීඩනයක් ජනනය කළ හැකි වන්නේත් සිවිල් සමාජයේ පැවැත්මට සහ එය ශක්තිමත් කිරීමේ කාර්යයට පමණි.

## චෞර පාලන තන්ත්‍රයට එරෙහි මධ්‍යම අප්‍රිකානු සන්ධානය

2018 පෙබරවාරි මාසයේදී කැමරූන්, චැඩ්, කොංගෝ ජනරජය, ගිනියාව යන රාජ්‍යවල සිවිල් සමාජ සංවිධාන හතරක් National Endowment for Democracy විසින් සංවිධානය කරන ලද වැඩමුළුවකට සහභාගි වූ අතර, ලොව විශාලතම චෞර පාලන තාන්ත්‍රික එකතුව සමඟ කලාපයේ චෞර පාලන තන්ත්‍රයට විරුද්ධව කටයුතු කිරීම සඳහා සම්බන්ධීකරණය කරන ලද ප්‍රවේශයක් ලබාගැනීම වෙනුවෙන් චෞර පාලන තන්ත්‍රයට එරෙහි මධ්‍යම අප්‍රිකානු සන්ධානය නිර්මාණය කරන ලදී. National Endowment for Democracy සහ Global Integrity ආයතනයේ සහාය සහිතව කලාපීය මට්ටමින් සුහදතාව වෙනුවෙන් හමුවීමේ ස්ථානයක් නිර්මාණය කිරීම මගින් මෙම සන්ධානය දේශීය සිවිල් සමාජ සංවිධාන හා තරමක් විශාල මට්ටමේ ජාත්‍යන්තර සංවිධාන අතර පරතරය අඩු කරයි. 2020 වර්ෂයේදී, සන්ධානයේ කලාපීය සහභාගිත්වය රටවල් පහක් දක්වා වර්ධනය කරමින් ඇන්ගෝලාවේ මිත්‍රයින් දැනට ක්‍රියාත්මක සංවිධාන හතර වන ADISI (කැමරූන්), EG Justice (ගිනියාව), the Public Interest Law Center (චැඩ්) and Sassoufit (කොංගෝ ජනරජය)ට සම්බන්ධ වූහ.

චෞර පාලන තන්ත්‍රයට එරෙහි සන්ධානයේ සාමාජික සංවිධාන විසින් අදාල තන්ත්‍රයට එරෙහිව සාම්ප්‍රදායිකව විමර්ශණ සහ නීතිමය කටයුතු සිදු කර තිබුණද, අදාල තන්ත්‍රය පිළිබඳ මහජන දැනුවත්භාවය වැඩිදියුණු කිරීමට සහ වෙනසක් සිදු කිරීම සඳහා පුළුල්ව ව්‍යාප්ත වූ ඉල්ලුමක් ඇතිකරලීමට අවශ්‍ය වන කලාපීය ප්‍රජා අධ්‍යාපනික වැඩසටහන්වල පරතරයක් ඔවුහු හඳුනාගත්හ. ඊට ප්‍රතිචාරී ලෙස, චෞර පාලන තන්ත්‍රය මගින් මධ්‍යම අප්‍රිකානු වැසියන්ගේ දෛනික දිවියට බලපෑම් කරන අයුරු සහ පොදු සේවාවන් ලබාගැනීමෙන් පුරවැසියන් වලකාලන්නේ කෙසේද යන්න පිළිබඳ කතාන්තර එක්රැස් කර, ප්‍රචාරණය කිරීම සඳහා මෙම සන්ධානය විසින් විවෘත මධ්‍යම අප්‍රිකා- Open Central Africa (OCA) මුලපිරීම අරඹන ලදී.

මෙම කතා වස්තූන් මගින් චෞර පාලන තන්ත්‍රය පුද්ගලීකරණය කරනවා සේම දූෂණ දත්ත වඩාත් ස්පෘශ්‍ය තත්ත්වයට පත් කළ හැකි වන්නේ එම තන්ත්‍රයෙහි අහිතකර බලපෑම් වඩාත් පහසුවෙන් තේරුම් ගැනීමට හා ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටීමට පුරවැසියන් දිරිමත් කරවමිනි. උදාහරණයක් ලෙස, සාමාන්‍ය පුරවැසියන්ගේ කෙටි ආයු අපේක්ෂාව, අධ්‍යාපනය හා මූල්‍ය තත්ත්වය හා ගිනියාවේ පාලනය ගෙන යන පවුලේ වත්කම් සමපාත කරමින් විවෘත මධ්‍යම අප්‍රිකා මුලපිරීම විසින් කතා වස්තුව ක් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම කතාව එක්සත් ජනපදයෙන්, යුරෝපයෙන් හා දකුණු අප්‍රිකාවෙන් සුවපහසු භාණ්ඩ මිලදී ගැනීම සඳහා ඩොලර් මිලියන 700කට වඩා නාස්ති කරන ලද උප ජනපති හා ඉක්වටොරියල් ගිනියාවේ වත්මන් ජනපති තියඩොරො ඔබියැන්ග් ගුමා බසොගොගේ පුත්‍රයා වන තියඩොරො ගුමා ඔබියැන්ග්ගේ ජීවන රටාව සාධාරණීයකරණය කරන මාධ්‍ය ආඛ්‍යාන පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් ලෙස සැලකේ. ඩොලර් මිලියන 700ක මුදල රටේ වාර්ෂික අයවැයෙන් තුනෙන් එකක ප්‍රමාණයක් ඉදිරිපත් කිරීම සහ දශකයක් පුරා ජාතික සුවසේවා පද්ධතියට අරමුදල් සැපයීමට හෝ අවුරුදු 8ක් පුරා අධ්‍යාපන පද්ධතියට අරමුදල් සැපයීමට හැකිවීම කාරණා කරගනිමින් මෙම මිලදී ගැනීම් ඉක්වටොරියල් ගිනියානුවන්ට උසස් ජීවන තත්ත්වයක් ලබාගැනීමට ඇති හැකියාව සෘජුවම අහිමි කරන මට්ටම පිළිබඳව විවෘත මධ්‍යම අප්‍රිකා මුලපිරීම විසින් අවධාරණය කරනු ලබයි.

කොවිඩ් 19 වසංගතය මධ්‍යම අප්‍රිකාව වෙලා ගනිද්දී, වසංගතය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් චෞර පාලන තන්ත්‍රයේ බලපෑම කෙරෙහි අවධානය දිනා ගැනීම සඳහා විවෘත මධ්‍යම අප්‍රිකා මුලපිරීම විසින් සිය කතා වස්තූන් නිර්මාණය කළහ. ජනපති පවුල සහ එහි ජාලය පවත්වාගෙන යාම සඳහා යොමු කරන ලද අතිවිශාල පරිත්‍යාග ලබාදෙන ලෙස රජය සතු මෙන්ම පුද්ගලික සමාගම් මත පීඩනයක් ඇති කරන ලද චැඩ් රජයේ හිටපු මුල් පුරවැසි ආර්යාව විසින් පවත්වාගෙන යන ලද පුණ්‍ය කටයුතු පදනමක් වන Grand Coeur පදනම පිළිබඳව විවෘත මධ්‍යම අප්‍රිකා මුලපිරීම විසින් ලියන ලදී. වසංගත තත්ත්වය ආරම්භ වීමෙන් අනතුරුව, පදනම වෙත මුදල් හා වෛද්‍ය සම්පත් මුදාහරිමින් හා හිටපු ජනපතිවරයාගේ පවුල සහ සහචරයින්ගේ ප්‍රතිලාභය උදෙසා ඒවා භාවිත කරමින් Grand Coeur විසින් චැඩ් රාජ්‍යයේ කොවිඩ් 19 කළමනාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය විසින් ඉටු කළ යුතු කාර්යයන් සියතට ගන්නා ලදී. මෙම කටයුතු මගින් වසංගතයට නිසියාකාරයෙන් විසඳුම් ලබා දීම නොතකා අනුග්‍රාහකත්ව ක්‍රම හරහා සහාය ලබාගැනීම මගින් සිය තත්ත්වය අවභාවිත කරමින් ජනපතිවරයා අනිසි ලෙස දිරිමත් කිරීම සිදු විය.

## මාර්ගස්ථ සහ ගමනාන්ත රටවල භූමිකාව සාකච්ඡාවට ගැනීම

ජාත්‍යන්තර ජාල ගොඩනැගීමට අමතරව, ගෝලීය දූෂණ විරෝධී ක්‍රියාකාරීන් විසින් කළ යුතු තවත් කාර්යයක් වන්නේ සොරකම් කළ අරමුදල් විශුද්ධිකරණය කිරීමට චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ට හැකියාව ලබාදෙන මාර්ගස්ථ සහ ගමනාන්ත අධිකරණ බල ප්‍රදේශවල ඇති නීතියෙන් ගැලවීමේ මාර්ග වසා දැමීමට කටයුතු කිරීමයි. මුදල් විශුද්ධිකරණයට එරෙහිව මූල්‍ය කටයුතු කාර්ය සාධක බලකාය (FATF) විසින් ඉදිරිපත් කරන ලද සම්පූර්ණ නිර්දේශ ක්‍රියාවට නැංවීම මෙයට ඇතුළත් වන අතර, තවද සියලුම චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්ද සලකා බැලෙන, දේශපාලනිකව නිරාවරණය වූ පුද්ගලයන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

සම්බන්ධයෙන් මූල්‍ය ආයතන නිසි පරිදි කඩිසරව ක්‍රියාත්මක වීම වැඩිදියුණු කිරීමද ඇතුළත් වේ.

චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් විසින් තමන් සොරකම් කරන ලද මුදල් ෂෙල් සමාගම් භාවිතා කරමින් ජාත්‍යන්තර මූල්‍ය පද්ධති වෙත විශුද්ධිකරණය කිරීම නැවැත්වීම සඳහා සංස්ථා සහ සීමිත වගකීම් සමාගම් (LLCs) වැනි නීතිමය ආයතනවල සැබෑ වාසිදායක හිමිකරුවන් පිළිබඳ වැඩි විස්තර මාර්ගස්ථ සහ ගමනාන්ත රටවලට අවශ්‍ය වේ. බොහෝ ජාතීන් මෑතකදී ආයතන ලියාපදිංචි කිරීම සහ ගිණුම් විවෘත කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ නීති වෙනස් කර ඇති අතර, දැන් එවැනි ආයතන අවසානයේ පාලනය කරන සහ ඒවායින් ප්‍රතිලාභ ලබන පුද්ගලයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. පූර්ණ වාර්තාකරණය සඳහා අවශ්‍ය හිමිකාරිත්ව පොලී සීමාව අධිකරණ බල ප්‍රදේශ අතර වෙනස් වන නමුත් සාමාන්‍යයෙන් සියයට 10ක කොටස් හෝ ඊට වැඩි කොටස් ඇති අය හෙළිදරව් කිරීම ඇතුළත් වේ.

වාසිදායක හිමිකාරීත්වය පිළිබඳ වාර්තාකරණ අවශ්‍යතාවලින් ඔබ්බට, මූල්‍ය තොරතුරු ස්වයංක්‍රීයව ද්විපාර්ශ්වික වශයෙන් වාර්තා කිරීම සඳහා නියමයන් ක්‍රියාත්මක කිරීමෙන් මාර්ගස්ථ සහ ගමනාන්ත රටවලට චෞර පාලන තන්ත්‍රය සක්‍රීය කිරීමේලා ඔවුන්ගේ කාර්යභාරය අවම කරගත හැකිය. ස්වයංක්‍රීය මූල්‍ය තොරතුරු හුවමාරුවල රන් ප්‍රමිතිය වන්නේ ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වන සංවිධානයෙහි පොදු වාර්තාකරණ ප්‍රමිතිය (CRS), වන අතර, අනෙකුත් අධිකරණ බල ප්‍රදේශ සමඟ ස්වයංක්‍රීයව මූල්‍ය තොරතුරු හුවමාරු කර ගැනීමට සහභාගී වන රටවල මූල්‍ය ආයතනවලට එම ප්‍රමිතීන් අනුගමනය කරන ලෙස දන්වා සිටිනු ලැබේ. එවැනි අන්‍යෝන්‍ය තොරතුරු හුවමාරුව චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් පදිංචිව සිටින “නිජබිම්වල ජාතීන්ට” ඔවුන්ගේ ජාතික දත්ත සමඟ සංසන්දනය කිරීමට සහ දූෂණ හා වෙනත් නීති විරෝධී ක්‍රියාකාරකම් අනාවරණය කර ගැනීම සඳහා මාර්ගස්ථ සහ ගමනාන්ත රටවල පවතින මූල්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසයි.

එක්සත් ජනපදය පොදු වාර්තාකරණ ප්‍රමිතිය අනුගමනය නොකරන නමුත්, එය විදේශීය ගිණුම් බදු අනුකූලතා පනතේ (FATCA) එයට සමාන ප්‍රමිතියක් දරන අතර එම ප්‍රමිතිය මගින් යම් යම් සීමාවන්ට වඩා වැඩි මූල්‍ය වත්කම් පිළිබඳ තොරතුරු රටට ආපසු වාර්තා කිරීම සඳහා නියමයන් පැනවේ. තම මව් රටේ වත්කම් හිමිකරු විසින් බදු ගෙවන බව සහතික කිරීමට උපකාරි වීමට විදේශීය ගිණුම් බදු අනුකූලතා පනතට හැකි වුවද, ද්විපාර්ශ්වික වාර්තාකරණ අවශ්‍යතා පොදු වාර්තාකරණ ප්‍රමිතිය තරම් දැඩි නොවන අතර තොරතුරු ස්වයංක්‍රීයව හුවමාරු නොවේ. තොරතුරු යවනු ලබන්නේ ඉල්ලීම මත පමණක් වන බැවින්, විෂමතා සොයා ගැනීමට සහ එක්සත් ජනපදයෙන් නිශ්චිත තොරතුරු ඉල්ලා සිටීමට මුල් රටවල් මත අමතර බරක් පැටවෙන අතර, පොදු වාර්තාකරණ ප්‍රමිතිය ක්‍රියාවට නංවා ඇති රටකට වඩා එක්සත් ජනපදයේ මූල්‍ය වැරදි හැසිරීම් වලින් ගැලවීම චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින්හට පහසු කරයි. චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් විසින් මුදල් විශුද්ධිකරණය කිරීමේ ක්ෂේමස්ථානයක් ලෙස සිය රට ලබා සිටින අතිවිශාල ජනප්‍රියත්වය අවම කර ගැනීම සඳහා එක්සත් ජනපදය විසින් මෙම නීතියෙන් ගැලවීමේ මාර්ගය වසා දැමීමට කටයුතු කළ යුතු අතර අනෙකුත් ගමනාන්ත සහ මාර්ගස්ථ රටවල් චෞර පාලන තන්ත්‍රය හේතුවෙන් පීඩා විඳින ජාතීන්ට නීතිවිරෝධී හුවමාරු පිළිබඳ අනාවරණය කර ගැනීමට උපකාර කිරීම සඳහා මූල්‍ය තොරතුරු වාර්තාකරණය හා හුවමාරුව සඳහා ඉහළ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමට ද අවධානය යොමු කළ යුතුය.

## එක්සත් ජනපද ආයතනික විනිවිදභාවය පිළිබඳ පනත

2021 ජනවාරි මාසයේදී ජාතික ආරක්ෂක අධිකාරිත්ව පනතේ කොටසක් ලෙස එක්සත් ජනපදය විසින් 2019 ආයතනික විනිවිදභාවය පිළිබඳ පනත (CTA) පනවන ලද අතර මුදල් විශුද්ධිකරණය, ත්‍රස්ත කටයුතු හා වෙනත් නීත්‍යනුකූල නොවන කටයුතු සඳහා මුදල් යෙදවීම වැළැක්වීම පිණිස අතිශයින් වැදගත් ජාතික ආරක්ෂක, බුද්ධිමය හා නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රයත්නයන් වඩා හොඳින් ඉටු කිරීම එමගින් අරමුණු කෙරේ. විවේචනාත්මකව, ආයතනික විනිවිදභාවය පිළිබඳ පනත විසින් එක්සත් ජනපද භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව තුළ මූල්‍ය අපරාධ බලාත්මක කිරීමේ ජාලය- Crimes Enforcement Network (FinCEN) විසින් කළමනාකරණය කරනු ලබන සමාගම් වාසිදායක-හිමිකාරිත්ව තොරතුරුවල ජාතික ලේඛනාගාරයක් නිර්මාණය කරනු ලබන අතර එයට සියයට 25 ක හෝ ඊට වැඩි හිමිකාරිත්වයක් ඇති කොටස් හිමියන් සඳහා හඳුනාගැනීමේ තොරතුරු වාර්තා කිරීම අවශ්‍ය වේ. ආයතනික විනිවිදභාවය පිළිබඳ පනත 2022 ජනවාරි සිට බලාත්මක වන අතර, එක්සත් ජනපද මූල්‍ය පද්ධති හරහා සහ ඒ වෙත මුදල් මාරු කරන හා විශුද්ධිකරණය කරන චෞර පාලන තාන්ත්‍රිකයින් හට මූලික උපකරණයක් වන එරටෙහි ලියාපදිංචි ෂෙල් සමාගම් අඩපණ කිරීම මූලික වශයෙන් අරමුණු කරයි.

# නිර්දේශ

ප්‍රජාතන්ත්‍රවාදය, සංවර්ධනය සහ ආර්ථික වර්ධනයට හානි කරන අතරම, තමන් වෙනුවෙන් නීති විරෝධී ලෙස ධනය ගොඩනගා ගැනීම සඳහා ලොව පුරා සිටින චෞර පාලන ත්‍රාන්ත්‍රිකයින් භාවිතා කරන ක්‍රමෝපායන් තේරුම් ගැනීම, ඒවාට එරෙහිවීමේ ප්‍රවේශයන් තීරණය කිරීමේ පළමු සහ ප්‍රධාන පියවරයි. මෙම පාරජාතික සංසිද්ධියට එරෙහිව කටයුතු කිරීම සඳහා ආරක්ෂක යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමට අමතරව, ජාත්‍යන්තර ප්‍රජාව විසින් ගෝලීය සන්ධානයක් ගොඩනගා ගැනීම සහ ලොව පුරා සිටින චෞර පාලන තන්ත්‍ර විරෝධී ක්‍රියාකාරීන්ගේ කණ්ඩායම් ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. චෞර පාලන තන්ත්‍රයට එරෙහි සාමූහික ප්‍රයත්නයක් පහත සඳහන් දැට ප්‍රමුඛත්වය දිය යුතුය:

## චෞර පාලන තන්ත්‍රයට එරෙහි සටන ඉහළ මට්ටමකට ගෙන ඒම

- ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයන් ක්‍රමානුබද්ධ දූෂණ අවදානම් සහ මුදල් විශුද්ධිකරණයට ලක්වීමේ අවදානම් සම්බන්ධයෙන් යොමු කිරීමට දේශපාලන නායකත්වය අවශ්‍ය වේ.
- චෞර පාලන තන්ත්‍රය සම්බන්ධයෙන් ජාතික ආරක්ෂාව භාරව සිටින ආයතන දැනුවත් කිරීම සහ චෞර පාලන ත්‍රාන්ත්‍රික තර්ජන වලට එරෙහිව සටන් කිරීමට ඔවුන් සවිබල ගැන්වීම.
- පාරජාතික දූෂණය විමර්ශනය කොට නඩු පැවරීමට අවශ්‍ය දේශපාලන පිටුබලය සහ සම්පත් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට තිබෙන බව සහතික කිරීම.
- ජාත්‍යන්තර ගිවිසුම් යටතේ පවතින දූෂණ විරෝධී සහ මුදල් විශුද්ධිකරණයට එරෙහි වගකීම් ක්‍රියාත්මක කිරීමේ උත්සාහයන් අලුත් කිරීම.
- ප්‍රධාන ජාත්‍යන්තර වේදිකාවල ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන් විසින් චෞර පාලන තන්ත්‍රයට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ගවලට ප්‍රමුඛත්වය දීම සහ ඒවා සම්බන්ධීකරණය කිරීම.

## ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ආරක්ෂා කිරීම

- මූල්‍ය කටයුතු කාර්ය සාධක බලකායේ නිර්දේශ 40 සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම මගින් මුදල් විශුද්ධිකරණයට එරෙහි පද්ධති ශක්තිමත් කිරීම.
- දූෂණයෙන් ලැබෙන මුදල් විශුද්ධිකරණය කිරීම සඳහා පවතින සමාගම්, නිශ්චල දේපළ සහ වෙනත් වාහකවල හිමිකාරීත්වයේ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම.
- රාජ්‍ය නිලධාරීන් වත්කම් හෙළිදරව් කිරීම් අවශ්‍ය බවට නියම කිරීම සහ විදේශීය රජයන් වෙනුවෙන් බලපෑම් කිරීමට ඔවුන්ට ඇති හැකියාව සීමා කිරීම මගින් අධිකාරී බලපෑම්වල මූල්‍ය අවදානම් සීමා කිරීම.
- දේශපාලන පක්ෂ, පොලඹවන කණ්ඩායම්, මාධ්‍ය ආයතන, ප්‍රචාරක කණ්ඩායම් සහ "බලපෑම් කර්මාන්තයේ" නිරත අනෙකුත් පුද්ගලයින් විසින් අරමුදල් මූලාශ්‍ර සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් හෙළිදරව් කිරීම අවශ්‍ය බවට නියම කිරීම.

## දූෂණ විරෝධී ප්‍රයත්නයන් සවිබල ගැන්වීම

- දූෂණ ක්‍රියාකාරකම් විමර්ශනය කරන ස්වාධීන මාධ්‍ය සහ සිවිල් සමාජ සංවිධාන ප්‍රචණ්ඩත්වය, බිය ගැන්වීම් සහ හිරිහැරයට ලක්වන නෛතික තර්ජන වලින් ආරක්ෂා කිරීම.
- පැහැදිලි කළ නොහැකි ධනය ඉලක්ක කර මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා නව නීති අධිකාරීන් සමඟ නීතිය ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු හෙළි කරන්නන් සඳහා ශක්තිමත් ආරක්ෂාවක් සහ දූෂණ හෙළි කිරීමට ඉදිරිපත් වන පුද්ගලයින් සඳහා මූල්‍ය ත්‍යාග පිරිනැමීම.

## පාරජාතික චෞර පාලන තන්ත්‍රය ඉලක්ක කිරීම

- විදේශීය නිලධාරීන් විසින් විදේශීය අල්ලස් ගැනීම සහ අල්ලස් ඉල්ලීම අපරාධ ලෙස නම් කිරීම.
- මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ දූෂණය ඉලක්ක කර ගනිමින් ගෝලීය මැග්නිට්ස්කි සම්බාධක හඳුන්වා දීම සහ හැකි සෑම විටම වෙනත් ප්‍රජාතන්ත්‍රවාදී රටවල් සමඟ තනතුරු සම්බන්ධීකරණය කිරීම.
- මහජනතාව දැනුවත් කිරීම, ප්‍රතිසංස්කරණ සඳහා සහය වර්ධනය කිරීම සහ දූෂිත නායකයින් මත වගකීම පැටවීම සඳහා ගෝලීය චෞර පාලන තන්ත්‍ර විරෝධී ජාල බිහිවීම පෝෂණය කිරීම.

International Republican Institute

IRI.org
@IRIglobal

දුරකථනය: (202) 408-9450
ඊමේල්: info@iri.org